COOP

Kuruwita

# 2026 මහ සභා රැස්වීම

## සී/ස කුරුවිට විවිධ සේවා සමූපකාර සමිතිය

# පටුන

**පරිච්ඡේද අංකය** | **විෂයය** | **පිටුව**


| පරිච්ඡේද අංකය | විෂයය | පිටුව |
|---|---|---|
| 01. | **ආයතනය පිළිබඳ හැඳින්වීම**. | 3 - 4 |
| 02. | **වාර්ෂික මහසභා රැස්වීමේ ලිපිය.** | 5 - 6 |
| 03. | **2024.01.01 සිට 2024.12.31 දක්වා ආයතනයේ පාලන වාර්තාව**. | 7 - 11 |
| | 3.1 2024 වර්ෂය තුළ සමිතියේ නිත්‍ය තත්ත්වය - පාරිභෝගික අංශය | 13 - 17 |
| | 3.2. 2024 වර්ෂය තුළ සමිතියේ නිත්‍ය තත්ත්වය ග්‍රාමීය බැංකු අංශය | 17 - 19 |
| **04.** | **සංවර්ධන සැලැස්ම – 2026** | 20 |
| | 4.1. හැඳින්වීම | 21 |
| | 4.2. සමස්ත සමිතියේ ක්‍රියාත්මක හා ක්‍රියාතමක කිරීමට අපෙක්ෂිත ව්‍යාපාරික අංශ | 22 |
| | 4.3 ග්‍රාමීය බැංකු අංශය | 23 - 29 |
| | 4.3.1 2025 වර්ෂයේ ව්‍යාපාරික නිත්‍ය හා 2026 වර්ෂයේ ඉලක්ක | 30 - 32 |
| | 4.3.2. 2026 වර්ෂයේ ග්‍රාමීය බැංකු අංශයේ යෝජිත සංවර්ධන ක්‍රියාකාරකම් | 32 - 34 |
| | 4.3.3. ගණුදෙනු ප්‍රවර්ධනය සඳහා යෝජිත උපාය මාර්ග | 35 - 38 |
| | 4.3.4. ග්‍රාමීය බැංකු ණය හා උකස් ප්‍රවර්ධනය | 39 - 45 |
| | 4.4 වෙළඳ අංශය | 46 - 57 |
| | 4.5 රක්ෂණ අංශය | 57 - 58 |
| | 4.6 ප්‍රවාහන අංශය | 58 - 59 |
| | 4.7 අධ්‍යාපන සේවා අංශය | 60 - 61 |
| | 4.8 ව්‍යවසායකත්ව සංවර්ධන අංශය | 61 - 65 |
| | 4.9 සංචාරක සේවා අංශය | 65 |
| | 4.10 ක්‍රීඩා හා සෞඛ්‍ය සේවා අංශය | ............. |
| | 4.11 උත්සව අවස්ථා කළමණාකරණ අංශය | ............. |
| | 4.12 අවමංගල සේවා අංශය | ............. |
| | 4.13 ඉදිකිරීම් සේවා අංශය | ............. |
| | 4.14 නිෂ්පාදන සේවා අංශය | ............. |
| | 4.15 වැව්ලි අංශය | ............. |
| | 4.16 මානව සම්පත් සංවර්ධන අංශය | ............. |
| | 4.17 අලෙවි ප්‍රවර්ධන අංශය | ............. |

4.18 සාමාජික සහ පොදු සුභසාධන අංශය .............

**05. මානව සම්පත් සංවර්ධනය**

5.1 සාමාජිකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් .............

5.2 සේවකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් .............

**06. 2025 ජනවාරි 01 සිට 2025 දෙසැම්බර් 31 දක්වා පිටණය සීමාව ............**

**07. 2026 වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා** .............

7. 1 පාරිභෝගික අංශය .............

7.2 ග්‍රාමීය බැංකු අංශය .............

**08. 2026 වර්ෂය සඳහා කාරක සභා යෝජනා හා අදහස් ............**

**09. ඉතිරි ලාභ බෙදීම** .............

**10. අයවැය ඇස්තමේන්තු 2026 - ඇමුණුම්** .............

# 1. ආයතනය පිළිබඳ හැඳින්වීම

## 1.1 දර්ශනය

"සමුපකාර ප්‍රජාව අතර විශිෂ්ඨයා"

## 1.2 මෙහෙවර

"සාමාජික ප්‍රජාව සහ සෙසු පොදු මහජනතාවගේ පාරිභෝගික, ආර්ථික, සමාජමය සත්කාරයන් උපරිම අයුරින් සපුරාලමින් අභිප්‍රේරණය වූ සේවක කණ්ඩායමක් තුළින් තිරසාර සංවර්ධනයට දායක වීම,"

## 1.3 අරමුණ

සාමාජිකයන්ගේ හා ප්‍රදේශයේ ජනතාවගේ ආර්ථික, සමාජ හා සංස්කෘතික මට්ටම උසස් කරමින් ස්ථායි සංවර්ධනයක් ගොඩනැගීම ප්‍රධාන අරමුණ කොටගෙන සමිතියට අයත් විවිධ අංශ හරහා සාමාජිකයන්ට සහ ප්‍රදේශයේ ජනතාවට අවශ්‍ය සේවා පහසුකම් සපයමින් ඔවුන්ගේ ආර්ථික මට්ටම, ජීවන තත්ත්වය සහ ජීවත්වන පරිසරය වැඩි දියුණු කිරීම මෙහි මූලික අරමුණ වේ.

1. සාමාජිකයන් අතර තිරසර තරඟකාරී ආර්ථිකයක් නිර්මාණය කිරීම.
2. සාමාජිකයන්ගේ ජීවන තත්ත්වය ප්‍රශස්ත මට්ටමකට උසස් කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.
3. සමිති බලප්‍රදේශය තුල තිරසර පාරිසරික පද්ධතියක් ඇති කිරීම සඳහා දායකත්වය සැපයීම.
4. සාමාජිකයින් හා පාරිභෝගික ප්‍රජාව වෙත සියලු සේවා සපයමින් ව්‍යාපාරික වශයෙන් ප්‍රශස්ත සමුපකාර ආයතනයක් බවට පත්කිරීම.

## 1.4 කාර්යයන් සහ වගකීම්

අපේ සමූපකාර සමිතිය ස්ථාපිත කර ඇත්තේ  සාමාජිකයන්ගේ ආර්ථික, සාමාජීය හා ජීවන තත්ත්වය ඉහළ නැංවීමේ මූලික අරමුණින් යුතුවය. ඒ අනුව සමිතිය විසින් ක්‍රියාත්මක කරනු ලබන සියලුම අංග සමූපකාර මූලධර්ම, නිති හා ප්‍රතිපත්තිවලට අනුකූලව, සාමාජික මධ්‍යස්ථ හා වගකිවයුතු ක්‍රමවේදයක් යටතේ ක්‍රියාත්මක වේ.  ඒ යටතේ සමිතිය සාමාජිකයන්ගේ සහ ප්‍රදේශයේ ජනතාවගේ ආර්ථික,  සමාජ සහ සංස්කෘතික අවශ්‍යතා පිළිබඳ සේවා සැපයීමට වගකීම් භාරගනී.

2026 මෙම සංවර්ධන සැලැස්ම යටතේ සමිතියට පවරා ඇති කාර්යයන් සහ වගකීම් ප්‍රධාන වශයෙන්ම සාමාජිකයන්ගේ අවශ්‍යතා හඳුනාගෙන ඒවාට යථාර්ථවාදී හා ප්‍රායෝගික විසඳුම් ලබාදීම වෙත යොමු වේ. ඒ සඳහා ආර්ථික සංවර්ධනය, ව්‍යාපාරික හැකියාවන් වර්ධනය, සේවා ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සහ සමාජ සුභසාධනය ප්‍රවර්ධනය කිරීම යන ක්ෂේත්‍ර සම්පූර්ණයෙන්ම ආවරණය වන පරිදි සමිතියේ කටයුතු සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලැබේ. එමෙන්ම සමිතිය සාමාජිකයින්ගේ සහ ප්‍රාදේශිය ජනතාවගේ අවශ්‍යතා ඉටු කිරීමේදී විශ්වාසදායක, සාධාරණ, සහ කාර්යක්ෂම ක්‍රමවේද භාවිත කරන අතර, සියලු කාර්යයන් ස්ථිර, කාලෝචිත, සහ නිරන්තර අධීක්ෂණ සහ පුහුණු කිරීම් මගින් සම්පූර්ණ කාර්යක්ෂමතාවය සහ ප්‍රතිඵල උසස් කිරීමට අපේක්ෂා කරයි.

සමිතිය මගින් ක්‍රියාත්මක කරන සියලුම වැඩසටහන් පරමාදර්ශී කළමණාකරණයකට හා නිසි වගකීමකට යටත් වන අතර, මූල්‍ය සම්පත් නිසි ලෙස භාවිතා කර තිරසාර සංවර්ධනයට දායකවීම සමිතියේ සම්පූර්ණ වගකීම ලෙස සැලකේ.  ඒ අතරම දේශීය සම්පත් හා මානව සම්පත් උපරිම ලෙස භාවිතා කර ගම්මාන මට්ටමේ සංවර්ධනය ශක්තිමත් කිරීමත්, සාමාජිකයන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම, ආර්ථික ස්ථාවරතාව ශක්තිමත් කිරීම,  සමාජ එකමුතුව සහ සහයෝගීත්වය වර්ධනය කිරීම, නව අවස්ථා නිර්මාණය කිරීම සහ ස්ථායී සංවර්ධනයට දායක වීම මෙම සැලැස්මේ අත්‍යවශ්‍ය අංග වේ.

1.5 **වාර්ෂික මහසභා රැස්වීම කැඳවීමේ ලිපිය**

මහ සභා/2026/01,

සී/ස කුරුවිට වි. සේ. ස. සමිතිය,

කුරුවිට.

2025.12.10

සීමාසහිත කුරුවිට විවිධ සේවා සමුපකාර සමිතියේ,

සියලුම මහසභා නියෝජිත මහත්ම,මහත්මීන් වෙත,

මහත්මයාණෙනි/මහත්මියණි,

## වාර්ෂික මහසභා රැස්වීම- 2026.01.03

ලියාපදිංචි අංක ර/473 දරණ සීමාසහිත කුරුවිට විවිධ සේවා සමුපකාර සමිතියේ අනුමත අතුරු ව්‍යවස්ථා මාලාවේ 34 වන වගන්තිය ප්‍රකාර වාර්ෂික මහසභා රැස්වීමක් 2026.01.03 දින පෙරවරු 9.30 ට සීමාසහිත කුරුවිට විවිධ සේවා සමුපකාර සමිතියේ, කුරුවිට නගර මධ්‍යයේ පිහිටි “සමුසිරි” ශාලාවේදී ගරු සභාපති, පී. එම්. මහින්ද ගුණරත්න මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන බව සියලුම මහසභා නියෝජිත මහත්ම, මහත්මීන් වෙත මෙයින් කාරුණිකව දන්වා සිටිමි. මෙම මහසභා රැස්වීම සඳහා පැමිණ සහභාගී වන ලෙස ගෞරවයෙන් ආරාධනා කරමි.

<u>සැළකිය යුතුයි</u>

සමිතිය පිළිගත් අතුරු ව්‍යවස්ථාවේ 28 (3) වගන්තිය අනුව නුසුදුසුකම් තිබේ දැයි තහවුරු කර ගැනීම සඳහා පත්කර ඇති මහසභා නියෝජිතයන්ගේ සුදුසුකම් පරීක්ෂා කිරීම සිදු කරනු ලබන අතර, යම් හෙයකින් නුසුදුසුකමක් අනාවරණය වුවහොත් ඔබගේ නියෝජිත ධූරය අහෝසි වන බව කාරුණිකව දන්වන අතර, එවැනි අවස්ථාවක දි මෙම කැඳවීම අවලංගු වන බව කාරුණිකව දැනුම් දෙමි.

<u>රැස්වීමේ න්‍යාය පත්‍රය</u>

1. පොල්තෙල් පහන දැල්වීම.
2. ආගම සිහිකිරීම.
3. මියගිය සමුපකාරිකයින් හා රණවිරුවන් සිහිකිරීම.
4. සමුපකාර ගීතය ගායනය.
5. සභාව පිළිගැනීම හා අරමුණ පැහැදිළි කිරීම.
6. රැස්වීම කැඳවීමේ දැන්වීම කියවීම.

7. සමුපකාර සංවර්ධන කොමසාරිස් රෙජිස්ට්‍රාර්තුමාගේ දේශණය

8. 2024.01.01 සිට 2024.12.31 දින දක්වා වර්ෂයට අදාල පාලන වාර්තාව ඉදිරිපත් කිරීම

2026 වර්ෂය සඳහා සංවර්ධන සැළැස්ම" අයවැය ඇස්තමේන්තුව හා අධ්‍යක්ෂක මණ්ඩල යෝජනා සහ පිට ණය සීමාව අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම.

9. 2022 වර්ෂයේ විගණන වාර්තාව ඉදිරිපත් කිරීම හා ලාභ බෙදීම අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම.

10. දැනට සිටින ගරු අධ්‍යක්ෂක මණ්ඩලය ධූරවලින් ඉවත්වීම ප්‍රකාශයට පත්කිරීම සහ ඉදිරි වර්ෂ 03ක් සඳහා ගරු අධ්‍යක්ෂක මණ්ඩලයක් තෝරා පත්කර ගැනීම

11. මහසභා නියෝජිත මහත්ම මහත්මීන්ගේ අදහස් දැක්වීම.

12. ස්තූතිය හා නිමාව.

මෙයට,
නියමය පරිදි,

ලේකම්

පිටපත්,

01. සමුපකාර සංවර්ධන කොමසාරිස් රෙජිස්ටාර්තුමා, සමු/සං/ පළාත් කාර්යාලය, සබරගමුව පළාත් සභාව නවනගරය, රත්නපුර. මෙදින රැස්වීමට පැමිණ සහභාගි වන මෙන් ගෞරවයෙන් ආරාධනා කරමි.

02. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්තුමා මෙදින රැස්වීමට පැමිණ සහභාගී වන මෙන් ගෞරවයෙන් ආරාධනා කරමි.

03. ගරු සභාපති තුමා ඇතුළු අධ්‍යක්ෂක මණ්ඩලයේ සියලුම මහත්වරුන් වෙත - මෙදින රැස්වීමට පැමිණ සහභාගි වන මෙන් ගෞරවයෙන් ආරාධනා කරමි.

04. ගරු ලේකම් මහතා/මහත්මිය ............................................................ ප්‍රාදේශික කාරක සභාව මෙම මහසභාවට සහභාගි වන නියෝජිත මහත්ම,මහත්මීන්ගේ මහ සභා නියෝජිත බලපත්‍ර සම්පූර්ණ අත්සන් හා කාරක සභා මුද්‍රාව තබා එක් පිටපතක් සමිතියේ ලේකම් වෙත 2025.12.29 දිනට පෙර ලැබෙන්නට සලස්වන ලෙස ද අනෙක් පිටපත මහාසභා රැස්වීමට සහභාගි වන විට රැගෙන ඒම සඳහා මහා සභා නියෝජිත මහත්ම/මහත්මීන්ට භාර දෙන ලෙස දන්වමි.

05. සියළුම විධායක නිළධාරි මහත්ම/මහත්මීන් වෙත මෙදින රැස්වීමට සහභාගි වන ලෙස දන්වමි.

06. ගොනුවට කුවි/ලේ/මහසභා/2026,01

# 2. පාලන වාර්තාව

## 2.1 ආයතනය සම්බන්ධ තොරතුරු

### 2.1.1 පොදු තොරතුරු

නාමය :- සි/ස කුරුවිට විවිධ සේවා සමුපකාර සමිතිය

ලියාපදිංචි අංකය හා දිනය :- ර/473

1971.02.26

2024.12.31 දිනට සාමාජික සංඛ්‍යාව :- 39423

### 2.1. 2 සාමාජික විස්තරය

| විස්තරය | 2024.01.01 දිනට සාමාජික සංඛ්‍යාව | 2024.01.01 දින සිට 2024 12.31 දක්වා නව බඳවාගැනීම් | 2024.12.31 දිනට එකතුව |
|---|---|---|---|
| සාමාජික සංඛ්‍යාව | 38848 | 575 | 39423 |
| සාමාජික කොටස් ප්‍රාග්ධනය (රුපියල්) | 19784095 | 1141541 | 20925636 |

## 2.2 අධ්‍යක්ෂ මණ්ඩලය

2024.01.01 දින සිට 2024.12.31 දක්වා කාලය තුල සමිතියේ පාලන කටයුතු මෙහෙයවීම පහත සඳහන් ගරු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදුකරන ලදි.

| අනු අංකය | සාමාජික අංකය | නම | තනතුර | පත් වූ දිනය | පත් වූ ආකාරය |
|---|---|---|---|---|---|
| 01 | 07/753 | පී. සරත් රාජපක්ෂ මහතා | ගරු සභාපති | 2023.02.12 | මහා සභාවෙන් |
| 02 | 04/840 | ඩී. එච්. හරිසිංහ මහතා | ගරු උප සභාපති | 2023.02.12 | මහා සභාවෙන් |
| 03 | 10/1478 | ටී. එම්. තරංග දිල්ශාන් මහතා | ගරු අධ්‍යක්ෂක | 2023.02.12 | මහා සභාවෙන් |
| 04 | 25/366 | ටී. කේ. කේ. පුෂ්පකුමාර මහතා | ගරු අධ්‍යක්ෂක | 2023.02.12 | මහා සභාවෙන් |
| 05 | 1/2108 | ටී. එම්. සුමිත් ප්‍රේමලාල් | ගරු අධ්‍යක්ෂක | 2023.02.12 | මහා සභාවෙන් |
| **අවුරුදු 18-35 අතර නියෝජිත** | | | | | |
| 06 | 22/707 | බී. සමිත් සුරංග මහතා | ගරු අධ්‍යක්ෂක | 2023.02.12 | මහා සභාවෙන් |
| 07 | 22/707 | එම්. ඩබ්. කංචන අදස්සූරිය | ගරු අධ්‍යක්ෂක | 2023.02.12 | මහා සභාවෙන් |
| **කාන්තා කමිටු නියෝජිත** | | | | | |
| 08 | 22/25 | මල්ලිකා පරණමානගේ | ගරු අධ්‍යක්ෂිකා | 2023.03.19 | කාන්තා කමිටු නියෝජිත රැස්වීමෙන් |
| 09 | 1/1816 | ටී. එම්. ප්‍රියන්ති ජයනාත් දයානන්ද | ගරු අධ්‍යක්ෂිකා | 2023.03.19 | කාන්තා කමිටු නියෝජිත රැස්වීමෙන් |

ටී. කේ. කේ. පුෂ්පකුමාර මහතා සහ ටී. එම්. සුමිත් ප්‍රේමලාල් මහතා 2024.12.12 දින ගරු අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ඉල්ලා අස්වන ලදි. පසුව 2025.01.01 දින ඉල්ලා අස්වීමේ ලිපිය ඉවත්කර නැවත අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා සම්බන්ධ විය.

## 2.4 විධායක නිළධාරී මණ්ඩලය

| | | |
|---|---|---|
| සාමාන්‍යාධිකාරී | - | **පී. රංජිත් අමරසිංහ මහතා.** (2024.01.01 දින සිට 2024.12.31 දක්වා |
| ගණකාධිකාරී | - | **එස්. එල්. සී. පී. කරුණාරත්න මෙනවිය** (2024.01.01 දින සිට 2024.12.31 දින |
| බැංකු සේවා කළමණාකරු | - | **ඩබ්. පී. අයි. එන්. වික්‍රමසූරිය මෙනවිය** 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා |
| වාණිජ කළමණාකරු | - | **එච්. ඩබ්. සී. ආශා හේවාවඩුගේ මිය** 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා |
| ලේකම් පිරිස් කළමණාකරු | - | **ඩී. නිර්මලා වසන්ති පෙරේරා මිය** 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා |
| අභ්‍යන්තර විගණක | - | **කේ. ඒ. විජිතා කුරුප්පුආරච්චි මෙනවිය.** 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා |
| ව්‍යාපාර සංවර්ධන නිළධාරී | - | **එච්. ඩී. සෝමරත්න ගමගේ මහතා.** 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා. |
| අභ්‍යන්තර විගණක ග්‍රාමීය බැංකු | - | **එම්. ගයනි නිලුක්ෂිකා ජයරත්න මිය.** 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා |
| | | **ඩී. එම්. සරෝජා මල්කාන්ති** 2024.09.23 දින සිට 2024.12.31 දින දක්වා |

## 2.5 පිරිස්බල තක්සේරුව

සබරගමු පළාත් සමූපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ට්‍රාර්තුමා විසින් 2019.07.17 දිනැතිව අනුමත කරන ලද පිරිස්බල තක්සේරුව අනුව අදාළ වර්ෂය තුළ පිරිස් බලය පවත්වා ගැනිම පිළිබඳව කටයුතු කර ඇත. ඒ අනුව අනුමත සේවක සංඛ්‍යාව 162 කි.

**කාලය තුළ සේවයේ නියුක්ත සංඛ්‍යාව**

| | | |
|---|---|---|
| ස්ථිර කාර්යය මණ්ඩලය | - | 80 |
| අනියම්/තාවකාලික/කොන්ත්‍රාත් පදනම මත සේවය කරන කාර්යය මණ්ඩලය | - | 50 |
| **එකතුව** | - | **130** |

## 2.6 කාලය තුළ අනුකමිටු රැස්වීම්, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් හා මහසභා රැස්වීම්

සමිතියේ කළමණාකාරිත්වය වඩාත් නිරවුල්ව සහ සංවිධානාත්මකව පවත්වාගැනිම උදෙසා ගරු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අදාළ ව්‍යාපාරිකමය තින්දු තිරණ ලබාගැනිම සඳහා නිර්දේශ ඉදිරිපත් කෙරෙන අනුකමිටු රැස්වීම් පහත පරිදි පැවැත්වීමට කටයුතු කරන ලදි.

| | අනුකමිටුව | පැවැත්වූ රැස්වීම් ගණන |
|---|---|---|
| 1. | පාරිභෝගික අනුකමිටු | 19 |
| 2. | මුදල් අනුකමිටු | 10 |
| 3. | ග්‍රාමීය බැංකු ණය අනුකමිටු | 36 |
| 4. | ටෙන්ඩර් අනුකමිටු | 05 |
| 5. | පෙර පාසල් අනුකමිටු | 03 |
| 6. | විධායක නිළධාරී අනුකමිටු | 10 |

**අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීම**

ඉහත කී අනුකමිටු නිර්දේශයන් හා අනෙකුත් ව්‍යාපාරිකමය තත්ත්වයන් හඳුනාගනිමින් ව්‍යාපාරිකමය ප්‍රතිපත්ති සම්පාදනයට අවශ්‍ය කළමණාකරණ තිරණ ගැනිම සඳහා අදාළ වර්ෂය තුළ අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් 36 ක් පවත්වා ඇත.

## 2024 වර්ෂය තුල පැවැත්වූ මහ සභා රැස්වීම්

2024.12.25 දින සමිතියේ වාර්ෂික මහසභා රැස්වීම පැවැත්වීමට කටයුතු කර ඇත. එහිදී 2025 වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරිමට අපේක්ෂිත වූ සංවර්ධන සැලසුම් හා අයවැය ඇස්තමේන්තුව අනුමත කරගැනිම, 2023 වර්ෂයේ පාලන වාර්තාව ඉදිරිපත් කිරීම, ගරු මහසභාව මගින් සිදුකර ඇත.

## 2.7 කාලය තුළ ක්‍රියාත්මක වූ ව්‍යාපාරික අංශ

1. පාරිභෝගික අංශය
2. ග්‍රාමීය බැංකු අංශය
3. ඉන්ධනහල අංශය
4. රක්‍ෂණ සේවා අංශය
5. නියෝජිත තැපැල්හල අංශය
6. මංචි අලෙවි නියෝජිත අංශය
7. පැකට් අංශය
8. පෙර පාසල් අංශය
9. යුනිලිවර් අලෙවි නියෝජිත අංශය

## 1. පාරිභෝගික අංශය

ප්‍රාදේශික, මිනිකෝප්සිටි, කෝප්සිටිය, හා තොග ගබඩාව එක්ව පාරිභෝගික අංශයේ සියළු අලෙවි කටයුතු සිදුකර ඇත.

## 3.1 පාරිභෝගික අංශය තුළ ක්‍රියාත්මක වූ ව්‍යාපාරික අංශ

### සමිතියේ සෘජු පාලනය යටතේ ක්‍රියාත්මක ව්‍යාපාරික ස්ථාන

1. අංක 1 තොග ගබඩාව
2. අංක 2 තොග ගබඩාව
3. අංක 3 තොග සහන ගබඩාව
4. කෝප්සිටිය
5. කුරුවිට ප්‍රාදේශිකය
6. වතුයාය මිනිකෝප්සිටිය
7. තෙප්පනාව මැදගම මිනිකෝප්සිටිය

13. දෙව්පහල මිනිකෝප්සිටිය
14. තෙප්පනාව පහළගම ප්‍රාදේශිකය
15. තෙප්පනාව ඉහළගම ප්‍රාදේශිකය
16. බටතොට ප්‍රාදේශිකය
17. නඩුකාරදෙනිය මිනිකෝප්සිටිය (2024/12/03 දින වසා ඇත)
18. කරපිංචවත්ත මිනිකෝප්සිටිය
19. පැරඩයිස්වත්ත මිනිකෝප්සිටිය

8. එක්නැලිගොඩ මිනිකෝප්සිටිය
9. එරත්න මිනිකෝප්සිටිය
10. ගෝනපිටිය ප්‍රාදේශිකය
11. වළඳුර මිනිකෝප්සිටිය
12. මලංගම මිනිකෝප්සිටිය
(2024/09/05 දින වසා ඇත)

20. පණුකැරැපිටිය මිනිකෝප්සිටිය
21. කාහේන්ගම මිනිකෝප්සිටිය
22. දෙල්ගමුව මිනිකෝප්සිටිය
23. මුරුත්තෙට්ටුකන්ද ප්‍රාදේශිකය
24. පැකට් අංශය

## 3 2024 වර්ෂය තුළ සමිතියේ නිත්‍ය තත්ත්වය F-28 අනුව

2024 වර්ෂය තුල සමිතියේ ඒ ඒ අංශ තුළ පැවති විකුණුම්, වියදම් හා ශුද්ධ අතිරික්තය/ ඌණතාවය පිළිබඳ පහත සඳහන් වේ.

### 3.1. වෙළඳ අංශය

| විස්තරය | 2024.01.01 සිට 2024.12.31 දක්වා නිත්‍ය රු. |
|---|---|
| විකුණුම් | 341955113 |
| වියදම් | 29685028 |
| **පොදු පරිපාලන වියදම් ගැලපීමෙන් පසු ශුද්ධ අතිරික්තය** | **(2471068)** |

සමිතියේ සියලුම ප්‍රාදේශික, මිනිකෝප්සිටි හා කෝප්සිටිය විසින් 2024 වර්ෂය තුළදී රු. 341955113/= ක වෙළඳාමක් සිදුකර ඇත. මෙම අංශයේ සියළු වියදම් පියවා පොදු පරිපාලන වියදම් ගැලපු පසු රු. (2471068)/= ක ශුද්ධ පාඩුවක් ලබා ඇත. මෙහි දි ශ්‍රිපාද සේවා ආදායම රු.1984728/- ක ආදායම ගැලපීමෙන් පසු ඉහත අලාභය ගණනය කර ඇත

### 3.2 ඉන්ධනහල අංශය

| විස්තරය | 2024.01.01 සිට 2024.12.31 දක්වා නිත්‍ය රු. |
|---|---|
| විකුණුම් | 1785336165 |
| වියදම් | 13618101 |
| **පොදු පරිපාලන වියදම් ගැලපීමෙන් පසු ශුද්ධ අතිරික්තය** | **32752986** |

කුරුවිට ඉන්ධනහල සමිතිය තුළ ක්‍රියාත්මක ඉතාම වැදගත් ව්‍යාපාරික ස්ථානයකි. 2024 වර්ෂය තුළ සිදුකර ඇති මුළු විකුණුම් ප්‍රමාණය රු. 1785336165/= කි. සියළු වියදම් පියවා පොදු පරිපාලන වියදම් ගැලපූ පසු රු. 32752986/= ක ශුද්ධ අතිරික්තයක් උපයා ඇත.

### 3.3 ශ්‍රීපාද සේවා ආපනශාලා අංශය

2023 වර්ෂයේ උදුවප් පොහොය දිනෙන් ආරම්භව 2024 වර්ෂයේ වෙසක් පුර පසළොස්වක පොහොය දිනෙන් අවසන් වු ශ්‍රී පාද වන්දනා සමය තුළ හැරමිටිපාන ආපනශාලාව සහ ආඩියාමලතැන්න ආපනශාලාව සමිතිය විසින් පවත්වාගෙන ගොස් ඇත. එමගින් වන්දනාව සඳහා පැමිණෙන බැතිමතුන්ට සහනදායි සේවාවක් සැලසීමට කටයුතු කර ඇති අතර, අදාළ ආපනශාලාවලින් සමිතිය වෙත ලැබුණු ආදායම් පහත පරිදි වේ.

| ආපනශාලව | ටෙන්ඩර්ගත වටිනාකම රු. | වියදම් අඩුකල පසු වර්ෂයේ ශුද්ධ ලාභය |
|---|---|---|
| හැරමිටිපාන ආපානශාලාව | 1430010 | 1121548 |
| ආඩියාමලතැන්න ආපනශාලාව | 1160099 | 863180 |
| **එකතුව** | **2590109** | **1984728** |

3.4 **රක්ෂණ සේවා අංශය**

| **විස්තරය** | **2024.01.01 සිට 2024.12.31 දක්වා නිත්‍ය රු.** |
|---|---|
| මුළු ආදායම | 524120 |
| මුළු වියදම් | 471077 |
| **පොදු පරිපාලන වියදම් ගැලපීමෙන් පසු ශුද්ධ ඌනතාවය** | **(16580)** |

සමුපකාර රක්‍ෂණ සමාගමේ නියෝජිතයෙකු ලෙස කටයුතු කරමින් සමිතිය මඟින් පවත්වාගෙන යන රක්‍ෂණ සේවා අංශය තුළින් 2024 වර්ෂයේ ලබා ඇති ආදායම රු. 524120/= කි. සියළුම වියදම් පියවීමෙන් පසු එම අංශයේ ශුද්ධ ඌනතාවය රු. (16580/=) කි.

3.5 **පෙර පාසල් අංශය**

| **විස්තරය** | **2024.01.01 සිට 2024.12.31 දක්වා නිත්‍ය රු.** |
|---|---|
| මුළු ආදායම | 4164608 |
| මුළු වියදම් | 3288893 |
| **පොදු පරිපාලන වියදම් ගැලපීමෙන් පසු ශුද්ධ අතිරික්තය** | **586582** |

මෙම අංශය සමිතියේ ප්‍රජා සත්කාරක සේවයක් වශයෙන් පවත්වගෙන යනු ලැබූ අතර, සාමාජික ගණුදෙනුකාර භවතුන්ගේ දරු දැරියන් ගේ පෙර පාසල් අධ්‍යාපන අවශ්‍යතාවයක් සපුරාලීම ප්‍රධාන අවශ්‍යතාවය විය.

ඒ සඳහා මෙම වර්ෂය තුළ අප සමිතිය විසින් පහත සඳහන් පෙර පාසල් පවත්වාගෙන ගොස් ඇත.

1. කුරුවිට සමුසිගිති සෙවන පෙර පාසල
2. කුරුවිට සුභාගෝධය පෙර පාසල

3. එරත්න තක්ෂිලා පෙර පාසල
4. දෙවිපහළ නවමිණි පෙර පාසල

මගින් පෙර පාසල් අංශයේ 2024 වර්ෂයේ මුළු ආදායම රු. 4164608/= ක් වූ අතර, සියළුම වියදම් පියවා පොදු පරිපාලන වියදම් ගැලපීමෙන් පසු රු. 586582/= ක අතිරික්තයක් ලබා ඇත.

### 3 .6 **සමුජන නියෝජිත තැපැල්හල අංශය**

| **විස්තරය** | **2024.01.01 සිට 2024.12.31 දක්වා නිත්‍ය රු.** |
|---|---|
| මුළු ආදායම | 5254918 |
| මුළු වියදම් | 619171 |
| **පොදු පරිපාලන වියදම් ගැලපීමෙන් පසු ශුද්ධ අතිරික්තය** | **218207** |

සමුජන තැපැල්හල 2024 වර්ෂයේ ක්‍රියාකාරිත්වය තුළ රුපියල් 5254918/= ක ආදායමක් උපයාගෙන ඇති අතර, වර්ෂයට අදාළ රුපියල් 619171/= ක වියදම පියවීමෙන් පසු රුපියල් 218207/= ක ශුද්ධ අතිරික්තයක් සහිතව පවත්වාගෙන ගොස් ඇත.

### 3.7 **යුනිලීවර් අලෙවි නියෝජිත අංශය**

| **විස්තරය** | **2024.01.01 සිට 2024.12.31 දක්වා නිත්‍ය රු.** |
|---|---|
| මුළු ආදායම | 27947291 |
| මුළු වියදම් | 1910231 |
| **පොදු පරිපාලන වියදම් ගැලපීමෙන් පසු ශුද්ධ අතිරික්තය** | **1290987** |

යුනිලිවර් අලෙවි නියොජිත අංශය 2024 වර්ෂයේ ක්‍රියාකාරිත්වය තුළ රුපියල් 2947291/= ක ආදායමක් උපයාගෙන ඇති අතර, වර්ෂයට අදාළ රුපියල් 1910231/= ක වියදම පියවීමෙන් පසු රුපියල් 1290987/= ක ශුද්ධ අතිරික්තයක් සහිතව පවත්වාගෙන ගොස් ඇත.

### 3.8 **මංචි අලෙවි නියෝජිත අංශය**

| **විස්තරය** | **2024.01.01 සිට 2024.12.31 දක්වා නිත්‍ය රු.** |
|---|---|
| මුළු ආදායම | 31703861 |
| මුළු වියදම් | 1753540 |
| **පොදු පරිපාලන වියදම් ගැලපීමෙන් පසු ශුද්ධ අතිරික්තය** | **1209076** |

මංචි නියෝජිත අලෙවි අංශය 2024 වර්ෂයේ ක්‍රියාකාරිත්වය තුළ රුපියල් 31703861/= ක ආදායමක් උපයාගෙන ඇති අතර, වර්ෂයට අදාළ රුපියල් 1753540/= ක වියදම පියවීමෙන් පසු රුපියල් 1209076/= ක ශුද්ධ අතිරික්තයක් සහිතව පවත්වාගෙන ගොස් ඇත.

## 3.2 සමූපකාර ග්‍රාමීය බැංකු

කුරුවිට සමිති බල ප්‍රදේශය තුළ කුරුවිට, එරත්න, තෙප්පනාව, පණුකැරැපිටිය, කරපිංචවත්ත, පැරඩයිස්වත්ත, දෙවිපහළ, හා පාතගම යන ප්‍රදේශවල ග්‍රාමීය බැංකු 08 ක් ස්ථාපනය කර ඇත. කුරුවිට නගරය සහ පැරඩයිස් හංදිය අසල සමුරන් සුරැකුම් උකස් මධ්‍යස්ථානය 02 ක් පවත්වාගෙන යනු ලැබේ. බටතොට හංදිය ඉතුරුම් මධ්‍යස්ථානය 1 ද ආරම්භ කර ඇත. මේ අනුව ග්‍රාමීය බැංකු අංශයේ සේවා ස්ථාන 11 කි.

### 3.2.1 තැන්පත් වර්ධනය

| | | |
|---|---|---|
| 2024.01.01 දිනට ආරම්භක තැන්පත් වටිනාකම | - | රු. 1,343,540,030.00 |
| 2024.12.31 දිනට තැන්පත් වටිනාකම | - | රු. 1,476,150,072.00 |
| කාලය තුළ තැන්පත් වර්ධනය | - | රු. 132,610,042.00 |
| තැන්පත් වර්ධන ප්‍රතිශතය | - | 9.87% |

ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් විශේෂිත දින සැමරුම් ලෙස විශ්ව ළමා දිනය, වැඩිහිටි දිනය, කාන්තා දිනය හා සිංහල හා හින්දු අලුත් අවුරුදු ගණුදෙනු අවස්ථාවන් තුළින් ගණුදෙනුකාර භවතුන් ග්‍රාමීය බැංකු ගණුදෙනු සඳහා ආකර්ශනය කරගනිමින් ඉහත තැන්පත් වර්ධනය සිදුකරගැනීමට හැකි වී ඇත.

### 3.2.2 සාමාජික ණය ආයෝජනය හා රන් සුරැකුම් උකස් ආයෝජනය

ග්‍රාමීය ජනතාවගෙන් එක්රැස් කර ගන්නා මුදල් ග්‍රාමීය ජනතාව තුල සංසරණය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් අප ගණුදෙනුකාර භවතුන්ගේ ආර්ථික හා සමාජ සුභසාධනය ඇති කරලීම සඳහා මුළු තැන්පත්වලින් 69.60% ක ප්‍රමාණයක් ණය සහ උකස් වෙනුවෙන් ආයෝජනය කර ඇත.

**සාමාජික ණය**

| | | |
|---|---|---|
| 2024.01.01 දිනට සාමාජික ණය වටිනාකම | - | රු. 601,057,744.00 |
| 2024.12.31 දිනට සාමාජික ණය වටිනාකම | - | රු. 632,586,553.00 |
| සාමාජික ණය අනුපාතය මුළු තැන්පත්වලින් | - | 42.85% |

**උකස් අත්තිකාරම් ණය**

| | | |
|---|---|---|
| 2024.01.01 දිනට උකස් අත්තිකාරම් | - | රු, 398,622,695.00 |
| 2024.12.31 දිනට උකස් අත්තිකාරම් | - | රු. 394,986,398.00 |
| උකස් ආයෝජන අනුපාතය මුළු තැන්පත්වලින් | - | 26.75% |

**සේවක ණය**

තෘප්තිමත් සේවක පිරිසක් මගින් කාර්යක්ෂම සේවාවක් ලබාදීම සඳහා කාර්යය මණ්ඩලයේ 74 දෙනෙක් සඳහා 5% ක අවම පොලී අනුපාතයක් යටතේ රු. 43,696,602/= ක් සේවක ණය ලෙස ලබාදීමට කටයුතු කර ඇත.

| | |
|---|---|
| 2024.01.01 දිනට සේවක ණය වටිනාකම | - රු. 18,577,498.00 |
| 2024.12.31 දිනට සේවක ණය වටිනාකම | - රු. 43,696,602.00 |
| විචලනය | - රු. 25119104.00 |

**කල්පසු ණය**

| | |
|---|---|
| 2024.01.01 දිනට කල්පසු ණය වටිනාකම | - රු. 99786076.00 |
| 2024.12.31 දිනට කල්පසු ණය වටිනාකම | - රු. 122772937.00 |
| විචලනය | - රු. 22986861.00 |
| ප්‍රතිශතය | - 19.4% |

කල්පසු ණය අයකර ගැනීම සඳහා ගණුදෙනුකරුවන් වෙත ලිපි යැවීම පෞද්ගලිකව හමුවී පසුවිපරම් මගින් දැනුවත් කිරීම, කැඳවා කරුණු පැහැදිළි කිරීම, ණය ප්‍රතිලේඛන ගත කිරීම මගින් නැවත අයකර ගැනීමට කටයුතු කිරීම සිදුකර ඇත. ඊට අමතරව එන්තරාවාසි යැවීම, තීරකකරණයට යොමුකිරීම, තීරක ප්‍රදාන ලබාගැනීම හා උසාවි බලගැන්වීම ආදී කටයුතු සිදුකර ඇත. මාසිකව පවත්වන ග්‍රාමීය බැංකු කාර්යය මණ්ඩලයේ කළමණාකරණ රැස්වීමේදී මේ පිළිබඳව පුළුල්ව සාකච්ඡා කොට ප්‍රගතිය සමාලෝචනය කිරිම සහ කළමණාකරණ කාර්යයන් විධිමත් ලෙස ක්‍රියාවට නැංවීමට කටයුතු සිදුකර ඇත.

2024.12.31 දිනට මුළු තැන්පත් වටිනාකම රු 1,476,150,072/=කි. එම තැන්පත්වලින් 26.75% ක් උකස් අත්තිකාරම් ලෙසද 42.85% ක් සාමාජික ණය ලෙසද සාමාජික ප්‍රජාවට ප්‍රදානය කර ඇත.

ඒ අනුව මුළු තැන්පත් වටිනාකමින් 69.60 % ක් උකස් හා සාමාජික ණය වෙනුවෙන් ආයෝජනය කර ඇත. ඉතිරිය තැන්පත් වල සුරක්ෂිතභාවය උපරිම අයුරින් ආරක්ෂා වන ලෙසට සමුපකාර සංවර්ධන කොමසාරිස්තුමාගේ ආයෝජන චක්‍රලේඛනයේ සඳහන් පරිදි ආයෝජනය කර ඇත. එය මහජන බැංකුව, ජාතික ඉතිරිකිරීමේ බැංකුව, පීපල්ස් ලිසිං, ජාතික සමුපකාර මණ්ඩලය, දිස්ත්‍රික්

ග්‍රාමීය බැංකු සංගමය, නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, ලංකා බැංකුව යන මූල්‍ය ආයතන වල ආයෝජනය කර ඇත.

**සමුපකාර ග්‍රාමීය බැංකු අංශයේ අතිරික්තය**

| | |
|---|---|
| 2024.01.01 දිනට අතිරික්තය | - රු. 80,849,615.00 |
| 2024.12.31 දිනට අතිරික්තය | - රු. 106,088,478.00 |

# සංවර්ධන සැලැස්ම

# 2026

# 4.1 හැඳින්වීම

රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිළධාරී වසම් 26 ක් සහ රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිළධාරී වසම් 4 ක් ආවරණය කරගනිමින් පසුගිය දශක 5 ක් පුරා ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීම, සාමාජිකයින්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම සහ ආදායම් මාර්ග විවිධාංගීකරණය කිරීම සඳහා පරිපූර්ණ කැපවීමකින් සී/ස කුරුවිට විවිධ සේවා සමුපකාර සමිතිය කටයුතු කළ බව අභිමානයෙන් යුතුව ප්‍රකාශ කරමු.

අප සමිතිය 39000 ට අධික සාමාජිකයන්ගෙන් සමන්විත වූ ප්‍රදේශයේ කීර්තිමත් තරඟකාරී පොදු ආයතනයක් බවට පත්ව ඇති අතර, කුරුවිට ප්‍රදේශය පුරා විහිදී ඇති ග්‍රාමීය හා නාගරික ප්‍රජාවගේ ගණුදෙනු හා සේවා අවශ්‍යතා සමග බද්ධ වෙමින් කටයුතු කරණු ලබයි.

මෙම සංවර්ධන සැලැස්ම සමිතිය තුළ පවත්නා විවිධ අංශ තුළින් ඇතිකරනු ලබන ආර්ථික, සමාජීය හා සංස්කෘතික සංවර්ධන ගමන් මග නායකත්වය සහ නවෝත්පාදනය පිළිබඳ දැක්ම විධිමත් කරනු ලබන මාර්ග සූචියක් ලෙස සකස්කර ඇත. එහිදී අඛණ්ඩව පවත්නා වෙළඳ ක්‍රියාකාරකම් තවදුරටත් සංවිධානය කරමින්, නිෂ්පාදන ගුණාත්මකභාවය උසස් කිරීම, නව වෙළඳ අවස්ථා සොයා ගැනීම සහ සමාජීක ආර්ථික ස්ථායිභාවය වැඩි කිරීම යන අරමුණු ඉටුකිරීමට අපේක්ෂා කෙරේ.

සාමාජිකයන්ගේ සහයෝගය, කැපවීම හා විශ්වාසය මත පදනම් වූ ශක්තිමත් ආයතනයක් බවට පත්වීමට ඒ අනුව අප සමිතියට හැකිවන බව අප විශ්වාස කරමු. එමඟින් ආයතනයේ ආර්ථික ස්ථාවරත්වය සාමාකයින්ගේ ජීවන මට්ම හා ගම්මානනිය සංවර්ධනය තවදුරටත් උසස් කරගැනීම අපගේ අරමුණයි. මේ මඟින් අප ආයතනයේ සාමාජිකත්වයට අභිමානවත් සහතිකයක් ලැබෙන අතර, ඒ සමගම "එක්ව ඉදිරියට – එක් අරමුණකට" යන ආකල්පය යටතේ කටයුතු කළ හැකිවනු ඇත.

ග්‍රාමීය සංවර්ධනයේ තිරසාර පදනමක් ලෙස සාමජිකත්ව, සේව්‍ය, සේවක යන සියලුදෙනාගේ එකතුවත්, කැපවීමත් මත ඉදිරියට ගමන් කරමින්, "එකමුතුවෙන් ගොඩනගන අපේ අනාගතය සඳා දිරියෙන් සඳා සමුපකාරව" යන්න ආකල්පය කරගනිමින්, මෙම සංවර්ධන සැලැස්ම, අප සමිතියේ අනාගතය සැලසුම් කරමින්, ආර්ථික, සාමාජික සහ පාරිසරික සත්කාරකත්වය එක්සත් කරන නව යුගයකට අපව ගෙන යාමට නියමිත මගපෙන්වීමක් වනු ඇත.

## 4.2 සමස්ත සමිතියේ ක්‍රියාත්මක හා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපාරික අංශ

1. ග්‍රාමීය බැංකු අංශය
2. වෙළඳ අංශය
3. රක්ෂණ අංශය
4. අධ්‍යාපන සේවා අංශය
5. ප්‍රවාහන අංශය
6. ව්‍යවසායකත්ව සංවර්ධන අංශය
7. සංචාරක සේවා අංශය
8. සෞඛ්‍ය සේවා අංශය
9. විශේෂ වැඩසටහන් කළමණාකරණ අංශය
10. අවමංගල සේවා අංශය
11. ඉදිකිරීම් සේවා අංශය
12. නිෂ්පාදන අංශය
13. වැවිලි අංශය
14. මානව සම්පත් සංවර්ධන අංශය
15. අලෙවි ප්‍රවර්ධන අංශය
16. සාමාජික සහ පොදු සුභසාධන අංශය

**සීමාසහිත කුරුවිට විවිධ සේවා සමුපකාර සමිතිය**

**අපේක්ෂිත වාර්ෂික ශුද්ධ අතිරික්තය**

| ව්‍යාපාර අංශය | ශුද්ධ අතිරික්තය රුපියල් |
|---|---|
| වෙළඳ අංශය | 98273000 |
| ග්‍රාමීය බැංකු අංශය | 131230000 |
| **එකතුව** | **229503000** |
| **කාර්යය මණ්ඩල දිරි දීමනා/F-28 ලාභ දීමනා/අයවැය සහන දීමනා** | **25000000** |
| **ඉතිරි ශුද්ධ ලාභය** | **204503000** |

## 4.3. ග්‍රාමීය බැංකු අංශය

සි/ස කුරුවිට විවිධ සේවා සමුපකාර සමිතියේ ප්‍රධානතම ආදායම් මාර්ගය ලෙස ග්‍රාමීය බැංකු අංශය හඳුන්වාදිය හැකිය. සමිතියේ පෙර ගමන්කරු ග්‍රාමීය බැංකු අංශය වේ. සමිතියේ ආදායම් උත්පාදන මාර්ගයේ ප්‍රමුඛයා ලෙස ග්‍රාමීය බැංකු අංශය ක්‍රියාකරයි. වසර 54 ක පමණ ඉතිහාසයක් ඇති ග්‍රාමීය බැංකු අංශය එදා මෙදාතුර සාමාජික ප්‍රජාවට ඉටුකර ඇති සේවාව ඉමහත්ය. සාමාජිකයාට ඉතිරි කිරීමේ පුරුද්ද කියාදීමත්, ආර්ථිකය ශක්තිමත් කිරීමත්, අඩු ආදායම් ලාභීන් වෙත සහන පොලී ප්‍රතිශත මත ණය, උකස් ණය ලබාදීමත් මෙම අංශය මගින් ඉටු කරයි. දරුවන්ට ඉතිරිකිරීමේ පුරුද්ද ඇති කිරීම, වැඩිහිටියන්ගේ තැන්පතුවලට වැඩි පොලියක් ලබාදෙමින් ඔවුනගේ සැඳෑසමය ආර්ථික දුෂ්කරතා නොමැතිව ජීවන ගමන යාමට මෙම අංශය පිටුවහලක් වී ඇත.

අපගේ ග්‍රාමීය බැංකු අංශය කුරුවිට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය පුරා මෙන්ම රත්නපුර ලේකම් කොට්ඨාශයට මායිම්ව විහිද පැතිරී ඇත.

ග්‍රාමීය බැංකු ශාඛා 8 , ඉතුරුම් මධ්‍යස්ථාන 1 සහ රන්සුරැකුම් උකස් මධ්‍යස්ථාන 2 කින් මෙම ජාලය ශක්තිමත්ව ඇත. 75000 ට අධික තැන්පත් කරුවන්ගේ බිලියන 1.5 අධික තැන්පත්වලට ආරක්ෂාව සපයා ඇති අතර, සහන පොලී ප්‍රතිශත යටතේ මිලියන 483 ක රන් ණය උකස් අත්තිකාරම් ලබාදී ඇත. එමෙන්ම මිලියන 649 ක සහන පොලී ප්‍රතිශත යටතේ නිවාස තනාගැනීමට, කෘෂිකර්මාන්තයට, ඉඩම් හා රථවාහන මිළදී ගැනීමට ස්වයංරැකියා සඳහා ණය ලබාදී ඇත. එම සියළුම ණයකරුවන්හට රක්ෂණාවරණයක් ලබාදී ඇත. 5% ක පොලී ප්‍රතිශතයක් යටතේ ස්ථිර කාර්යය මණ්ඩලය සඳහා ඔවුන්ගේ ආර්ථිකය නගා සිටුවීමේ අරමුණින් රුපියල් මිලියන 45 සේවක ණය ලබාදී ඇත.

**සමිතියේ බැංකු ජාලය**

i. කුරුවිට ග්‍රාමීය බැංකුව
ii. එරත්න ග්‍රාමීය බැංකුව
iii. තෙප්පනාව ග්‍රාමීය බැංකුව
iv. පණුකැරැපිටිය ග්‍රාමීය බැංකුව
v. කරපිංචවත්ත ග්‍රාමීය බැංකුව
vi. පැරඩයිස්වත්ත ග්‍රාමීය බැංකුව
vii. දෙවිපහළ ග්‍රාමීය බැංකුව
viii. පාතගම ග්‍රාමීය බැංකුව
ix. බටතොට ඉතුරුම් මධ්‍යස්ථානය
x. කුරුවිට රන් සුරැකුම් උකස් මධ්‍යස්ථානය
xi. පැරඩයිස් රන් සුරැකුම් උකස් මධ්‍යස්ථානය

## i. කුරුවිට ග්‍රාමීය බැංකුව

සි/ස කුරුවිට විවිධ සේවා සමුපකාර සමිතියේ ප්‍රථම සහ ප්‍රධානම ග්‍රාමීය බැංකු ශාඛාව කුරුවිට ග්‍රාමීය බැංකුවයි. කුරුවිටව නගර මධ්‍යයේ පිහිටා ඇති මෙම ශාඛාව මගින් දස දෙනෙකුට පමණ ස්ථිර රැකියා ලබාදී ඇත. මෙම බැංකුව ආරම්භයේ සිටම සේවකයන්ගේ කැපවීම මත බැංකු අංශයේ වැඩිම තැන්පත් උපයාගෙන ඇත්තේ කුරුවිට ග්‍රාමීය බැංකුවයි. බැංකු අංශයේ අතිරික්තයට වැඩිම දායකත්වයක් දැරීමේ ගෞරවය මෙම ශාඛාව හිමිකරගෙන ඇත. 27000 කට අධික තැන්පත් කරුවන්ගෙන් රුපියල් මිලියන 476 ක් ආරක්ෂාකර දීමට කටයුතු කර ඇත. එම තැන්පත් වලින් රුපියල් මිලියන 39 ක් පමණ ණය සහ උකස් ණය වල ආයෝජනය කර ඇත.

2026 වර්ෂය අවසන් වන විට තැන්පත් රුපියල් මිලියන 519 ණය රුපියල් මිලියන 259 උකස් අත්තිකාරම් ණය රුපියල් මිලියන 155 ලබාදීමට අපේක්ෂා කරන අතර, 2026 වර්ෂය අවසන් වන විට කල්පසු ණය ප්‍රතිශතය 5% ක මට්ටමකට ගෙන ඒමටත් සැලසුම්කර ඇත.

වර්තමානයට ගැලපෙන පරිදි තරඟකාරී අනෙකුත් මූල්‍ය ආයතන මෙන්ම කුරුවිට ග්‍රාමීය බැංකු ශාඛාවේ පහසුකම් වැඩිදියුණු කිරීමටත් අපෙක්ෂා කරන අතර, රුපියල් ලක්ෂ 15 ක් යොදවා ග්‍රාමීය බැංකු ශාඛාව නවීකරණය කර ගණුදෙනුකරුවන්ට වඩාත් කාර්යක්ෂම සේවාවක් ලබාදීම අරමුණ වේ.

## ii. එරත්න ග්‍රාමීය බැංකුව

කුරුවිට නගරයේ සිට කිලෝමීටර් 13 ක පමණ ශ්‍රීපාද අඩවියට ආසන්නව සමිතියේ ස්ථිර ගොඩනැගිල්ලක මෙම ග්‍රාමීය බැංකු ශාඛාව ස්ථාපනය කර ඇත. එරත්න නගර මධ්‍යයේ පිහිටා ඇති මෙම ශාඛාව මගින් සිව්දෙනෙකුට පමණ ස්ථිර රැකියා අවස්ථා ලබාදී ඇත. 9000 අධික තැන්පත්කරුවන් පිරිවරා රුපියල් මිලියන 200 ඉක්මවා තැන්පත් ආරක්ෂා කරමින් ඉන් රුපියල් මිලියන 97 ක් පමණ ණය සහ උකස් අත්තිකාරම් ණය වල ආයෝජනය කර ඇත. නගරයේ පිහිටා ඇති අනෙකුත් මූල්‍ය ආයතවලට අභියෝග කරමින් බැංකු අංශයේ අතිරික්තයට විශාලා දායකත්වයක් ලබාදෙයි.

2026 වර්ෂය අවසන් වන විට තැන්පත් රුපියල් මිලියන 234 ණය රුපියල් මිලියන 117 උකස් අත්තිකාරම් ණය රුපියල් මිලියන 24 ලබාදීමට අපේක්ෂා කරන අතර, ගණුදෙනු කරුවන්ගේ පහසුව සහ කාර්යක්ෂම සේවාවක් ලබාදීමේ අරමුණින් අංග සම්පූර්ණ ග්‍රාමීය බැංකු ශාඛාවක් ලෙස නවීකරණය කිරීමට රුපියල් ලක්ෂ 15 ක් 2026 වර්ෂය වෙනුවෙනු වෙන්කර ඇති අතර, ජෙනරේටර් ලබාදීම සඳහා රුපියල් ලක්ෂ 12.5 වෙන්කර ඇත.

## iii. තෙප්පනාව ග්‍රාමීය බැංකුව

තෙප්පනාව මැදගම ප්‍රදේශයේ ජනාකීර්ණ ස්ථානයක මෙම ශාඛාව පිහිටා ඇත. ස්ථිර රැකියා අවස්ථා 6 ක් පමණ ලබාදී ඇති මෙම ශාඛාව මගින් බැංකු අංශයේ අතිරික්තයට විශාල දායකත්වයක් එක්කරයි. ආර්ථිකය අතින් ශක්තිමත් ජන කොට්ඨාශයක් ජීවත් වන මෙම ප්‍රදේශයේ ජනතාව ඉතිරිකිරීමේ පුරුද්දට මුල්තැන දී ඇත. සමිතියට අයත් භූමියක අංග සම්පූර්ණ ලෙස මෙම ග්‍රාමීය බැංකු ශාඛාව ගොඩනගා ඇති අතර, 11000 කට අධික තැන්පත් කරුවන්ගේ රුපියල් මිලියන 400 ඉක්මවා තැන්පත් ආරක්ෂා කර දී ඇත. කුරුවිට සමිතියේ තැන්පත් අතින් දෙවන ස්ථානය මෙම ශාඛාව හිමිකරගෙන සිටී. ණය සහ උකස් අත්තිකාරම් ණය අවම මට්ටමක පවතින මෙම ශාඛාවේ ප්‍රධාන අරමුණ වන්නේ තැන්පත් ඒකරාශි කිරීමයි. තේ, රබර්, මැණික්, ආදියෙන් ජීවනෝපාය ගෙන යන මෙම ප්‍රදේශයේ සාමාජිකයන් ආර්ථිකය ශක්තිමත් වී තිබීම එයට හේතුව වේ.

2026 වර්ෂය අවසන් වන විට තැන්පත් රුපියල් මිලියන 467 ණය රුපියල් මිලියන 233 උකස් අත්තිකාරම් ණය රුපියල් මිලියන 53 ලබාදීමට අපේක්ෂා කරන අතර, ගණුදෙනු කරුවන්ගේ පහසුව සහ කාර්යක්ෂම සේවාවක් ලබාදීමේ අරමුණින් අංග සම්පූර්ණ ග්‍රාමීය බැංකු ශාඛාවක් ලෙස නවීකරණය කිරීමට රුපියල් ලක්ෂ 15 ක් 2026 වර්ෂය වෙනුවෙනු වෙන්කර ඇති අතර ජෙනරේටර් ලබාදීම සඳහා රුපියල් ලක්ෂ 12.5 වෙන්කර ඇත.

## iv. පණුකැරැපිටිය ග්‍රාමීය බැංකුව

කුරුවිට නගරයේ සිට කිලෝමීටර් 6 ක් පමණ දුරින් රත්නපුර නගරය දෙසට ප්‍රධාන මාර්ගය දිවෙන ප්‍රධාන මාර්ගය අසල මෙම ශාඛාව පිහිටා ඇත. අප සමිතියේ 4 වන ග්‍රාමීය බැංකු ශාඛාව ලෙස ආරම්භ කර ඇත. ස්ථිර රැකියා අවස්ථා පහක් පමණ ලබාදී ඇති මෙම ශාඛාව වටා තැන්පත් කරුවන් 7500 අධික ප්‍රමාණයක් ඒකරාශි වී ඇත. එම ගණුදෙනුකරුවන්හට අඩු පොලී ප්‍රතිශත යටතේ නිවාස ණය, කෘෂිකර්මාන්ත ණය, දේපළ ණය ආදි ණය වර්ග යටතේ ණය ලබාදී ඇත. හදිසි මුදල් අවශ්‍යතාවලදී උකස් අත්තිකාරම් ණය ලබාදී ඇත.

2026 වර්ෂය අවසන් වන විට තැන්පත් රුපියල් මිලියන 136 ණය රුපියල් මිලියන 68 උකස් අත්තිකාරම් ණය රුපියල් මිලියන 41 ලබාදීමට අපේක්ෂා කරන අතර, ගණුදෙනු කරුවන්ගේ පහසුව සහ කාර්යක්ෂම සේවාවක් ලබාදීමේ අරමුණින් අංග සම්පූර්ණ ග්‍රාමීය බැංකු ශාඛාවක් ලෙස නවීකරණය කිරීමට රුපියල් ලක්ෂ 15 ක් 2026 වර්ෂය වෙනුවෙන් වෙන්කර ඇති අතර ජෙනරේටර් ලබාදීම සඳහා රුපියල් ලක්ෂ 12.5 වෙන්කර ඇත.

## v. කරපිංචවත්ත ග්‍රාමීය

රත්නපුර නගරයට ආසන්නව, කරපිංච ප්‍රධාන මංසන්දිය ඉදිරිපිට මෙම ශාඛාව පිහිටුවා ඇත. විවිධ ජනකොටස් ජීවත්වන මෙම ප්‍රදේශයේ සාමාජිකයන්ගේ අවශ්‍යතා ඉටුකර දීමත් ඉතිරිකිරීමේ පුරුද්ද වැඩිදියුණු කරවීමට මගපෙන්වීම මෙහි ප්‍රධාන අරමුණ වේ. දෛනික වැටුප් ලබන රැකියාවල නියුතු දමිළ ජනතාව වැඩිවශයෙන් ජීවත් වන මෙම ප්‍රදේශයේ හදිසි මුදල් අවශ්‍යතා සඳහා උකස් ණය අත්තිකාරම් ලබාගැනීම වැඩි වශයෙන් සිදුවේ. තැන්පත්කරුවන් 9000 කට ආසන්න ප්‍රමාණයක් මෙම ශාඛාවේ රුපියල් මිලියන 158 ක් තැන්පත් කර ඇති අතර, ඉන් රුපියල් මිලියන 91 ක් පමණ ණය සහ උකස් අත්තිකාරම් ණය වල ආයෝජනය කර ඇත.

2026 වර්ෂය අවසන් වන විට තැන්පත් රුපියල් මිලියන 181 ණය රුපියල් මිලියන 90 උකස් අත්තිකාරම් ණය රුපියල් මිලියන 54 ලබාදීමට අපේක්ෂා කරන අතර, ගණුදෙනු කරුවන්ගේ පහසුව සහ කාර්යක්ෂම සේවාවක් ලබාදීමේ අරමුණින් අංග සම්පූර්ණ ග්‍රාමීය බැංකු ශාඛාවක් ලෙස නවීකරණය කිරීමට රුපියල් ලක්ෂ 15 ක් 2026 වර්ෂය වෙනුවෙන් වෙන්කර ඇත.

## vi. පැරඩයිස්වත්ත ග්‍රාමීය බැංකුව

පැරඩයිස් මංසන්ධියේ සිට කිලෝමීටර් 2 ක් දුරින් ජනාකීර්ණ ස්ථානයක මෙම ශාඛාව පිහිටුවා ඇත. පාසල, පන්සල සහ විවිධ අලෙවිහල් පොකුරකින් සමන්විත ස්ථානයක ස්ථානගත කර ඇත. 5700 ඉක්මවූ ගණුදෙනුකරුවන්ගේ රුපියල් මිලියන 120 ක තැන්පත් ආරක්ෂා කරමින් වැඩි පොලී ප්‍රතිශතයක් ලබාදීමට කටයුතු කර ඇත. ණය, උකස් අත්තිකාරම් ණය රුපියල් මිලියන 95 ක් පමණ ආයෝජනය කර ඇත. ස්ථිර රැකියා අවස්ථා 3 මෙම ශාඛාව මගින් ලබාදී ඇත. සමිතියේ භූමියක අංග සම්පූර්ණ පහසුකම් සහිත ශාඛාවක් ලෙස නවීකරණය කර ඇත.

2025 වර්ෂය අවසන් වන විට තැන්පත් රුපියල් මිලියන 156 ණය රුපියල් මිලියන 78 උකස් අත්තිකාරම් ණය රුපියල් මිලියන 46 ලබාදීමට අපේක්ෂා කරන අතර, ගණුදෙනු කරුවන්ගේ පහසුව සහ කාර්යක්ෂම සේවාවක් ලබාදීමේ අරමුණින් අංග සම්පූර්ණ ග්‍රාමීය බැංකු ශාඛාවක් ලෙස නවීකරණය කිරීමට රුපියල් ලක්ෂ 15 ක් 2026 වර්ෂය වෙනුවෙන් වෙන්කර ඇති අතර ජෙනරේටර් ලබාදීම සඳහා රුපියල් ලක්ෂ 12.5 වෙන්කර ඇත.

## vii. දෙව්පහළ ග්‍රාමීය බැංකුව

කුරුවිට නගරයේ සිට කිලෝමීටර් 5 ක් පමණ දුරින් දෙව්පහළ පාසල, පන්සල, කඩවීදිය, රාජ්‍ය සෞඛ්‍ය සේවා ආයතන පිහිටා ඇති ජනාකීර්න ස්ථානයක මෙම ශාඛාව පිහිටුවා ඇත. 2006 දී ආරම්භකරන ලද මෙම ශාඛාව ගණුදෙනුකරුවන්ට වඩාත් කාර්යක්ෂම සේවාවක් ලබාදීමේ අරමුණින් සමිතියේ භූමිය 2019 වර්ෂයේදී නව නිවහනකට ගෙන එන ලදි. 3000 ට අධික තැන්පත්කරුවන් ඒකරාශී වී ඇති මෙම බැංකු ශාඛාව මගින් රුපියල් මිලියන 62 ක පමණ ණය සහ උකස් අත්තිකාරම් ණය සදහා ආයෝජනය කර ඇත.

2026 වර්ෂය අවසන් වන විට තැන්පත් රුපියල් මිලියන 85 ණය රුපියල් මිලියන 42 උකස් අත්තිකාරම් ණය රුපියල් මිලියන 25 ලබාදීමට අපේක්ෂා කරන අතර, ගණුදෙනු කරුවන්ගේ පහසුව සහ කාර්යක්ෂම සේවාවක් ලබාදීමේ අරමුණින් අංග සම්පූර්ණ ග්‍රාමීය බැංකු ශාඛාවක් ලෙස නවීකරණය කිරීමට රුපියල් ලක්ෂ 15 ක් 2026 වර්ෂය වෙනුවෙන් වෙන්කර ඇත.

## viii. පාතගම ග්‍රාමීය බැංකුව

2015 වර්ෂයේ පාතගම මංසන්දියේ මෙම ශාඛාව ස්ථාපනය කරන ලදි. ඉන් පසුව 2023 වඩාත් සුවපහසු සහ පහසුකම් වලින් සමන්විත ගොඩනැගිල්ලක් වෙත ගෙන එන ලදි. කාර්යය මණ්ඩලයේ සහ ගණුදෙනුකරුවන්ගේ පහසුව උදෙසා වායුසමීකරණය කර ඇත. එක් රැකියා අවස්ථාවක් පමණක් ලබාදෙමින් ආරම්භ කරන ලද මෙම ශාඛාව මගින් වර්තමානය වන විට ස්ථිර රැකියා අවස්ථා දෙකක් ලබාදී ඇත. 1300 ඉක්මවූ ගණුදෙනුකරුවන් පිරිසකගේ තැන්පත් ආරක්ෂා කර දෙමින් ඉහළ පොලී ප්‍රතිශතයක් ලබාදීමට කටයුතු කර ඇත. රුපියල් මිලියන 42 ක ණය සහ උකස් අත්තිකාරම් ණය සදහා ආයෝජනය කර ඇත. 2026 වර්ෂය අවසන් වන විට තැන්පත් රුපියල් මිලියන 57 ණය රුපියල් මිලියන 28 උකස් අත්තිකාරම් රුපියල් මිලියන 17 ලබාදීමට සැලසුම් කර ඇත.

## ix. බටතොට ඉතුරුම් මධ්‍යස්ථානය

2023 වර්ෂයේ එරත්න ග්‍රාමීය බැංකුවට අනුබද්ධ ඉතුරුම් මධ්‍යස්ථානයක් ලෙස මෙය ආරම්භ කරන ලදි. එරත්න ග්‍රාමීය බැංකු කළමණාකරුගේ පාලනය යටතේ මෙය පැවති අතර, බටතොට මංසන්දියේ පිහිටුවා ඇත. බටතොට කේන්ද්‍රකර ගනිමින් අවට කුඩා ගම්මානවල ජීවත් වන නගරයට දුරින් ජීවත්වන අයගේ පහසුව සඳහා මෙම ඉතුරුම් මධ්‍යස්ථානය පිහිටුවිය. වර්තමානය වන විට 200 ට අධික තැන්පත්කරුවන් ඒකරාශී කරගැනීමට හැකියාව ලැබී ඇත. 2025 වර්ෂය වන විට ණය සහ උකස් අත්තිකාරම් ණය ලබාදීමට පටන්ගෙන ඇති අතර, එම ශාඛාව ලාභදායී මට්ටමක පවත්වාගෙන ඇත. 2026 වර්ෂය අවසන් වන විට තැන්පත් රුපියල් මිලියන 12 ණය රුපියල් මිලියන 6 උකස් අත්තිකාරම් රුපියල් මිලියන 3 ලබාදීමට කටයුතු සැලසුම් කර ඇත.

## x. කුරුවිට රන්සුරැකුම් උකස් මධ්‍යසථානය

කුරුවිට ප්‍රධාන නගර මධ්‍යයේ මෙම මධ්‍යස්ථානය පිහිටුවා ඇත. වඩාත් ආරක්ෂාකාරී, විශ්වාසනීය සේවාවක් ලබාදීම සඳහාත් හදිසි මුදල් අවශ්‍යතාවලදී අඩු පොලී ප්‍රතිශතයක් යටතේ ඉහළ අත්තිකාරමක් ලබාදීම මෙමගින් ඉටුවේ. 1100 කට අධික ගණුදෙනුකරුවන් පිරිසක් මෙම මධ්‍යස්ථානය වටා ඒකරාශී වී ඇත. ආරක්ෂිත කැමරා පද්ධති සවිකර ඇති අතර, මෙම රන් භාණ්ඩ සඳහා විශේෂ වූ උකස් රක්ෂණ අරමුදලක් පිහිටුවා ඇත. මහජන බැංකුවේ අධීක්ෂණය සහ නියාමනය යටතේ එම ආයතනයේ බලපත්‍ර ලාභියෙකු ලෙස කටයුතු කරයි.

2026 වර්ෂය අවසන් වන විට රුපියල් මිලියන 87 ක් උකස් අත්තිකාරම් ණය ලබාදීමට සැලසුම් කර ඇත.

## xi. පැරඩයිස් රන්සුරැකුම් උකස් මධ්‍යසථානය

පැරඩයිස් මංසන්ධියේ මෙම උකස් මධ්‍යස්ථානය පිහිටුවා ඇත. 1000 ට ආසන්න ගණුදෙනුකරුවන් පිරිසක් මෙම මධ්‍යස්ථානයේ සේවාව ලබාගනී. ප්‍රධාන පෙරේ ඇඟළුම් ආයතනයක් ඉලක්ක කර ආරම්භ කරන ලද මෙම මධ්‍යස්ථානය මේ වන විට ගම් කිහිපයක් පුරා ගණුදෙනුකරවන්ගේ හදිසි මුදල් අවශ්‍යතා කඩිනමින් ඉටුකර දීමට සමත් වවී ඇත. විශ්වාසනීය හා ආරක්ෂාකාරී සේවාවක් ලබාදෙන අතර පෞද්ගලිකත්වය ආරක්ෂා කරමින් වඩාත් සුහදශීලි සේවාවක් ඉටුකර දීමට වර්තමානය වන විට කටයුතු කර ඇත. මහජන බැංකුවේ අධීක්ෂණය සහ නියාමනය යටතේ කටයුතු කරන අතර, මහජන බැංකුවේ බලපත්‍ර ලාභියෙකු ලෙස කටයුතු කරයි. 2026 වර්ෂය අවසාන් වන විට රුපියල් මිලියන 45 ක් උකස් ණය අත්තිකාරම් වශයෙන් ලබාදීමට සැලැසුම් සකස් කර ඇත.

### 2024- 2025 වර්ෂයේ කාර්යය සාධනය

| | 2024 .12.31 | 2025.10.31 |
|---|---|---|
| තැන්පත් වටිනාකම | රු. මි. 1476 | රු. මි. 1633 |
| උකස් අත්තිකාරම් වටිනාකම | රු. මි. 394 | රු. මි. 483 |
| ණය වටිනාකම | රු. මි. 632 | රු. මි. 649 |
| ලාභය | රු. මි. 154 | රු. මි. 100 |

2024 හා 2025 වර්ෂවල ඉහත තොරතුරු පදනම් කරගනිමින් 2026 වර්ෂයේ පහත ඉලක්ක සපුරාගැනීමට අපේක්ෂිතය.

### 2026 වර්ෂයේ ඉලක්ක

| | |
|---|---|
| තැන්පත් වටිනාකම | රු. මි. 1850 |
| උකස් අත්තිකාරම් වටිනාකම | රු. මි. 555 |
| ණය වටිනාකම | රු. මි. 925 |
| ආයෝජන වටිනාකම | රු. මි. 1708 |
| ලාභය | රු. මි. 131 |

## 4.3.1 2026 වර්ෂයේ ග්‍රාමීය බැංකු අංශයේ ව්‍යාපාරික ඉලක්ක

### 2025 වර්ෂයේ ව්‍යාපාරික නිත්‍ය හා 2026 වර්ෂයේ ඉලක්ක

| වර්ෂය | තැන්පත් රු. මි | ණය රු. මි | උකස් ණය රු. මි | ආයෝජන රු. මි | ලාභය රු. මි |
|---|---|---|---|---|---|
| 2022 | 1267 | 623 | 417 | 825 | 66 |
| 2023 | 1343 | 601 | 398 | 934 | 80 |
| 2024 | 1476 | 632 | 394 | 1212 | විගණනයට පෙර 154 |
| 2025.07.31 | 1586 | 631 | 448 | 1338 | 63 |
| 2026 | 1850 | 925 | 555 | 1708 | 131 |

**තැන්පත් වර්ධනය**




ග්‍රාමීය බැංකු අංශයේ සමස්ත තැන්පත් ප්‍රමාණය 2025 ජූලි මාසය වන විට රුපියල් මිලියන 1586 ක් වන අතර, 2025 වර්ෂය අවසානයේදී රුපියල් මිලියන 1709 දක්වා වර්ධනය කරගැනීමට කටයුතු කරමින් පවතී. 2026 වර්ෂය තුළදී රුපියල් මිලියන 141 ක තැන්පත් වර්ධනයක් අපේක්ෂා කරන අතර, වර්ෂය අවසානයේදී මුළු තැන්පත් ප්‍රමාණය රුපියල් මිලියන 1850 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. ඒ අනුව, වර්ෂය තුළ ශුද්ධ තැන්පත් වර්ධනය පහත සඳහන් පරිදිය.

| | | | | |
|---|---|---|---|---|
| i. | සාමාජික තැන්පත් | - | රුපියල් මිලියන | 80 |
| ii. | ළමා තැන්පත් | - | රුපියල් මිලියන | 21 |
| iii. | ස්ථාවර තැන්පත් | - | රුපියල් මිලියන | 40 |
| | **එකතුව** | **-** | **රුපියල් මිලියන** | **141** |

**සාමාජික ණය පහසුකම් ප්‍රවර්ධනය**

2025 වර්ෂයේ ජූලි මස අවසානය වන විට රුපියල් මිලියන 631 ක ණය පහසුකම් සාමාජික ප්‍රජාව වෙත ලබාදී ඇති අතර, 2025 වර්ෂය තුලදී රුපියල් මිලියන 690 ක් දක්වා ණය පහසුකම් වර්ධනය වේ යැයි අපේක්ෂා කෙරේ. ඒ අනුව 2026 වර්ෂය තුළදී රු. මිලියන 925 ක් දක්වා ණය පහසුකම් වර්ධනය කරගැනීමට අපේක්ෂා කරන අතර, ඒ සඳහා ණය වර්ග 9 ක් යටතේ පහත පරිදි රුපියල් මිලියන 235 ක් ආයෝජනය කරනු ඇත.

| | | | | |
|---|---|---|---|---|
| 1. | නිවාස හා ඉදිකිරීම් ණය, | - | රුපියල් මිලියන | 40 |
| 2. | දේපළ ණය, | - | රුපියල් මිලියන | 50 |
| 3. | රථවාහන ණය, | - | රුපියල් මිලියන | 50 |
| 4. | ස්වයංරැකියා ණය, | - | රුපියල් මිලියන | 10 |
| 5. | කෘෂිකාර්මික ණය, | - | රුපියල් මිලියන | 20 |
| 6. | ක්ෂණික ණය, | - | රුපියල් මිලියන | 10 |
| 7. | කෙටිකාලීන ණය, | - | රුපියල් මිලියන | 10 |
| 8. | සේවක ණය | - | රුපියල් මිලියන | 10 |
| 9. | රාජ්‍ය සේවක ණය | - | රුපියල් මිලියන | 10 |
| 10. | ව්‍යවසායකත්ව අංශය | - | රුපියල් මිලියන | 15 |
| 11. | සමිතියේ ව්‍යාපෘති ණය | - | රුපියල් මිලියන | 10 |
| | | **-** | **රුපියල් මිලියන** | **235** |

**උකස් ණය ආයෝජනය**

2025 ජූලි මාසය වන විට රන් සුරැකුම් ණය සඳහා රුපියල් මිලියන 448 ක් ආයෝජනය කර ඇත. මේ අනුව 2026.12.31 වන විට රන්සුරැකුම් ණය සඳහා ආයෝජනය කිරීමට අපේක්ෂිත මුළු මුදල රුපියල් මිලියන 555 කි.

### බාහිර බැංකු සහ මූල්‍ය ආයතනවල ආයෝජනය

2025 ජුලි මාසය වන විට ස්ථාවර/ඉතිරි කිරීමේ තැන්පත්වල අප විසින් ආයෝජනය කර ඇති මුදල රුපියල් මිලියන 1338 කි. 2026.12.31 වන විට මීට අමතරව තවත් මිලියන 370 කින් ආයෝජනය වර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.

## 4.3.2. 2026 ග්‍රාමීය බැංකු අංශයේ යෝජිත සංවර්ධන ක්‍රියාකාරකම්

**ග්‍රාමීය බැංකු අංශය සඳහා අවශ්‍යතාවය මත උපකරණ ලබාගැනීම**

1. ග්‍රාමීය බැංකු අංශයේ ක්‍රියාකාරිත්වය මත කාලීනව අවශ්‍ය වන උපකරණ අවශ්‍යතා සම්පූර්ණ කරගැනීම සඳහා ග්‍රාමීය බැංකු අංශයේ අතිරික්තයෙන් මුදල් වැය කර සිදුකිරීමට යෝජිතය.
ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 3 කි.

**ග්‍රාමීය බැංකු සඳහා වායුසමීකරණ පහසුකම් ලබාගැනීම**

2. එරත්න, තෙප්පනාව, කරපිංචවත්ත, පැරඩයිස්වත්ත ග්‍රාමීය බැංකු සඳහා වායුසමීකරණ පහසුකම් ලබාදීමට යෝජිත වේ.
ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 4 කි.

**ග්‍රාමීය බැංකු සඳහා ජෙනරේටර් ලබාගැනීම**

3. එරත්න, පණුකැරුපිටිය, පැරඩයිස්වත්ත, තෙප්පනාව යන ග්‍රාමීය බැංකු සඳහා පොදු විදුලි සැපයුම් අක්‍රිය වන අවස්ථාවන්හිදී ගණුදෙනු පවත්වාගෙන යාමට අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා ජෙනරේටර් යන්ත්‍ර 4 ක් ලබාගැනීමට යෝජිතය.
ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 5 කි.

**ග්‍රාමීය බැංකුවල අභ්‍යන්තර පරිශ්‍ර නවීකරණය කිරීම**

පණුකැරැපිටිය, එරත්න, කුරුවිට, කරපිංචවත්ත, පැරඩයිස්වත්ත, දෙවිපහළ, තෙප්පනාව යන ග්‍රාමීය බැංකු කාලීනව ගැලපෙන පරිදි අභ්‍යන්තර හා බාහිර පරිශ්‍ර නවීකරණ කටයුතු සිදුකිරීමට යෝජිතය.







ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 15 කි.

## නිවාස ව්‍යාපෘතිය සඳහා ආයෝජනය

**4.** වර්තමාන මූල්‍ය වෙළඳපල සැලකිල්ලට ගැනිමේදි ග්‍රාමීය බැංකු අංශයේ ස්ථාවර තැන්පත් ආයෝජනය සඳහා ලැබෙන පොලි අනුපාතය පහළයාම හේතුවෙන් පොලි ආදායම ඉතා විශාල වශයෙන් අඩුවිම නිසා විකල්ප ආදායම් මාර්ග සඳහා ග්‍රාමීය බැංකු අතිරික්තය ආයෝජනය කිරිම කාලින අවශ්‍යතාවයක් වේ. එම නිසා ග්‍රාමීය බැංකු අංශයෙන් ක්‍රියාත්මක කරන නව ව්‍යාපෘතියක් ලෙස ඉඩම් මිළදි ගෙන නිවාස හෝ නිවාස ව්‍යාපෘති ආරම්භ කර සහනදායි ගෙවීමේ පදනම මත හෝ අත්පිට මුදලට පාරිභෝගික ජනතාවට ලබාදිම සඳහා යෝජිත වේ.



ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 35 කි.

### 4.3.3 ගණුදෙනු ප්‍රවර්ධනය සඳහා යෝජිත උපාය මාර්ග

**ග්‍රාමීය බැංකු තැන්පත් වර්ධනය**

| අරමුණ<br>තැන්පත් වර්ධනය | උපක්‍රම හා සැලසුම් | ක්‍රියාකාරකම | අපේක්ෂිත පිරිවැය |
|---|---|---|---|
| 2025.07.31 දිනට පවතින රු. මිලියන 1586 ක් වන තැන්පත් 2025 වර්ෂය අවසානය වන විට රුපියල් මිලියන 1709 ක් දක්වා වර්ධනය කරගනු ඇත. ඒ අනුව 2026 වර්ෂ තුළ 1850 දක්වා වර්ධනය කිරීමට සැලසුම් කර ඇත. එම ඉලක්කය සපුරාගැනීම සඳහා රුපියල් මිලියන 141 ක් තැන්පත් රැස්කළ යුතුය. | 1. බැංකු සේවාවන් නොලැබුණු පිරිස් වෙත නව ගිණුම් ආරම්භ කිරීම.<br>✶ අපේක්ෂිත ඉලක්කය තැන්පත් මිලියන 15 කි.<br>ස්ථාවර තැන්පත් රු. මි. - 10<br>සාමාජික ගිණුම් රු. මි. - 02<br>ළමා ගිණුම් රු. මි. - 01<br>ජ්‍යේෂ්ඨ පුරවැසි ගිණුම් රු. මි.- 01<br>කාන්තා ගිණුම් - 01 | 1. ගෙන්ගෙට ගොස් තැන්පත් රැස්කිරීම.<br>2. ප්‍රදේශයේ ව්‍යාපාරික ප්‍රජාව හමුවී තැන්පත් රැස්කිරීම.<br>3. ස්වයංරැකියා වැඩසටහන් යටතේ ගිණුම් ආරම්භ කර තැන්පත් රැස්කිරීම.<br>4. ස්ථාවර තැන්පත් සඳහා වැඩි පොලී ප්‍රතිශතයක් ලබාදීම.<br>5. පාසල්, පෙර පාසල්, සායන, ඉලක්ක කර තැන්පත් වර්ධනය කිරීම.<br>6. තරුණ කණ්ඩායම් ඉලක්ක කර නව තාක්ෂණික ක්‍රම හඳුන්වා දෙමින් තැන්පත් රැස්කර ගැනිම. | රු. 150000/= |
| | 2. ජනවාරි මුල් සතිය තුළ තැන්පත් රැස්කිරිම.<br>✶ අපේක්ෂිත තැන්පත් මිලියන 10 කි. | **1.** ළමා තැන්පත් ඉලක්ක කරගනිමින් තැන්පත් රැස්කිරීම.<br>**2.** ස්ථාවර තැන්පත් වැඩි පොලී ප්‍රතිශත යටතේ ලබාගැනීම.<br>**3.** පොදු ගිණුම් දැනුවත් කර ඉලක්ක සපුරා ගැනිම. | රු. 100000/= |

| අරමුණ | උපක්‍රම හා සැලසුම් | ක්‍රියාකාරකම | අපේක්ෂිත පිරිවැය |
|---|---|---|---|
| | 3. සිංහල හා හින්දු අලුත් අවුරුද්ද ඉලක්ක කරගනිමින් තැන්පත් වර්ධනය කරගැනීම.<br>✶ අපේක්ෂිත ඉලක්කය තැන්පත් මිලියන 100 කි. | 1. ගෙන් ගෙට ගොස් ආරාධනා පත්‍ර බෙදීම.<br>2. පෝස්ටර්, අත්පත්‍රිකා බෙදාහැරීම.<br>3. ත්‍යාග පිරිනැමීම.<br>4. හඳුනාගත් ව්‍යාපාරික ප්‍රජාව හමුවීම.<br>5. සේවකයන් අභිප්‍රේරණය කිරීම.<br>6. වැඩි පොලී ප්‍රතිශතයක් යටතේ තන්පත් රැස්කිරීම පිළිබඳ ප්‍රචාරණය ලබාදීමග | රු. 1000000/= |
| | 4. පෙර පාසල් හා පාසල් ඉතුරුම් තැන්පත් රැස්කිරීම.<br>✶ අපේක්ෂිත තැන්පත් මිලියන 5 කි. | **1.** පාසල් පෙර පාසල් ඉලක්ක කර ඉතුරුම් තැන්පත් සේවාව ක්‍රියාත්මක කිරීම.<br>**2.** දෙමව්පියන් දිරිමත් කිරීම සහ තිළිණ ලබාදීමග<br>**3.** ශිෂ්‍යත්ව තිළිණ ලබාදීම.<br>**4.** පාසල් ව්‍යාපෘති සඳහා සහාය, ආධාර ලබාදීම.<br>**5.** ළමා දින ඉලක්ක කර ගනිමින් වැඩසටහන් නිර්මාණය කිරීම.<br>**6.** ඉතිරි කිරීමේ හොඳ පුරුදු ළමා කල සිටම පුරුදු කිරීමට විවිධ වැඩසටහන් හඳුන්වාදීම. | රු. 50000/= |

| අරමුණ | උපක්‍රම හා සැලසුම් | ක්‍රියාකාරකම | අපේක්ෂිත පිරිවැය |
|---|---|---|---|
| **තැන්පත් වර්ධනය** | | | |
| | 5. කාන්තා සුපර්ලේඩි ගිණුම් ප්‍රවර්ධනය. අපේක්ෂිත තැන්පත් මිලියන 5 කි. | 1. එක් ශාඛාවකින් වසරකට වරක් තැන්පත් පදනම් කරගනිමින් සුපර්ලේඩි ජයග්‍රාහකයින් 2 ක් බැගින් 18 දෙනෙකු සඳහා තෝරා රු. 5000 /= ක් වටිනා පාරිභෝගික භාණ්ඩ ලබාදීම.<br>2. තාක්ෂණික දියුණුව සහිත වැඩසටහන් හඳුන්වාදීම.<br>3. ඉතිරි කිරීම සහ සකසුරුවම්කම පුහුණු කිරීම.<br>4. විශේෂිත කාන්තා හා තරුණ ව්‍යාපාර සඳහා උපායමාර්ග හඳුන්වාදීම.<br>5. කාර්යක්ෂමභාවය හා වෘත්තීය සංවර්ධන වැඩසටහන් හඳුන්වාදීම. | රු. 90000/= |
| | 6. ප්‍රදේශයේ ස්වේච්ඡා හා පොදු ගිණුම් ප්‍රවර්ධනය කිරීම.<br>• අපේක්ෂිත තැන්පත් මිලියන 3 කි. | 6. ඉහළ පොලී ප්‍රතිශතයක් යටතේ ස්ථාවර තැන්පත් ලබාගැනීම.<br>7. පොදු සමිති නිළධාරීන් දැනුවත් කිරීම. | |

| | | | |
|---|---|---|---|
| | | 8. ආධාර, තිළිණ ලබාදීම.<br>9. පාරිසරික ව්‍යාපෘති සඳහා පුහුණු වැඩසටහන් ලබාදීම. | රු. 30000/= |
| | 7. දෛනික තැන්පත් ගිණුම් ප්‍රවර්ධනය කිරීම<br>• අපේක්ෂිත තැන්පත් මිලියන 2 කි. | 1. නව තාක්ෂණික වැඩසටහන් මගින් තැන්පත් රැස්කිරීම.<br>2. ව්‍යාපාරික ප්‍රජාව කරා ගොස් තැන්පත් රැස්කිරීම.<br>3. එම තැන්පත් කරුවන්ට අවශ්‍ය පහසුකම් ව්‍යාපාරික ස්ථානවලට ලබාදීම.<br>4. හඳුනාගත් තැන්පත් කරුවන් සඳහා විශේෂ තිළිණ ලබාදීම.<br>5. අඩු පොලී ප්‍රතිශතයක් යටතේ තාක්ෂණික ණය ලබාදීම.<br>6. මාසිකව පොලී බැරකර දීම. | රු. 20000/= |
| | 8. විදේශ මුදල් හුවමාරුව ප්‍රවර්ධනය කිරීම.<br>• අපේක්ෂිත තැන්පත් මිලියන 1 කි. | 1. පුළුල් ප්‍රචාරයක් ලබාදීම<br>2. තිළිණ ලබාදීම.<br>3. කඩිනම් සේවාවක් ලබාදීම.<br>4. නව තාක්ෂණික ක්‍රම මගින් ගණුදෙනු පහසුකම් සලසා දීම.<br>5. එම ගණුදෙනුකරුවන්ගේ දරුවන් සඳහා විශේෂ වැඩසටහන් හා තිළිණ ලබාදීම. | රු. 10000/= |

### 4.3.4 ග්‍රාමීය බැංකු ණය හා උකස් ප්‍රවර්ධනය

| සංයුක්ත අරමුණ | උපක්‍රම හා සැලැස්ම | ඉලක්ක ප්‍රධානිත ණය මුදල |
|---|---|---|
| 2025.07.31 වන දිනට රුපියල් මිලියන 631 ක ණය පහසුකම් සාමාජික ප්‍රජාව වෙත ලබා දී ඇත. 2025 වර්ෂය අවසන් වන විට රුපියල් මිලියන 690 ක් දක්වා එය වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2026 වර්ෂය අවසන්වන විට රුපියල් මිලියන 925 දක්වා ණය පහසුකම් ලබාදීමට ඉලක්ක කර ඇත. ඒ අනුව 2026 වර්ෂ තුලදී ණය වර්ග 9 යටතේ රුපියල් මිලියන 235 ක් ආයෝජනය කිරීමට අපේක්ෂිතය. (රුපියල් මිලියන 690 ක් වන ණය ආයෝජනය නැවත ආයෝජනයට අමතරව) | 1 පුද්ගලික ණය – (පුද්ගල ඇප මත ණය)<br>උපරිම ණය සීමාව රු. 1000000/= යටතේ රුපියල් මිලියන 100<br>පොලි ප්‍රතිශතය 14%<br>1.1 නිවාස ණය<br>1.2 කෙටිකාලින ණය<br>1.3 කෘෂිකාර්මික ණය<br>1.4 ක්ෂණික ණය<br>1.5 ස්වයංරැකියා<br>1.6 රාජ්‍ය සේවක ණය | <br><br><br>රුපියල් මිලියන 40<br>රුපියල් මිලියන 10<br>රුපියල් මිලියන 20<br>රුපියල් මිලියන 10<br>රුපියල් මිලියන 10<br>රුපියල් මිලියන 10 |
| | 2. රථවාහන ණය උපරිම ණය සීමාව රු. 5000000/= යටතේ රුපියල් මිලියන 50<br>2.1 ලියාපදිංචි කළ 15%<br>2.2 ලියාපදිංචි නොකළ 14% | <br>රුපියල් මිලියන 25<br>රුපියල් මිලියන 25 |
| | 3. දේපළ ණය උපරිම ණය සීමාව රු. 5000000/= යටතේ රුපියල් මිලියන 50<br>3.1 දේපල ඇප ණය 14%<br>3.2 නව ඉඩම් මිලදී ගැනීම 15% | <br>රුපියල් මිලියන 25<br>රුපියල් මිලියන 25 |

| සංයුක්ත අරමුණ | උපක්‍රම හා සැලැස්ම | ක්‍රියාකාරකම් |
|---|---|---|
| | 4. සේවක ණය - පොලි ප්‍රතිශතය 5%<br>උපරිම ණය සීමාව රු. 1000000/= යටතේ රුපියල් මිලියන 10 | රුපියල් මිලියන 10 |
| | 5. සමිතියේ ව්‍යාපෘති සඳහා ණය | රුපියල් මිලියන 10 |
| | 6. ව්‍යවසායකත්ව අංශය සඳහා ණය | රුපියල් මිලියන 15 |
| **උකස් ණය ආයෝජනය**<br>2023 ජුලි මස වන විට රන් සුරැකුම් උකස් ණය සඳහා රු. මි. 448 ආයෝජනය කර ඇත. 2025 වර්ෂය අවසාන වන විට රුපියල් මිලියන 490 ක් උකස් ආයෝජන වර්ධනය වේ යැයි අපේක්ෂා කෙරේ. 2026 වසර අවසාන වන විට එය රුපියල් මිලියන 555 දක්වා වර්ධනය කර ගැනීමට ඉලක්ක කර ඇත.<br>ඒ අනුව එම වර්ෂය වන විට රුපියල් මිලියන 65 උකස් ණය සඳහා ආයෝජනය කිරීමට අපේක්ෂිතය. (රුපියල් මිලියන 490 ක් වන උකස් ආයෝජනය නැවත ආයෝජනයට අමතරව) | සාමාජික උකස් - රුපියල් මිලියන 60<br>පොලි ප්‍රතිශතය -13%<br>සාමාජික නොවන උකස් - රුපියල් මිලියන 5<br>පොලි ප්‍රතිශතය -14% | 1. උකස් අත්තිකාරම් වැඩි කිරීම.<br>2. උකස් පොලි ප්‍රතිශතය අඩුකිරීම.<br>3. නවීන තාක්ෂණික උපකරණ භාවිතා කර කඩිනම් සේවාවන් ලබාදීම.<br>4. දෛනිකව රන් භාණ්ඩ බේරාදීම.<br>5. පූර්ණ විශ්වාසය හා ආරක්ෂාව ඇති කිරීම.<br>6. රක්ෂණාවරණයක් ලබාදීම.<br>කොටස් වශයෙන් ගෙවීමේ පහසුකම් ලබාදීම. |

| සංයුක්ත අරමුණ | උපක්‍රම හා සැලැස්ම | ක්‍රියාකාරකම් |
|---|---|---|
| 2026.12.31 දිනට කල්පසු ණය ප්‍රතිශතය 5% මට්ටමක පවත්වාගැනීම. | • ණය නිකුත් කිරීමේ උපරිම හා අවම සීමා පිළිපැදීම.<br>• ප්‍රවේශමෙන් ණය නිකුත් කිරීම. (ගෙවීමේ හැකියාව, පෙර ගෙවීමේ ශක්‍යතාවය)<br>• පෙර විපරම් සිදුකිරීම මගින් ණයකරුවන් හඳුනාගෙන කළමණාකරුවන්ගේ නිර්දේශ මත පමණක් ණය නිදහස් කිරීම.<br>• ආදායමට ගැලපෙන වාරික හඳුන්වාදීම.<br>• CRIB DATA මත පදනම්ව ණය ග්‍රාහකයින්ව තක්සෙරු කර ණය ලබාදීමජ<br>• කළමණාකරුවන් හා ක්ෂේත්‍ර නිළධාරීන් සඳහා ගුණාත්කමක ණයකරුවන් හඳුනාගැනීම වෙනුවෙන් විශේෂ පුහුණුවීම් ලබාදීම.<br>• පුහුණු මූල්‍ය නිළධාරීන් සම්බන්ධ කරගැනීම. | 1. වාරික ඉකුත්වීමට පෙර ලිපි, SMS, දුරකතන ඇමතුමු මගින් දැනුවත් කිරිම.<br>2. කෙටි නීති ක්‍රමවේදයන් අනුගමනය කිරීම.<br>3. ලිඛිත අවවාද, නීති සංශෝධිත සටහන් සහ විනිශ්වය මගින් පානය කරගැනීම.<br>4. ණය වාරික අඩුකිරිම හෝ පොලී සහන ලබාදීම.<br>5. කාලය දීර්ඝකර දීම.<br>6. නියමිත දිනට වාරික ගෙවීමේ වැදගත්කම හා වාසි අවබෝධකර දීම.<br>. |
| ග්‍රාමීය බැංකු අංශයේ තෙවන පාර්ශවයේ බැංකු කටයුතු වර්ධනය කිරීම. | 6.1 විදුලිබිල්පත්, ජල බිල්පත් හා දුරකතන බිල්පත් ලබාගැනීම.<br>ගොවි විශ්‍රාම වැටුප් | එම අංශවලට අයත් බාහිර ආයතන හා එක්ව ප්‍රචාරණ කටයුතු පුළුල් කිරීම. |

## 4.4. වෙළඳ අංශය

### 1. වෙළඳ අංශයේ සේවා ඒකක

**1. පාරිභෝගික අංශය**

- i. තොග ගබඩා - 1
- ii. කෝප්සිටිය - 1
- iii. ප්‍රාදේශික - 30 (මේ වන විට ප්‍රාදේශික 19 ක් ක්‍රියාත්මක පවතී)
- iv. විශේෂ අලෙවිහල් - 1

**2. ඉන්ධනහල අංශය**

**3. නියෝජිත අලෙවි සේවා අංශය**

- i. සමුපන නියෝජිත තැපැල්හල අංශය
- ii. මංචි අලෙවි නියෝජිත අංශය
- iii. යුනිලිවර් අලෙවි නියෝජිත අංශය

මේ වන විට වෙළඳ අංශය වාණිජ කළමණාකරුගේ අධීක්ෂණය යටතේ කාර්යය මණ්ඩලය 72 දෙනෙකුගෙන් සමන්විතව ක්‍රියාත්මක වන අතර, ඉදිරියේදී මේ වන විට ක්‍රියාත්මක නොවන ප්‍රාදේශික වෙළඳසැල් 11 අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක කිරීමට යෝජිත වේ. අපගේ ප්‍රාදේශික සමිතියේ ග්‍රාමීය කේන්ද්‍රස්ථානය බවට පත්කිරීම ප්‍රමුඛ අරමුණ ලෙස සැළකිල්ලට ගනිමින් ප්‍රාදේශික 30 ම ආශ්‍රිතව විධිමත් සංවර්ධන වැඩසටහන් ඉදිරියේදී ක්‍රියාත්මක කෙරෙනු ඇත.

### 1. <u>පාරිභෝගික අංශය</u>

#### i. <u>තොග ගබඩා</u>

මේ වන විට සමිතිය සතුව තොග ගබඩා 1 ක් පවත්වාගෙන යනු ලබන අතර, 2025 ඔක්තෝබර් මාසයේ රුපියල් මිලියන 22.5 ට අධික පිරිවැටුමක් (බාහිර වෙළඳාම රුපියල් මිලියන 9.6 ක් සහ අභ්‍යන්තර වෙළඳාම රුපියල් මිලියන 12.9 කි.) අත්කර ගැනීමට සමත් වී ඇත. 2025 වර්ෂය ආරම්භයේදී ඉතා දුර්වල තත්ත්වයක පැවති තොග ගබඩාව මේ වන විට සාර්ථක වර්ධනයක් අත්කර ගැනීමට සමත් වී ඇති අතර, ඉදිරියේදී එම වර්ධනය වඩාත් තීව්‍ර කිරීමට සැලසුම් සකස් කර ඇත.

**තොග ගබඩා අංශයේ ආසන්න වර්ෂ 4 ක විකුණුම් සහ ශුද්ධ ලාභය - රුපියල් මිලියන වලින්**

| | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|
| විකුණුම් | 74 | 170 | 154 | 97 |
| ලාභය | 0.87 | 3.99 | (0.67) | (1.47) |

**තොග ගබඩා අංශයේ ආසන්න වර්ෂ 4 ක විකුණුම් සහ ශුද්ධ ලාභය - රුපියල් මිලියන වලින්**



**2025 වර්ෂයේ ජනවාරි සිට ඔක්තෝබර් මස දක්වා තොග ගබඩා අංශයේ විකුණුම් සහ ශුද්ධ ලාභය - රුපියල් මිලියන වලින්**

| 2025 | ජනවා. | පෙබර | මාර්තු | අප්‍රේල් | මැයි | ජුනි | ජුලි | අගෝ. | සැප්තැ | ඔක්තෝ |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| විකුණුම් | 8.35 | 7.08 | 7.42 | 5.35 | 6.64 | 8.86 | 16.22 | 19.97 | 19.42 | 22.52 |
| ලාභය | (0.20) | (0.16) | 0.06 | 0.1 | (0.38) | (0.21) | (0.14) | (0.02) | 0.15 | 0.06 |




2026 වර්ෂයේදී ගබඩාව විසින් සිදුකිරිමට යෝජිත වාර්ෂික වෙළඳ ඉලක්කය රුපියල් මිලියන 640 කි. එහිදී ප්‍රාදේශික සැපයුම් රුපියල් මිලියන 460 ක් වශයෙන් ඇස්තමේන්තු කර ඇති අතර, බාහිර තොග වෙළඳාම රුපියල් මිලියන 180 ක් අපේක්ෂා කෙරේ.

ඉහත වෙළඳ ඉලක්ක සපුරා ගැනිම සඳහා 2026 වර්ෂය තුලදී නව සංවර්ධන ක්‍රියාකාරකම් රාශියක් සැලසුම් කර ඇත.

1. මේ වන විට ජංගම වෙළඳාම මාර්ග 4 ක් (දෙවිපහළ, සිරිපාගම, පරකඩුව, එරත්න) ආවරණය කරමින් ක්‍රියාත්මක කරන අතර, නව මාර්ග 2 ක් ආශ්‍රිතව වෙළඳ කටයුතු පුළුල් කිරිමට කටයුතු යොදා ඇත.
2. ප්‍රදේශයේ රාජ්‍ය ආයතන සඳහා සෘජු සැපයුම් අවස්ථාවන් විවෘත කරගැනීම.
3. ගබඩා පරිශ්‍රය නවීකරණය.
4. Coop Kuruwita සහල් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.






*තොග ගබඩා අංශයේ ආදායම් වියදම් ඇස්තමේන්තුව ඇමුණුම් අංක 2*

## ii <u>කෝප්සිටි</u>

මේ වන විට කුරුවිට කෝප්සිටිය මගින් වාර්ෂිකව රුපියල් මිලියන 120 ක පමණ වෙළඳ පිරිවැටුමක් ලබාගන්නා අතර එම පිරිවැටුම 2026 වර්ෂයේදී රුපියල් මිලියන 240 දක්වා වර්ධනය කරගැනීමට සහ නව කෝප්සිටි 3 ක් ස්ථාපනය කිරීම මගින් වෙළඳ පිරිවැටුම රුපියල් මිලියන 180 කින් වර්ධනය කිරීමට අපේක්ෂා කරන අතර, ඒ අනුව මුළු පිරිවැටුම රුපියල් මිලියන 420 ක් වේ.

1. වර්තමානයේදි කුරුවිට නගරය ආශ්‍රිතව කොප්සිටි වෙළඳසැලක් ක්‍රියාත්මක වන අතර 2026 වර්ෂයේදි කුරුවිට, බටුගේන, හිග්ගස්හේන සහ පැරඩයිස් ආශ්‍රිතව නව කෝප්සිටි වෙළඳසැල් 4 ක් ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ.

ඒ සඳහා අපේක්ෂිත දළ ඇස්තමේන්තුව – රුපියල් මිලියන 32

2. කුරුවිට කෝප්සිටි වෙළඳසැලෙහි අවශ්‍යතාවය පරිදි ඉඩකඩ පුළුල් කිරීම සඳහා වර්ග අඩි 300 ක පමණ ප්‍රමාණයක කොටසක් එකතු කිරීම මගින් එළවළු, පළතුරු සහ මස් මාළු වෙළඳාම ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.

මේ සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 4 කි.

3. Hello Coop, වැඩසහටන මගින් නිවසටම භාණ්ඩ ලබාදිම.

4. Loyalty Customer සේවාව හඳුන්වාදිම. (විශ්වාසවත් පාරිභෝගික සේවාව)

*කෝප්සිටි අංශයේ ආදායම් වියදම් ඇස්තමේන්තුව – ඇමුණුම් අංක 3*

## iii ප්‍රාදේශික වෙළඳසැල්

මේ වන විට ප්‍රාදේශික 20 ක් ක්‍රියාත්මකව පවතින අතර, ඉතිරි ප්‍රාදේශික 11 ද ක්‍රියාත්මක කරමින් ප්‍රාදේශික මුළු වෙළඳ පිරිවැටුම රුපියල් මිලියන 450 දක්වා පුළුල් කිරීමට අපේක්ෂිතය.

මේ වන විට ක්‍රියාත්මකව පවතින ප්‍රාදේශික

| | | | |
|---|---|---|---|
| 1 | කුරුවිට ප්‍රාදේශිකය | 11 | තෙප්පනාව ඉහළගම ප්‍රාදේශිකය |
| 2 | තෙප්පනාව මැදගම ප්‍රාදේශිකය | 12 | දෙල්ගමුව ප්‍රාදේශිකය |
| 3 | එක්නැලිගොඩ ප්‍රාදේශිකය | 13 | කාහේන්ගම ප්‍රාදේශිකය |
| 4 | ලස්සකන්ද ප්‍රාදේශිකය | 14 | පැරඩයිස්වත්ත ප්‍රාදේශිකය |
| 5 | එරත්න ප්‍රාදේශිකය | 15 | කරපිංචවත්ත ප්‍රාදේශිකය |
| 6 | ගෝනපිටිය ප්‍රාදේශිකය | 16 | නඩුකාරදෙනිය ප්‍රාදේශිකය |
| 7 | වළඳුර ප්‍රාදේශිකය | 17 | මුරුත්තෙට්ටුකන්ද ප්‍රාදේශිකය |
| 8 | දෙවිපහල ප්‍රාදේශිකය | 18 | බටතොට ප්‍රාදේශිකය |
| 9 | තෙප්පනාව පහළගම ප්‍රාදේශිකය | 19 | විතාරම්පංගුව ප්‍රාදේශිකය |
| 10 | පණුකැරැපිටිය ප්‍රාදේශිකය | 20 | කළුකැලේ ප්‍රාදේශිකය |

.

*ප්‍රාදේශික අංශයේ ආදායම් වියදම් ඇස්තමේන්තුව – ඇමුණුම් අංක 4*

1. ඉහත මේ වන විට පවත්වාගෙන යන ප්‍රාදේශික සංවර්ධනය සඳහා පහත යෝජනා ඉදිරිපත් කෙරේ.

**4. ලස්සකන්ද ප්‍රාදේශිකය**

සමිතිය සතු ප්‍රාදේශික ගොඩනැගිල්ල පසුගිය කාලය තුල බාහිර පාර්ශවය සඳහා බදුපදනම මත ලබාදී ඇති බැවින් ව්‍යාපාරික වශයෙන් වඩාත් යෝග්‍ය ලස්සකන්ද මංසන්ධියේ බදුපදනම මත ලබාගත් ගොඩනැගිල්ලක වෙළඳසැල ස්ථාපනය කර මේ වන විට සාර්ථකව පවත්වාගෙන යනු ලැබේ. ඒ ආසන්නයේම ඇති රජයේ ඉඩම් කොටසක් ලබාගැනිම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් ඇති අතර, 2026 වර්ෂයේදි වෙළඳසැලක් ඉදිකිරීමට අපෙක්ෂා කෙරේ.

මේ සඳහා දළ ඇස්තමේන්තුව රුපියල් ලක්ෂ 50 කි.

**7. වළදුර ප්‍රාදේශික වෙළඳසැල**

දැනට බදු පදනම මත ලබාගත් ගොඩනැගිල්ලේ පවත්වාගෙන යන ප්‍රාදේශිකය ව්‍යාපාරික වශයෙන් වඩාත් සුදුසු ස්ථානයක ස්ථාපනය කිරිම සඳහා සාකච්ජා කරමින් පවතින අතර 2026 වර්ෂය තුළ නව වෙළඳසැල ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ.

මේ සඳහා දළ ඇස්තමේන්තුව රුපියල් ලක්ෂ 50 කි.

**15. කරපිංචවත්ත ප්‍රාදේශික වෙළඳසැල**

කරපිංචවත්ත ප්‍රාදේශික වෙළඳසැලට අනුබද්ධව සන්නිවේදන පියසක් ඉදිකිරීම සඳහා කටයුතු කෙරෙනු ඇත. මෙම කටයුතු 2026 වර්ෂයේ මුල් කාර්තුවේදි අවසන් කෙරේ.

මේ සඳහා දළ ඇස්තමේන්තුව රුපියල් ලක්ෂ 35 කි.

**18. බටතොට ප්‍රාදේශික වෙළඳසැල**

පැරණි වෙළඳසැල පැවති ස්ථානයේ ව්‍යාපාරික වශයෙන් ඵලදායි නොවන බවට නිරීක්ෂණය වන බැවින් භූමිය වෙනත් කටයුත්තක් සඳහා යොදාගැනීමට හෝ අලෙවි කිරීමට බලාපොරොත්තු වන අතර, දැනට වෙළඳසැල පවත්වාගෙන යන ස්ථානය

ආශ්‍රිතව බටතොට ප්‍රාදේශික වෛද්‍යශාලා ස්ථාපනය කිරීමටත් ගුලනවත්ත මහවත්තකන්ද ප්‍රදේශ ආශ්‍රිතව විශේෂ අලෙවිසලක් ආරම්භ කිරීමටත් අපේක්ෂිතය.

මේ සඳහා දළ ඇස්තමේන්තුව රුපියල් ලක්ෂ 35 කි.

**2. මේ වන විට වසා ඇති පහත සඳහන් ප්‍රාදේශික නැවත ස්ථාපනය කිරීමට අපේක්ෂා කෙරේ.**

i. මලන්කන්ද ප්‍රාදේශිකය
ii. සුදගල ප්‍රාදේශිකය
iii. ආනන්දපුර ප්‍රාදේශිකය
iv. මලංගම ප්‍රාදේශිකය (කෝප්සිටියක් බවට පරිවර්තනය කිරීම)
v. හිග්ගස්හේන ප්‍රාදේශිකය (කෝප්සිටියක් බවට පරිවර්තනය කිරීම)
vi. ගලුකගම ප්‍රාදේශිකය
vii. කිරගලවත්ත ප්‍රාදේශිකය
viii. කදන්ගොඩ ප්‍රාදේශිකය
ix. මලව ශාන්තිපුර ප්‍රාදේශිකය
x. පාතගම ප්‍රාදේශිකය
xi. වතුයාය ප්‍රාදේශිකය

**i. <u>මලන්කන්ද ප්‍රාදේශික වෛද්‍යශාලා</u>**

මෙම වෛද්‍යශාලා සමිතියට අයත් ගොඩනැගිල්ලක සාර්ථකව පවත්වාගෙන ගිය නමුත් පසුගිය වකවානුවේදී එම වෛද්‍යශාලා වසා දමා ඇති අතර, 2026 වර්ෂයේ මුල් කාර්තුව තුල අලුත්වැඩියා කර කඩිනමින් ආරම්භ කිරීමට කටයුතු කෙරෙනු ඇත.

මේ සඳහා දළ ඇස්තමේන්තුව රුපියල් ලක්ෂ 5 කි.

**ii. සුදගල ප්‍රාදේශික <u>වෛද්‍යශාලා</u>**

මෙම වෛද්‍යශාලා සමිතියට අයත් පරිශ්‍රයක ඉදිකිරීම සඳහා මේ වන විට මූලික වැඩකටයුතු ආරම්භ කර ඇති අතර, 2026 වර්ෂයේ මුල් කාර්තුව තුල පාරිභෝගික සේවා සඳහා විවෘත කිරීමට අපේක්ෂිතය.

මේ සඳහා දළ ඇස්තමේන්තුව රුපියල් ලක්ෂ 38 කි.

**iii. ආනන්දපුර ප්‍රාදේශිකය**

මේ වන විටත් සුදුසු පරිශ්‍රයක් බදු පදනම මත ලබාගැනිමට හඳුනාගෙන ඇති අතර 2026 වර්ෂය ආරම්භයේදිම මෙම වෙළඳසැල නැවත ආරම්භ කිරීමට කටයුතු කෙරෙනු ඇත.

**iv. මලංගම ප්‍රාදේශිකය**

සමිතිය සතු ගොඩනැගිල්ලක පවත්වාගෙන ගිය මෙම වෙළඳසැල පසු ගිය කාලයේදි බාහිර පාර්ශවය වෙත බදුපදනම මත ලබාදි තිබූ බැවින් මෙම වෙළඳසැල කෝප්සිටි වෙළඳසැලක් ලෙස බටුහේන ප්‍රදේශයේ සුදුසු ගොඩනැගිල්ලක ස්ථාපනය කිරීම සඳහා මූලික කටයුතු සිදුකෙරෙනු ඇත. 2026 වර්ෂය ආරම්භයේදිම පාරිභෝගික සේවා සඳහා විවෘත කිරීමට අපේක්ෂිතය.

මේ සඳහා දළ ඇස්තමේන්තුව රුපියල් ලක්ෂ 20 කි.

**v. හිග්ගස්හේන ප්‍රාදේශිකය**

මේ වන විටත් සුදුසු පරිශ්‍රයක් බදු පදනම මත ලබාගැනිමට හඳුනාගෙන ඇති අතර 2026 වර්ෂය ආරම්භයේදිම මෙම වෙළඳසැල නැවත ආරම්භ කිරීමට කටයුතු කෙරෙනු ඇත.

**vi. ගලූකගම ප්‍රාදේශිකය**

සමිතිය සතු ගොඩනැගිල්ලක පවත්වාගෙන ගිය මෙම වෙළඳසැල පසුගිය කාලය තුළ බාහිර පාර්ශවයක බදු පදනම මත ලබාදි තිබූ අතර, පසුගිය දා සිදුවූ අනතුරක් නිසා මේ වන විට අබලන් වී ඇත. නවීකරණය කිරීමෙන් අනතුරුව නැවත 2026 වර්ෂයේ ආරම්භයේදිම සමිතියේ වෙළඳසැලක් ලෙස විවෘත කෙරෙනු ඇත.

මේ සඳහා දළ ඇස්තමේන්තුව රුපියල් ලක්ෂ 5 කි.

**vii. කිරගලවත්ත ප්‍රාදේශිකය**

දීර්ඝ කාලයක සිට වසා දමා ඇති මෙම වෙළඳසැල ඉතා කඩිනමින් නැවත සුදුසු ස්ථානයක ආරම්භ කිරීමට කටයුතු කෙරෙනු ඇත. මේ සඳහා පැරණි වෙළඳසැල පැවති ගොඩනැගිල්ල වතු සමාගම වෙතින් ලබාගැනීම සඳහා සාකච්ඡා කිරීමට නියමිත අතර, එහි සාර්ථකත්වය මත වෙළඳසැල ස්ථාපිත කිරීමට අපේක්ෂිතය.

මේ සඳහා දළ ඇස්තමේන්තුව රුපියල් ලක්ෂ 3 කි.

**viii. කඳන්ගොඩ ප්‍රාදේශිකය**

මෙම වෙළඳසැල ආරම්භ කිරීම සඳහා සුදුසු ව්‍යාපාරික ස්ථානයක් කඩිනමින් සොයාගැනීමට අපේක්ෂා කරන අතර, 2026 දෙවන කාර්තුව වන විට පාරිභෝගික සේවා සඳහා විවෘත කිරීමට අපේක්ෂිත වේ.

**මලව ගාන්තිපුර ප්‍රාදේශිකය**

මෙම වෙළඳසැල ආරම්භ කිරීම සඳහා සුදුසු ව්‍යාපාරික ස්ථානයක් කඩිනමින් සොයාගැනීමට අපේක්ෂා කරන අතර, 2026 දෙවන කාර්තුව වන විට පාරිභෝගික සේවා සඳහා විවෘත කිරීමට අපේක්ෂිත වේ.

**ix. පාතගම ප්‍රාදේශිකය**

පාතගම ප්‍රාදේශිකය පවත්වාගෙන ගිය සමිතිය සතු ගොඩනැගිල්ල ව්‍යාපාරික ස්ථානයකට සුදුසු ස්ථානයක් නොවන බව නිරීක්ෂණය වන බැවින් එම ගොඩනැගිල්ල සහ ඉඩම් කොටස අලෙවි කර පාතගම මංසන්ධිය ආසන්නයේ සුදුසු ස්ථානයක් මිළදී ගෙන ප්‍රාදේශික වෙළඳසැල සහ ග්‍රාමීය බැංකුව සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකිරීමට අපේක්ෂා කෙරේ.

මේ සඳහා දළ ඇස්තමේන්තුව රුපියල් ලක්ෂ 90 කි.

**x. වතුයාය ප්‍රාදේශිකය**

සමිතිය සතු ගොඩනැගිල්ලක පවත්වාගෙන ගිය වතුයාය ප්‍රාදේශික වෙළඳසැල පසුගිය කාලයේ බදුපදනම මත ලබාදී තිබූ අතර, මේ වන විට වසා දමා ඇත. මෙම වෙළඳසැල 2026 වර්ෂයේ දෙවන කාර්තුවේදී නැවත විවෘත කර පාරිභෝගික සේවා සැපයීම සඳහා විවෘත කිරීමට අපේක්ෂිතය.

## iv. විශේෂ අලෙවිහල්

**i. කළුකැලේ විශේෂ අලෙවිසැල**

මෙම අලෙවිසැල මෑතකදී ආරම්භ කරන ලද අතර, ඉතා සාර්ථකව පවත්වාගෙන යනු ලැබේ.

ii. **නව විශේෂ අලෙවිසැල් ආරම්භ කිරීම**

i. ගුලනවත්ත මහවත්තකන්ද ප්‍රදේශ ආශ්‍රිතව විශේෂ අලෙවිසැලක් ආරම්භ කිරීමට අපේක්ෂිතය.

ii. කුරුවිට කරවල වාඩිය

කුරුවිට නගරය තුළ සුදුසු ස්ථානයක 2026 වර්ෂයේ මුල් කාර්තුව තුල ස්ථාපනය කිරීමට අපේක්ෂිත වේ.

මේ සදහා දළ ඇස්තමේන්තුව රුපියල් ලක්ෂ 5 කි.

iii. Roadside Market (මාර්ග පාරිශ්‍රය වෙළඳපොල)

කුරුවිට නගරය තුළ උචිත ස්ථානයක සාමාජිකයින්ගේ කෘෂිකාර්මික නිෂ්පාදන අලෙවිය සඳහා අලෙවිසැලක් ආරම්භ කිරීම. මෙහිදි නිෂ්පාදකයා විසින් නියම කරනු ලබන මිළ ගණන් යටතේ භාණ්ඩ අලෙවි කිරීමටත් 5%, 10% අතර සේවා ගාස්තුවක් අයකර පවත්වාගෙන යාමටත් අපේක්ෂා කෙරේ.

මේ සදහා දළ ඇස්තමේන්තුව රුපියල් ලක්ෂ 5 කි.

3. **ඉන්ධනහල**

අප සමිතිය සතුව ඉන්ධනහල් 1 ක් පවතින අතර එය කුරුවිට නගරයේ ස්ථාපනය කර ඇත. 2024 වර්ෂයේදි ඉන්ධනහල මුළු පිරිවැටුම රුපියල් මිලියන 1785 කි. ඒ අනුව සමස්ත ලාභය රුපියල් මිලියන 30.96 කි. 2025 වර්ෂයේ ඔක්තෝබර් දක්වා ඉන්ධනහල පිරිවැටුම රුපියල් මිලියන 1474 කි. ලාභය රුපියල් මිලියන 19.13 කි. මෙම ඉන්ධනහල 2013 වර්ෂයේ නවීකරණය කරන ලද අතර, ඒ සඳහා මුළු පිරිවැය රුපියල් මිලියන 40 කි

ඒ අනුව 2026 වර්ෂය තුලදි ඉන්ධනහල මුළු පිරිවැටුම රුපියල් මිලියන 2082 ක් වන අතර අපේක්ෂිත ශුද්ධ ලාභය මිලියන 42 කි

ඒ අනුව 2026 වර්ෂය තුලදි වඩාත් ප්‍රශස්ත සේවයක් ලබාදිම සදහා ඉන්ධනහල ආශ්‍රිතව පහත ක්‍රියාමාර්ග ගැනිමට අපේක්ෂා කෙරේ.

i. දැනට භාවිතා වන 2013 දි නවීකරණය කරන ලද ඉන්ධන පොම්ප 2 ක් වෙනුවට අවශ්‍යතාවය පරිදි නව ඉන්ධන පොම්ප 2 ක් ස්ථාපනය කිරිම සඳහා රුපියල් ලක්ෂ 90 ක් ආයෝජනය කිරීමට අපේක්ෂිත වේ.

ii. ඉන්ධනහල පරිශ්‍රයේ විදුලි ආලෝක පද්ධතිය නවීකරණය කිරීම සඳහා රුපියල් ලක්ෂ 5 ක ආයෝජනයක් සිදු කෙරේ.

iii. 2025 වර්ෂයේදී රුපියල් ලක්ෂ 3 ක් වැයකර ඉන්ධනහල සේවකයින් 17 දෙනා සඳහා විධිමත් නිල ඇඳුමක් ලබාදී ඇති අතර, 2026 වර්ෂයේදී නිළ ඇඳුම් ලබාදීම සඳහා රුපියල් ලක්ෂ 4 ක් ඇස්තමේන්තු කර ඇත.

iv. ඉන්ධනහල කාර්යය මණ්ඩලය සඳහා විධිමත් පුහුණුවක් අදියර කිහිපයකින් ලබාදීම සඳහා සැලසුම් කර ඇත.

v. ඉන්ධනහල පරිශ්‍රයේ කාර්යය මණ්ඩලයේ භාවිතය සඳහා ඇති විවේක කාමරය නවීකරණය සහ ඔවුන්ගේ යතුරුපැදි ආදිය නවතා තැබීම සඳහා සුදුසු ආවරණයක් සකස් කරදීම. මේ සඳහා රුපියල් ලක්ෂ 3 ක් වැය වෙතැයි අපේක්ෂා කෙරේ.

vi. එරත්න දැරණියගල ප්‍රදේශය ආශ්‍රිතව සේවා සැපයීම පිණිස නව ඉන්ධනහලක් ස්ථාපනය කිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදු කිරීමට අපේක්ෂා කෙරේ.

මේ සදහා රුපියල් ලක්ෂ 100 ක් ආයෝජනය කිරීමට බලාපොරොත්තු වේ.

ඉහත සියළු කාර්යයන් සිදුකිරීමේදී විධිමත් තාක්ෂණික ඇස්තමේන්තු ලබාගැනීමෙන් අනතුරුව අදාළ කටයුතු සිදු කරනු ඇත.

***ඉන්ධනහල ආදායම් වියදම් ඇස්තමේන්තුව – ඇමුණුම් අංක 5***

4. **<u>නියෝජිත අලෙවි අංශ</u>**

අප සමිතිය විසින් මේ වන විට නියෝජිත අලෙවිධුර 3 ක් ක්‍රියාත්මක කරනු ලබන අතර, 2026 වර්ෂයේදී එම සංඛ්‍යාව නියෝජිත අලෙවිධුර 10 ක් දක්වා වර්ධනය කිරීමට අපේක්ෂා කරමු. ඒ අනුව අදාළ කටයුතු සඳහා අවශ්‍ය බැංකු ඇපකර තැබීම අදාළ පරිශ්‍රයන් සම්පාදනය කරගැනීම සහ කාර්යය මණ්ඩලය බඳවා ගැනීම සිදුවනු ඇත. මෙහිදී අදාළ කටයුතු සඳහා රුපියල් ලක්ෂ 25 ක උපරිමයකට යටත්ව වියදම් දැරීමට කටයුතු කෙරේ. (අදාළ කටයුතු සඳහා විධිමත් තාක්ෂණික ඇස්තමේන්තු ලබාගනිමින් කටයුතු සිදු කෙරේ.)

දැනට ක්‍රියාත්මක නියෝජිතධුරයන්ට අදාළව වෙළඳ පිරිවැටුම සහ ලාභය වර්ධනය කරගැනීම සඳහා පහත ක්‍රියාමාර්ගවලට එළැඹෙනු ඇත.

**i. සමුපන නියෝජිත තැපැල් කාර්යාලය**

2024 වර්ෂයේදි වාර්ෂික වෙළඳ පිරිවැටුම රුපියල් මිලියන 5 ක් වූ අතර අලාභය රුපියල් 21000 කි. 2026 වර්ෂයේදි වෙළඳ පිරිවැටුම රුපියල් මිලියන 15 අපේක්ෂා කරන අතර, ඒ අනුව අපෙක්ෂිත ලාභය මිලියන 0.52 කි. එම ඉලක්කවලට ළඟා වීම සඳහා හා වඩාත් කාර්යක්ෂම සේවාවක් ලබාදිම සඳහා දැනට පවත්නා උපකරණවලට අමතරව පහත සඳහන් එකතු කිරීම් සිදුකරනු ලැබේ. ඒ සඳහා රුපියල් මිලියන 2 ආයෝජනය කිරීමට අපේක්ෂිත වේ.

- i පරිගණක යන්ත්‍රයක්
- ii වර්ණ මුද්‍රණ යන්ත්‍රයක්
- iii පොත් බැදිමේ යන්ත්‍රයක්
- iv reload පහසුකම් සපයන යන්ත්‍රයක්
- v අන්තර්ජාල පහසුකම්

***සමුපන නියෝජිත තැපැල්හල ආදායම් වියදම් ඇස්තමේන්තුව - ඇමුණුම් අංක 6***

**ii. මංචි අලෙවි නියෝජිතධූරය**

2024 වර්ෂයේ වෙළඳ පිරිවැටුම රු මිලියන 32 සහ ලාභය රුපියල් මිලියන 0.72 කි. 2025 වර්ෂයේ ඔක්තොම්බර් මාසය වන විට සමුච්චිත ලාභය රුපියල් මිලියන 0.75 කි. ඒ අනුව 2026 වර්ෂයේ අපේක්ෂිත වෙළඳ පිරිවැටුම රුපියල් මිලියන 35 ක් වන අතර අපේක්ෂිත ලාභය රුපියල් මිලියන 2.7 කි.

මංචි වෙළඳ පිරිවැටුම වර්ධනය සඳහා සමිතියේ තොග වෙළඳාම ආශ්‍රිතව මංචි නිෂ්පාදන වෙළඳාම වඩාත් පුළුල් කිරීමට කටයුතු කරනු ඇත.

***මංචි අලෙවි නියෝජිත අංශයේ ආදායම් වියදම් ඇස්තමේන්තුව – ඇමුණුම් අංක 9***

**iii. යුනිලිවර් අලෙවි නියෝජිත ධූරය**

2024 වර්ෂයේ වෙළඳ පිරිවැටුම රුපියල් මිලියන 18 ක් වන අතර ලාභය රුපියල් මිලියන 1.2 කි 2025 වර්ෂයේ ඔක්තොම්බර් මාසය වන විට සමුච්චිත පිරිවැටුම රුපියල් මිලියන 29 ක් වන අතර ලාභය රුපියල් මිලියන 0.8 කි. ඒ අනුව 2026 වර්ෂයේ අපේක්ෂිත වෙළඳ පිරිවැටුම රුපියල් මිලියන 64 ක් වන අතර අපේක්ෂිත

ලාභය පිළිවෙලින් රුපියල් මිලියන 9.2 කි. යුනිලිවර් වෙළඳ පිරිවැටුම වර්ධනය සඳහා සමිතියේ තොග වෙළඳාම ආශ්‍රිතව යුනිලිවර් නිෂ්පාදන වෙළඳාම වඩාත් පුළුල් කිරීමට කටයුතු කරනු ඇත.

***යුනිලිවර් අලෙවි නියෝජිත අංශයේ ආදායම් වියදම් ඇස්තමේන්තුව – ඇමුණුම් අංක 10***

මංචි, යුනිලිවර් අලෙවි නියෝජිතධුරයන්ට අදාළව භාණ්ඩ බෙදාහැරීම සඳහා මෙට්‍රික් ටොන් 2.5 ධාරිතාවයෙන් යුත් ලොරි රථයක් රුපියල් මිලියන වැය කර ලබාගැනීමට අපේක්ෂිතය.

ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 7.5 ක් වේ.

## 3. රක්ෂණ අංශය

සමිතිය මඟින් මේ වන විට සමුපකාර රක්ෂණ සමාගමේ අලෙවි නියෝජිතධුරය දරණ අතර, සොෆ්ට්ලොජික් රක්ෂණ සමාගම හා එක්ව පාරිභෝගික රක්ෂණ ක්‍රමය ක්‍රියාත්මක කරනු ලබයි.

2024 වර්ෂයේදී සමුපකාර රක්ෂණ ඒකකයේ වෙළඳ පිරිවැටුම රුපියල් මිලියන 0.8 ක් වන අතර ලාභය රුපියල් මිලියන 0.3 කි 2025 වර්ෂයේ ඔක්තොම්බර් දක්වා වූ වෙලද පිරිවැටුම රුපියල් මිලියන 0.5 ක් වන අතර ලාභය රුපියල් මිලියන 0.1 කි. 2026 වර්ෂයේදී ඉලක්කගත පිරිවැටුම රුපියල් මිලියන 1 ක් වන අතර ලාභය රුපියල් මිලියන 0.08 කි. මේ වන විට මෝටර් රථවාහන රක්ෂණය පමණක් මෙමගින් ක්‍රියාත්මක වන අතර, සාමාන්‍ය රක්ෂණය සහ ජීවිත රක්ෂණය යන අංග 2026 වර්ෂයේදී රක්ෂණ ඒකකයට එකතු කරගැනීමට බලාපොරොත්තු වේ.

පාරිභෝගික රක්ෂණ ක්‍රමය පූර්ණ වශයෙන්ම සමිතියේ පාරිභෝගික භාණ්ඩ අලෙවිය ප්‍රවර්ධනය මෙන්ම සාමාජික පාරිභෝගිකයින් සඳහා සුභසාධන වැඩ පිළිවෙලක් ලෙස ක්‍රියාත්මක කරනු ලබයි. මේ වන විට මෙම රක්ෂණ ක්‍රමයට 300 පිරිසක් දායක වී ඇති අතර, පසුගිය කාලය තුළදී එහි ප්‍රතිලාභ ලෙස දෙවිපහළ ප්‍රාදේශයේ පාරිභෝගියකු හට රුපියල් 125000/= ක්

ද නඩුකාරදෙනිය රුපියල් 50000/= ක් ද කදන්ගොඩ රුපියල් 75000/= ක් ද කුරුවිට රුපියල් 50000/= ක් පැරඩයිස් රුපියල් 25000/= ක් පණුකැරුපිටිය රුපියල් 50000/= ක් පාරිභෝගිකයන් හට හිමිවන ලදි.

2026 වර්ෂය තුලදී සමිතියේ පාරිභෝගික සමාජිකයින් 10000 ක් මෙම රක්ෂණ ක්‍රමය තුළට අන්තර්ග්‍රහනය කරගැනීමට බලාපොරොත්තු වන අතර, එමගින් විශාල පිරිසකට සුහසාධන සේවා සැපයීම මෙන්ම සමිතියේ පාරිභෝගික භාණ්ඩ වෙළඳාම රුපියල් මිලියන 250 කි. සියළුම අලෙවි ඒකක පරිගණක පද්ධතියතුළට සම්බන්ධවීම මගින් පාරිභෝගික රක්ෂණ කටයුතු විධිමත්ව සිදුකිරීමට අවකාශ සැලසෙනු ඇත.

ඉහත ඉලක්ක සපුරාගැනීම සඳහා රක්ෂණ ඒකකය ජ්‍යේෂ්ඨ කළමණාකරුවෙක් යටතේ විධිමත්ව ස්ථාපනය කිරීමට කටයුතු කෙරෙනු ඇත.

***රක්ෂණ අංශයේ ආදායම් වියදම් ඇස්තමේන්තුව – ඇමුණුම් අංක 7***

## 4. ප්‍රවාහන අංශය

දැනට සමිතිය සතුව පැවති ලොරි රථ ට්‍රැක්ටර් රථය භූමිතෙල් බවුසරය පසුගිය කාලවකවානුවේදී විකුණා දැමීමෙන් පසු ප්‍රවාහන අංශය දුර්වල මට්ටමක පවතින අතර, මේ වන විට සමිතියේ පාරිභෝගික අංශයට සම්බන්ධ කර ඇත. එහෙත් අපගේ වෙළඳජාලය පුළුල් වීමේදී විධිමත් ප්‍රවාහන පහසුකම් ඉතා වැදගත් වනු ඇති බැවින්, විධිමත් ලෙස ප්‍රවාහන අංශය ස්ථාපිත කිරීමට කටයුතු කරනු ලබන අතර, ප්‍රවාහන නිළධාරීවරයෙකු යටතේ එම අංශය පවත්වාගෙන යනු ඇත.

ඒ සදහා දැනට සමිතිය සතු ලොරි රථය, ත්‍රිරෝද රථය, කැබ් රථය අනුයුක්ත කරනු ලබන අතර, 2026 වර්ෂයේදී

1. වෑන් රථයක්
2. ලොරි රථ 3 (මෙට්‍රික් ටොන් 10 සහ මෙට්‍රික් ටොන් 7.5 මෙට්‍රික් ටොන් 2.5)
3. කෘෂිකාර්මික කටයුතු සදහා භාවිතය පිණිස බිම් සකස් කිරීමේ යන්ත්‍රයක්,

අස්වනු නෙලීමේ යන්ත්‍රයක්, තේ ඉඩම් සහ කුරුදු ඉඩම් සකස් කිරීමේ කුඩා පරිමාණයේ යන්ත්‍ර සූත්‍ර

4. සංචාරක කටයුතු ප්‍රවර්ධනය සඳහා බස් රථයක්

කෘෂිකාර්මික කටයුතු සඳහා වන යන්ත්‍ර සූත්‍ර මිළදී ගැනීම පිණිස රුපියල් මිලියන 5 ක ප්‍රමාණයක් ඇස්තමේන්තු කරනු ලැබේ. එහෙත් වෙනත් ජාත්‍යන්තර සංවිධානයකින් හෝ රාජ්‍ය නොවන සංවිධානයක් හරහා මෙම උපකරණ සපයා ගැනීමට ප්‍රමුඛතාවය ලබාදෙන අතර, සමිතිය විසින් අවම පිරිවැයක් දැරීමට අපේක්ෂා කෙරේ.

මෙහිදී වෑන් රථය, ලොරි රථ 3 සහ බස් රථය මිළදී ගැනීම සඳහා රුපියල් ලක්ෂ 600 ක් ආයෝජනය කිරීම සඳහා බලාපොරොත්තු වේ.

මූලික අදියරේදී සංචාරක කටයුතු කුලී පදනම මත ලබාගන්නා බස් රථ උපයෝගී කරගනිමින් සිදුකිරීමට බලාපොරොත්තු වන අතර, එහි සාර්ථකත්වය මත සමිතිය සඳහා බස් රථයක් මිළදී ගැනීමට අපෙක්ෂා කෙරේ.

මීට අතිරේකව බස් රථ, වෑන් රථ, කාර් රථ (විශේෂයෙන් මංගල අවස්ථා සඳහා යොදාගනු ලබන) සහ අනෙකුත් වෙළඳපල ඉල්ලුමක් ඇති වාහන අදාළ අයිතිකරුවන් ලියාපදිංචි කරගනිමින් සේවා සැපයීම පිණිස ක්‍රමවේදයක් ස්ථාපනය කිරීමට කටයුතු කරනු ඇත.

***ප්‍රවාහන අංශයේ ආදායම් වියදම් ඇස්තමේන්තුව - ඇමුණුම අංක 12***

## 5. අධ්‍යාපන සේවා අංශය

### පෙර පාසල් ව්‍යාපෘතිය

වර්තමානයේදී සමිතිය මගින් පෙර පාසල් පද්ධතියක් ස්ථාපනය කර ඇති අතර, එම පෙර පාසල් ජාලය වඩාත් පුළුල් කිරීමට අපේක්ෂා කෙරේ. ඒ අනුව දැනට පවතින පෙර පාසල් 4 ට විධිමත් පෙර පාසල් 10 ක් දක්වා වර්ධනය කිරීමට කටයුතු කරමින් ඇත.

එසේම අපගේ පෙර පාසල්වල අධ්‍යාපනය ලබන සාමාජිකයින්ගේ දරුවන් සඳහා අධ්‍යාපනය සහ අවශ්‍ය කරන නිළ ඇඳුම් මෙන්ම අනෙකුත් පහසුකම් සමිතිය මඟින් නොමිලේ

සපයා දිමට 2026 වර්ෂයේ ආරම්භයේ සිට කටයුතු සිදුකෙරේ. මේ වෙනුවෙන් රුපියල් මිලියන 3.6 ක් සමිතිය මගින් ආයෝජනය කිරීමට අපෙක්ෂා කෙරේ.

තවද, මෙම පෙර පාසල් පද්ධතිය සංවර්ධනය සඳහා ජාත්‍යන්තර සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන මෙන්ම පෞද්ගලික අංශයේ සහාය ද විවිධ පරිත්‍යාගශීලින්ගේ සහායද ලබාගැනීමට අපේක්ෂිතය. මෙම වැඩසටහන සඳහා දායකත්වය ලබාදීමට බලාපොරොත්තු වන පාර්ශ්වයන් හට ඒ සඳහා සම්බන්ධ වීමට Digital platform හරහා පහසුකම් සැලසීමට බලාපොරොත්තු වේ.

*පෙර පාසල් අංශයේ ආදායම් වියදම් ඇස්තමේන්තුව - ඇමුණුම අංක 8*

## ඉංග්‍රීසි භාෂා අධ්‍යාපන මධ්‍යස්ථානය

පාසල් හැරගිය තරුණ ප්‍රජාව සඳහා ඉංග්‍රීසි භාෂා අධ්‍යාපනය පිණිස සුදුසු මධ්‍යස්ථානයක් ජාත්‍යන්තර සංවිධාන සහ රාජ්‍ය නොවන සංවිධාන සමඟ සම්බන්ධ වී 2026 වර්ෂයේදි ස්ථාපනය කිරීමට අපෙක්ෂා කෙරේ. මේ සඳහා සමිතිය විසින් කරනු ලබන ආයෝජනය ඉතා සීමිත විය යුතු අතර, වෙනත් සංවිධානවල සහ පරිත්‍යාගශීලින්ගේ දායකත්වයෙන් මෙම මධ්‍යස්ථානය පවත්වාගෙන යෑමට අදහස් කෙරේ.

එසේම වෙනත් විදේශීය භාෂා පුහුණුව සඳහා මෙම මධ්‍යස්ථානය භාවිතා කිරීමට අපෙක්ෂා කරන අතර, ඒ සඳහා එම රටවල්වල අනුග්‍රහය ලබාගැනීමට අපේක්ෂා කෙරේ.

## පාසල් සමුපකාර සංවිධාන

අප සමිති බල ප්‍රදේශය තුළ පාසල් 20ක් පවතින අතර, ඒ අතුරින් තෝරාගත් පාසල් සමග පාසල් දරු දැරියන් සඳහා සීමාසහිත කුරුවිට විවිධ සේවා සමුපකාර සමිතිය අනුබද්ධ පාසල් සමුපකාර සංවිධාන පිහිටුවීම සඳහා මේ වන විටත් මූලික කටයුතු සිදුකර ඇත.

මෙම පාසල් සමුපකාර සංවිධාන මගින් පහත අරමුණු සාක්ෂාත් කරගැනීමට බලාපොරොත්තු වේ.

1. පාසල් දරුවන් තුළ සමුපකාර විෂය සම්බන්ධව අවබෝධය වර්ධනය කිරීම.
2. ව්‍යවසායකත්ව දැනුම ප්‍රවර්ධනය.

3. සමාජ සංවිධාන සම්බන්ධ අත්දැකීම් ලබාදීම.
4. ඉතිරිකිරීම් පුරුදු ප්‍රවර්ධනය.
5. අවශ්‍ය පාසල් උපකරණ සපයාගැනීම.
6. අවශ්‍යතා සහිත දරුවන් සඳහා අධ්‍යාපන ශිෂ්‍යත්ව ලබාගැනිම.
7. දරුවන්ගේ නායකත්ව සහ පෞර්ෂ සංවර්ධනය
8. මූල්‍ය ශාක්ෂරතාවය

මේ සඳහා මූලික ආයෝජනයක් ලෙස සමිතිය මගින් රුපියල් ලක්ෂ 10 ක පමණ වැයබරක් දැරීමට අපෙක්ෂා කරන අතර, අනෙකුත් ජාත්‍යන්තර සහ ජාතික සමුපකාර සංවිධානවල සහාය ලබාගැනීමට අපෙක්ෂිතය.

## 6. ව්‍යවසායකත්ව සංවර්ධන අංශය

අප සමිතියේ 35000 කට අධික සමාජිකත්වය යටතේ ආර්ථික සංවර්ධනය සමිතියේ ප්‍රමුඛ අරමුණක් වන අතර දීර්ඝ කාලීනව බලාපොරොත්තු වන එක් ප්‍රතිඵලයක් වන්නේ "සාමාජිකයන් සහ ප්‍රාදේශයේ තරගකාරී ආර්ථිකයක් ඇති කිරීම" වේ. ඊට සමගාමීව සාමාජිකයාගේ ව්‍යවසායකත්ව හැකියාව සංවර්ධනය කිරීම තුළින් ඔවුන්ගේ ආර්ථික ශක්තිය වර්ධනය කිරීම සඳහා මේ වන විටත් මූලික කටයුතු ආරම්භ කර ඇති අතර, පහත විෂයන් ඔස්සේ වැඩසටහන පුළුල් කිරීමට බලාපොරොත්තු වේ.

1. කෘෂිකාර්මික නිෂ්පාදන – දේශිය හා විදේශිය වෙළඳපොල සඳහා
2. අපනයන කෘෂිකාර්මික නිෂ්පාදන - දේශිය හා විදේශිය වෙළඳපොල සඳහා
3. වැවිලි කර්මාන්ත නිෂ්පාදන - දේශිය හා විදේශිය වෙළඳපොල සඳහා
4. සත්ත්ව නිෂ්පාදන - දේශිය හා විදේශිය වෙළඳපොල සඳහා
5. සුළු හා මධ්‍යපරිමාණ කාර්මික නිෂ්පාදන - දේශිය හා විදේශිය වෙළඳපොල සඳහා
6. නවෝත්පාදන සඳහා සහාය දීම සහ එම සේවා වාණිජ මට්ටමට ගෙන ඒමට කටයුතු කිරීම

මෙහිදි සමිතිය, සාමාජිකයින් සහ පෞද්ගලික අංශ හවුල්කාරිත්ව ක්‍රමවේදයක් (CP3) හඳුන්වාදීමට කටයුතු සුදානම් කර ඇත.

ඒ අනුව ඒ ඒ ප්‍රදේශය ආශ්‍රිතව සහ අදාළ සාමාජික කණ්ඩායම්වල හැකියාවන්වලට ගැලපෙන වඩාත් සුදුසු ව්‍යවසායන් විද්‍යාත්මක විශ්ලේෂණයක් තුලින් හඳුනාගැනීම සඳහා අදාළ විශේෂඥයින්ගේ සහාය ලබාගැනීමට අපේක්ෂා කෙරේ. ඒ අනුව තෝරාගත් ව්‍යවසායන් සඳහා සාමාජිකයින් කණ්ඩායම් වශයෙන් ගොනුගත කිරීම පිණිස සමිතියට අනුබද්ධ කුඩා සමුපකාර ඒකක නිර්මාණය කිරිම තුලින් ප්‍රමාණාත්මක නිෂ්පාදනයක් සහතික කරගැනීමට හැකිවනු ඇත. මෙහිදි නිෂ්පාදන සඳහා අගය එකතු කිරිම සඳහා අවශ්‍ය වන තාක්ෂණය සහ මුලධනය යෙදවීම සහ දේශිය හා විදේශිය වෙළඳපල අවස්ථා හඳුනාගැනීම පිණිස පෞද්ගලික අංශය මෙම අගයදාමයට සම්බන්ධ කරගැනීම වඩාත් ඵලදායි වේ.

එබැවින් සමිතියේ මැදිහත් වීම මත වඩාත් සුදුසු ව්‍යවසායන් හඳුනාගැනීම සිදුකරනු ලබන අතර, ඊට සාමාජිකයන් තෝරා ගැනිම පුහුණුව අවශ්‍ය මූල්‍ය පහසුකම් සපයා දිම සහ එම සාමාජික කණ්ඩායම් ගොනුගත කර කුඩා සංවිධාන ඒකක නිර්මාණය කිරීම සිදු කෙරේ.

එම ප්‍රාථමික නිෂ්පාදන සඳහා අගය එකතු කිරීමේ ක්‍රියාදාමය සඳහා පෞද්ගලික අංශයේ දායකත්වය ලබාගනු ඇත. එහෙත් හැකි සෑම අවස්ථාවකදිම කුඩා සමුපකාර ඒකක සහ සමිතිය මගින්ම මෙම කටයුතු සිදුකිරීමට අවශ්‍ය පියවර ගනු ඇත.

මෙම නිෂ්පාදන දේශිය හා විදේශිය වෙළඳපල වෙත ඉදිරිපත් කිරිම සඳහා සමිතිය විසින් කටයුතු කරනු ලබන අතර පෞද්ගලික අංශය ද සාධනීය ලෙස මැදිහත් කරගනු ඇත.

මෙහිදි තෝරාගනු ලබන ක්‍රමවේදය මත පදනම්ව මේ සඳහා සහභාගි වන සාමාජිකයන්, කුඩා සමුපකාර ඒකකය, සමිතිය සහ පෞද්ගලික අංශය අතර විධිමත් අවබෝධතා ගිවිසුමකට එළැඹීමට කටයුතු කරන අතර, එමගින් සාමාජිකයා වෙත තම නිෂ්පාදන සඳහා ඉහළ මිළක් සහතික කළ හැකි අතර, ගුණාත්මක තත්ත්වයෙන් උසස් භාණ්ඩ නිෂ්පාදනයක් සඳහා එම නිෂ්පාදකයින් යොමු කිරීම සිදුවේ.

**ගුණාත්මක සහ ප්‍රමාණාත්මක ප්‍රාථමික නිෂ්පාදන**

↓

අගය එකතු කිරීම

↓

දේශීය හෝ විදේශීය වෙළඳපොළ

↓

ඉහළ මිළ

## CP3 Module

**C** Cooperative

**P** People (members)

**P** Private

**P** Partnership




මෙම අමුල් ආකෘතිය මූලික වශයෙන් අපගේ ව්‍යවසායකත්ව වැඩසටහන සඳහා යොදාගැනීමට බලාපොරොත්තු වන අතර යෝජිත CP3 ආකෘතිය පෞද්ගලික අංශය සමග එක්ව කටයුතු කිරීමේදී භාවිතයට ගැනීමට බලාපොරොත්තු වේ.




*අමුල් ආදර්ශ ආකෘතිය*


Partnership
වෙළඳපොළ
විකුණුම් ආදායම
නිෂ්පාදිත
ද්විතියික
Privet
විකුණුම්ආදායම
අගය එකතුකිරීම්
මුදල්
Cooprative
Partnershi
මුදල්
ප්‍රාථමික නිෂ්පාදන
Partnership
People
(Membes
ප්‍රාථමික නිෂ්පාදන
Partnership

**CP3 Module**

මෙම වැඩසටහන සාර්ථකව පවත්වාගෙන යෑම සඳහා රාජ්‍ය අංශය, පෞද්ගලික අංශය, ජාත්‍යන්තර සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන (දේශීය හා විදේශීය), දේශීය හා විදේශීය පර්යේෂණ ආයතන සහ ක්ෂේත්‍රයේ විද්වතුන් සම්බන්ධීකරණය කරගැනීම සමිතිය මගින් සිදුකෙරෙනු ඇත. ඒ අනුව විවිධ ආයතන සඳහා ව්‍යාපෘති වාර්තා ඉදිරිපත් කර අදාළ ව්‍යාපෘති සඳහා අවශ්‍ය මූල්‍ය සහ තාක්ෂණික සහාය ලබාගැනීම සඳහා කටයුතු කෙරේ. එසේම digital Platform මඟින් සමිතිය මගින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති සඳහා දේශීය හා විදේශීය විවිධ පාර්ශවකරුවන්ට ඔවුන්ගේ පරිත්‍යාග සිදුකිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කරනු ඇත.

මෙම ව්‍යවසායකත්ව වැඩසටහන තුළින් වර්ෂ 5 ක කාලයක් තුළදී දැනට සිටින සාමාජිකයන් 35000 සහ ඉදිරියේදී අප සමග එකතුවන සාමාජිකයන් ඇතුළුව 60000 ට අධික වියහැකි සාමාජිකයන් අතුරින් 25000 ක සමාජික ප්‍රමාණයකට ප්‍රතිලාභ ලැබෙනු ඇත. එසේම 2026 වර්ෂය තුළදී සාමාජිකයින් 10000 ක් සඳහා මෙමඟින් ප්‍රතිලාභ සැලසීමට බලාපොරොත්තු වේ. එම සෑම සාමාජිකයෙක් සඳහාම මාසිකව අවම රුපියල් 25000/= ඉක්මවූ නව ආදායම් මාර්ගයක් සඳහා ප්‍රවේශය ලබාදෙනු ඇත. ඒ අනුව 2026 වර්ෂයේදී මෙමඟින් රුපියල් මිලියන 250 කින් ජාතික ආර්ථිකය සඳහා නව දායකත්වය සපයනු ඇත. වර්ෂ 5 අවසානයේදී වාර්ෂිකව අවම වශයෙන් රුපියල් මිලියන 7500 ක් ජාතික ආර්ථිකය සඳහා එකතුකළ හැකිවේ.

මෙම වැඩසටහන විධිමත්ව පවත්වාගෙන යෑම සඳහා ජ්‍යේෂ්ඨ කළමණාකරුවෙකු යටතේ ව්‍යවසායකත්ව අංශයක් සමිතිය තුළ ගොඩනැගීමට කටයුතු කරන අතර, ඒ සඳහා මූලික ආයෝජනයක් ලෙස රුපියල් ලක්ෂ 10 ක මුදලක් වෙන් කෙරෙනු ඇත.

## 7. සංචාරක සේවා අංශය

කුරුවිට ප්‍රදේශය ආශ්‍රිතව සංචාරක කර්මාන්තය බහුල වශයෙන් සිදුකෙරෙනු ලබන අතර, ඒ සඳහා සමිතිය මැදිහත් වී ඵලදායි සංචාරක සේවා සපයන ආයතනයක් බවට පරිවර්තනය වීම අපේක්ෂා කරයි. ඒ අනුව

1. දේශීය සංචාර සංවිධානය
2. විදේශීය සංචාර සංවිධානය
3. කුරුවිට ප්‍රදේශයේ දෛනික සංචාර සඳහා පහසුකම් සැපයීම

යන කටයුතු සිදුකිරීමට බලාපොරොත්තු වේ.

මෙහිදී සංචාරක පැකේජ හඳුන්වාදීමටත් ඒ අනුව දිවයින පුරා අනෙකුත් සමූපකාර සමිති සහ පෞද්ගලික අංශය සමග එක්ව කටයුතු කිරීමට අපේක්ෂා කෙරේ. එසේම විදේශ සංචාර සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් අවශ්‍යතාවය පරිදි සමිතිය මගින් සපයාදීමට කටයුතු කෙරෙනු ඇත.

මීට අමතරව කතරගම, අනුරාධපුර, නුවරඑළිය යන ප්‍රදේශයන් ඉලක්ක කරගනිමින් සමිතිය සතු සංචාරක නිකේතන ස්ථාපනය කිරීම සඳහා මූලික අධ්‍යනයක් සිදුකර ඇති අතර එහි පළමු පියවරක් ලෙස කතරගම ප්‍රදේශයේ සංචාරක නිකේතනයක් ස්ථාපිත කිරීමට අපේක්ෂා කෙරේ.

ඒ අනුව එම කටයුතු සඳහා රුපියල් ලක්ෂ 150 ක පමණ මුදලක් ආයෝජනය කිරීමට අපෙක්ෂිතය.

එරත්න ප්‍රදේශය ආශ්‍රිතව කඳවුරු භූමියක් ස්ථාපනය කිරීම සහ ඊට අදාළ පහසුකම් සැපයීම මගින් සංචාරකයන් ආකර්ශනය කරගැනීමට අපේක්ෂා කෙරේ. ඒ අනුව එම කටයුතු සඳහා රුපියල් ලක්ෂ 5 ක පමණ මුදලක් ආයෝජනය කිරීමට අපේක්ෂිතය.

## 8. ක්‍රීඩා හා සෞඛ්‍ය සේවා අංශය

සමිති බලප්‍රදේශයේ ජනතාව වෙත සෞඛ්‍ය හා වෛද්‍ය සේවා පහසුකම් ලබාදීම අරමුණුකොට ගෙන සේවා මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමට වර්ෂ ගණනාවක සිට අපේක්ෂා කළද ඒ සම්බන්ධව යොමු වී නොමැති බැවින් ඉදිරි වර්ෂය තුලදී කුරුවිට නගරයේ කේන්ද්‍රකොටගෙන බාහිර වෛද්‍ය සේවා (බටහිර) මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ. ඊට සමගාමීව ඖෂධ අලෙවිහලක් සහ වෛද්‍ය රසායනාගාර පහසුකම් සැලසීමේ ඒකකයක් ස්ථාපනය කිරීමට අපේක්ෂා කෙරේ.

තවද දේශීය වෛද්‍ය සේවා සැපයීමේ මධ්‍යස්ථානයක් සුදුසුකම් ලත් වෛද්‍යවරුන් සම්බන්ධකර ගනිමින් ආරම්භ කිරීමටද අදාළ වෛද්‍ය සේවා ස්ථානවලින් ගුණාත්මක හා විශ්වාසනීය සේවාවක් සැලසීමට අපේක්ෂා කෙරේ.

මේ සඳහා රුපියල් ලක්ෂ 20 ක උපරිමයකට යටත්ව ආයෝජනය කිරීමට අපෙක්ෂා කෙරේ.

එසේම ප්‍රාදේශික බලප්‍රදේශ 30 ඉලක්ක කරගනිමින් වාර්ෂිකව ජංගම වෛද්‍ය සායන මාලාවක් 2026 වර්ෂයේදි ආරම්භ කිරීමට කටයුතු කරනු ඇත. එහිදි රෝග පරීක්ෂාවන්, අවශ්‍ය ඖෂධ සැපයීම සහ ඇස් කණ්ණාඩි ආදි උපකරණ සැපයීම සඳහා බලාපොරොත්තු වේ.

සමිති බලප්‍රදේශය තුළ විශේෂයෙන් ම බෝ නොවන රෝග බහුල වශයෙන් පැතිර යමින් පවතින බැවින් ඉන් අපගේ සාමාජිකයන් සහ ප්‍රදේශවාසීන් මුදවා ගැනීම පිණිස ඔවුන් ක්‍රීඩා කටයුතු කෙරෙහි යොමු කිරීම අරමුණු කරගනිමින්

1. ප්‍රාදේශික බලප්‍රදේශ ආවරණය වන පරිදි ක්‍රීඩා සමාජ ශක්තිමත් කිරීම සහ එම ක්‍රීඩාසමාජ එකතු කර ප්‍රාදේශිය ක්‍රීඩා සමාජයක් ගොඩ නැගීම.
2. අවශ්‍ය ක්‍රීඩා උපකරණ ලබාගැනීමට පහසුකම් ලබාදීම.
3. බෝ නොවන රෝග සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම
4. වාර්ෂික සමුපකාර ක්‍රීඩා තරගාවලියක් සංවිධානය කිරීම
5. ජන ක්‍රීඩා ප්‍රචලිත කිරීම සඳහා සිංහල හින්දු අවුරුදු උළෙල සංවිධානය කිරීම.

## 9. උත්සව අවස්ථා කළමණාකරණ අංශය

විවිධ උත්සව අවස්ථා කළමණාකරණය සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම පිණිස සමිතියට අනුබද්ධ ඒකකයක් ස්ථාපනය කිරීමට අපෙක්ෂා කරන අතර එමගින්

1. විවාහ මංගල අවස්ථා - උත්සව ශාලා පහසුකම්, ආහාරපාන, චාරිත්‍රවාරිත්‍ර සඳහා වන පහසුකම්, නර්තන හා සංගීත පහසුකම් ඇතුළත් පැකේජ සකස් කිරීමට බලාපොරොත්තු වන අතර එමගින් පාරිභෝගිකයාගේ අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි අවශ්‍ය පහසුකම් සැලසීමට කටයුතු කෙරේ.
2. උපන්දින සාද ප්‍රිය සම්භාෂණ අවස්ථා
3. රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ සම්මන්ත්‍රණ, වැඩමුළු
4. වෙනත් රැස්වීම් සඳහා පහසුකම් සැපයීම අපේක්ෂා කෙරේ.

මෙම කටයුතු ආරම්භයක් ලෙස අප සමිතිය සතු උත්සව ශාලාව මේ වන විටත් නවීකරණය කර ඇති අතර, අවශ්‍යතාවය පරිදි වෙනත් පෞද්ගලික උත්සව ශාලා, හෝටල් සම්බන්ධීකරණය කරගනිමින් කටයුතු කිරීමට බලාපොරොත්තු වේ.

මීට අමතරව බලප්‍රදේශයේ සාමාජිකයින් අතුරින් සංගීත කණ්ඩායමක්, නර්තන කණ්ඩායමක් ජයමංගල ගාථා කණ්ඩායමක් ආදිය ස්ථාපනය කිරීමට බලාපොරොත්තු වේ. මේ සඳහා රුපියල් ලක්ෂ 25 ක් පමණ ආයෝජනය කිරීමට අපෙක්ෂිතය.

## 10. අවමංගල සේවා අංශය

සමිතිය මගින් ක්‍රියාත්මක කරනු ලබන අවමංගල සේවා සැපයීම පිණිස අදාළපහසුකම් ස්ථාපනය සඳහා මූලික සැලසුම් සකස් කර ඇති අතර ඒ සඳහා

1. අවමංගල සේවා ස්ථානයක් ස්ථාපනය කිරීම - මේ සඳහා දැනටමත් ස්ථාන 3 ක් පරීක්ෂාවට ලක්කර ඇති අතර අදාළ දේපල හිමියන් සමග සාකච්ඡා කර ඇත.
2. අවමංගල සේවා රථයක් මිළදී ගැනීම
3. අවමංගල සේවා කටයුතු පාරිභෝගික රක්ෂණ ක්‍රමය සමග සම්බන්ධ කිරීම

   මෙම කටයුතු සඳහා රුපියල් ලක්ෂ 400 ක් ආයෝජනය කිරීමට අපේක්ෂිතය.

## 11. ඉදිකිරීම් සේවා අංශය

සමිතිය මගින් සිදුකරනු ලබන ඉදිකිරීම් කටයුතු සහ බාහිර ඉදිකිරීම කොන්ත්‍රාත් ලබාගෙන කටයුතු කිරීම පිණිස සමිතියට අනුබද්ධව විධිමත් ඉදිකිරීම් සේවා අංශයක් ස්ථාපිත කිරීමට බලාපොරොත්තු වේ.

මෙමගින් විවිධ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ඉදිකිරීම් කටයුතු සඳහා සහභාගී වීමට කටයුතු කරනු ඇත.

## 12. නිෂ්පාදන සේවා අංශය

සමිතිය විසින් පසුගිය කාලය තුල ඇඹරුම්හල අංශයක් සහ ඒ ආශ්‍රිත නිෂ්පාදිත ඇසුරුම් අංශයක් පවත්වාගෙන ගිය අතර, එම ඇඹරුම්හල සහ අදාල ගොඩනැගිලි කුරුවිට ප්‍රාදේශිය සභාව මගින් ඉවත් කිරීමෙන් පසු මේ වන විට නිෂ්පාදන ඇසුරුම් අංශය අවම මට්ටමකින් පවත්වාගෙන යනු ලබයි. මෙම අංශය නැවත සුදුසු ගොඩනැගිල්ලක ස්ථාපනය කර අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර සපයා ගනිමින් ඵලදායී ඒකකයක් ලෙස පවත්වාගෙන යාම සඳහා අපේක්ෂා කෙරේ

එමගින් සමිතියේ වෙළඳ අවශ්‍යතාවයට ද්‍රව්‍ය සපයන අතර බාහිර තොග වෙළඳාම සඳහා ද්‍රව්‍ය නිකුත් කිරීම මගින් වෙළඳාම වර්ධනය කර ගැනීමටත් වැඩි ලාභ තීරුවක් සමිතිය වෙත ලබාගැනීමටත් හැකියාව පවතින අතර, නව රැකියා අවස්ථා ප්‍රමාණයක් ඇති කරලීමට හැකි වනු ඇත.

මේ සඳහා රුපියල් ලක්ෂ 12 ක් ආයෝජනය කිරීමට අපෙක්ෂිතය.

# 13. වැවිලි අංශය

අප බලප්‍රදේශය තුළ වාණිජ වැවිලි ප්‍රචලිතව ඇති අතර සමිතිය ඒ සදහා යොමු වීමක් සිදු වී නොමැති බැවින් 2026 වර්ෂයේදී වාණිජ වැවිලි ක්ෂේත්‍රය සදහා ආයෝජනය කිරීමට බලාපොරොත්තු වේ. ඒ අනුව,



1. තේ, රබර්, කුරුදු ආදි වාණිජ බෝග සහිත ඉඩමක් මිළදී ගැනීම
2. වැවිලි බෝග ආශ්‍රිත සේවා සදහා තාක්ෂණ සේවා සහ ශ්‍රමය සැපයීම




මේ සදහා රුපියල් ලක්ෂ 1000 ක් ආයෝජනය කිරීමට අපෙක්ෂිත අතර, ඒ සදහා විධිමත් තක්සේරු ක්‍රමවේදය අනුව කටයුතු කෙරෙනු ඇත.



## 14. මානව සම්පත් සංවර්ධන අංශය

සමිතියේ සමස්ථ කාර්යය මණ්ඩලය ආවරණය වන පරිදි හා ඉදිරි සේවා අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීම උදෙසා කාර්යක්ෂම සහ සඵලදායි සේවා නියුක්තිකයන් නිර්මාණය කෙරෙන විධිමත් සේවක පුහුණු සැලැස්මක් සම්පාදනය කරගනිමින් ඒ අනුව සියළුම සේවක මණ්ඩලය අවශ්‍ය පරිදි පුහුණු කිරීමට කටයුතු කෙරේ.

එසේම සමිතියේ දියුණුව සඳහා දායක වන සාමාජික ප්‍රජාව ඉලක්ක කරගනිමින් සමුපකාර ව්‍යාපාරය පිළිබඳව දැනුවත් කිරීම හා ඔවුන්ගේ දායකත්වය ලබාගැනීම උදෙසා විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. ප්‍රාදේශික කාරක සභික / මහා සභික නියෝජිතවරුන් උදෙසා සමුපකාර නායකත්වය පිලිබඳ පුහුණුව ලබාදීම සමුපකාරික අත්දැකීම හුවමාරු කරගැනීමට දේශිය විදේශිය පුහුණු සංචාර අවස්ථා ලබාදීමට අපේක්ෂා කෙරේ.

ප්‍රදේශයේ තරුණ ප්‍රජාව සමුපකාර ව්‍යාපාරය කෙරෙහි යොමු කර ගැනීම සඳහා සමුපකාර තරුණ පදනම නැවත ක්‍රියාත්මක කිරීමට කටයුතු කෙරේ. ප්‍රදේශයේ දූ දරුවන් අදාල ප්‍රාදේශික සමග සම්බන්ධ කරගනිමින් ළමා සමාජ පිහිටුවිමටත් එමගින් දරුවන් තුල සමුපකාරික ආකල්ප හා ගුණාංග ඇති කිරීමටත් අපේක්ෂා කෙරේ.

2026-2030 පස් අවුරුදු උපාය මාර්ගික සැලැස්ම සහ 2026 වාර්ෂික උපාය මාර්ගික සංවර්ධන සැලැස්මට අනුකූලව අවශ්‍ය මානව සම්පත සපුරාගැනීම සඳහා සමිතියේ පිරිස්බල තක්සේරුව සුදුසු පරිදි සංශෝධනය කිරීමට 2026 ආරම්භයේදීම කටයුතු කරනු ඇත.

එසේම වඩාත් කාර්යක්ෂම ඉහළ දැනුම සහිත කාර්යය මණ්ඩලයක් ස්ථාපනය කරගැනීම සඳහා පවත්නා වැටුප් ක්‍රමවේදය ඉහළ නැංවීමට අපෙක්ෂා කරන අතර, විශේෂිත සුදුසුකම් සහිත කාර්යය මණ්ඩලය සඳහා විශේෂ දිමනා සහිත ක්‍රමයක් ස්ථාපිත කිරීමට කටයුතු කෙරේ. තවද අදාළ තනතුරු වගකීම් ස්වභාවය මත විශේෂ දිමනා ක්‍රමවේදයක් හඳුන්වාදීම මගින් වඩාත් ප්‍රශස්ථ සේවයක් සදහා කාර්යය මණ්ඩලය අභිප්‍රේණය කිරීමට බලාපොරොත්තු වේ.

## 15. අලෙවි ප්‍රවර්ධන අංශය

සමිතිය සමස්ථයක් ලෙස සන්නාමකරණය සහ සමිතියේ විවිධ අංශ මගින් සපයනු ලබන සේවා ප්‍රවර්ධනය පිණිස අවශ්‍ය ප්‍රචාරණ කටයුතු සිදුකිරීම සඳහා විධිමත් අලෙවි ප්‍රවර්ධන අංශයක් ස්ථාපිත කිරීමට කටයුතු කරනු ඇත. මෙහිදී අදාළ ප්‍රවර්ධන කටයුතු සඳහා ඒ ඒ අංශ මගින් එම අංශවල ව්‍යාපාර ප්‍රවර්ධන අරමුදල් සම්පාදනය කරනු ඇත.

මෙමගින් Coop Kuruwita යන සන්නාමය වඩාත් ප්‍රචලිත කිරීම සහ අපගේ සේවා ප්‍රශස්ත මට්ටමකට ගෙන ඒමටත් අපෙක්ෂා කෙරේ.

## 16. සාමාජික සහ පොදු සුභසාධන අංශය

සමිතියේ සාමාජිකත්වයේ පොදු යහපත උදෙසා සහ වෙනත් පොදු කටයුතු සඳහා 10% ක වටිනාකමක් ශුද්ධ ලාභයෙන් වෙන් කෙරෙන අතර, එකී ලාභය ව්‍යවස්ථානුකූලව එම කටයුතු සඳහා වෙන් කර සාමාජික හා පොදු සුභසාධනය උදෙසා සක්‍රියව කටයුතු කිරීමට අපේක්ෂා කෙරේ. මෙහිදී සාමාජික පවුල්වල පොදු අවශ්‍යතා ප්‍රදේශයේ පොදු අවශ්‍යතා අවස්ථානුකූලව හඳුනාගනිමින් ඒ සඳහා වඩාත් සුදුසු ලෙස දායක වීමට අපේක්ෂා කෙරේ.

මීට අමතරව විවිධ දේශීය හා විදේශීය ආධාර ආයතනවල අනුග්‍රහය ලබා ගනිමින් බලප්‍රදේශය තුළ පොදු සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

## මානව සම්පත් සංවර්ධනය

6.1. **2026 වර්ෂය තුල අපේක්ෂිත කුසලතා සංවර්ධන, අධ්‍යාපන, පුහුණු වැඩසටහන් පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන්**

### සාමාජිකයන් දැනුවත් කිරීමේ වැඩසටහන්

| අනු අංකය | විස්තරය | ආවරණය වන සංඛ්‍යාව | වැඩසටහන් ගණන | අපේක්ෂිත මුදල රු. |
|---|---|---|---|---|
| 01 | ගරු මහසභා නියෝජිත මහත්ම/මහත්මීන්, ගරු කාරක සභා නියෝජිත මහත්ම/මහත්මීන් සඳහා ආකල්ප වර්ධන පුහුණු වැඩමුළු | 300 | 2 | 1500000/= |
| 02 | ගරු අධ්‍යක්ෂ මහත්ම/මහත්මීන් සඳහා පුහුණු වැඩමුළු | 9 | 2 | 250000/= |
| 03 | කාන්තා කමිටු සාමාජික මහත්මීන් සඳහා ආකල්ප සංවර්ධන වැඩමුළු හා සුභසාධන වැඩසටහන් | 60 | 2 | 600000/= |
| 04 | යෞවන සමාජ සාමාජික/සාමාජිකාවන් දැනුවත් කරීමේ පුහුණු වැඩමුළු | 300 | 1 | 450000/= |
| 06 | සමුපකාර නීතිය පිළිබඳ කළමණාකරණය දැනුවත් කිරීමේ වැඩසටහන් | 20 | 1 | 200000/= |
| | **එකතුව** | **689** | **8** | **3000000/=** |

## සේවකයන් ධාරිතා සංවර්ධන වැඩසටහන්

| අනු අංකය | විස්තරය | ආවරණය වන සංඛ්‍යාව | වැඩසටහන් ගණන | අපේක්ෂිත මුදල රු. |
|---|---|---|---|---|
| 01 | සමස්ථ කාර්යය මණ්ඩලය දැනුවත් කිරීම. | 130 | 2 | 300000/= |
| 02 | ග්‍රාමීය බැංකු සේවක පුහුණු වැඩසටහන් | 40 | 2 | 800000/= |
| 03 | ප්‍රාදේශික කළමණාකරුවන් සඳහා පුහුණු වැඩමුළු | 30 | 1 | 150000/= |
| 04 | ගිණුම් ලිපිකරුවන් සඳහා පුහුණු වැඩමුළු | 15 | 2 | 150000/= |
| 05 | විධායක නිළධාරී මහත්ම මහත්මීන් සඳහා පුහුණු වැඩමුළු | 9 | 2 | 200000/= |
| 06 | සමූපකාර සාමාන්‍යපෙළ සඳහා සහභාගී කරවීම. | 5 | 2 | 150000/= |
| 07 | සමූපකාර උසස්පෙළ සඳහා සහභාගී කරවීම. | 5 | 1 | 200000/= |
| 08 | ඉන්ධනහල් සේවක සේවිකාවන් සඳහා පුහුණු කිරීම් හා ආකල්ප සංවර්ධන වැඩසටහන් | 17 | 2 | 400000/= |
| 09 | විදේශ සංචාර මඟින් අධ්‍යාපන හා කුසලතා සංවර්ධනය (පරිස්කාර සඳහා) | | 1 | 500000/= |
| 10 | පරිගණක පාඨමාලා, ඩිප්ලෝමා පාඨමාලා | 10 | | 500000/= |
| | **එකතුව** | **221** | **15** | **4350000/=** |

## සීමාසහිත කුරුවිට විවිධ සේවා සමුපකාර සමිතිය - කුරුවිට

## 2025 ජනවාරි 01 සිට 2025 දෙසැම්බර් 31 දක්වා පිට ණය සීමාව

| අනු අංකය | විස්තරය | 2025.01.01සිට 2025.12.31 දක්වා රුපියල් ලක්ෂ |
|---|---|---|
| 1 | ගොඩනැගිලි දේපල ණය හා වාහන ණය | 1000 |
| 2 | සාමාජික නොවන තැන්පත් | 10000 |
| 3 | උපකරණ හා යන්ත්‍රසූත්‍ර | 900 |
| 4 | පාරිභෝගික ස්ථිර තැන්පත් සඳහා | 200 |
| 5 | පාරිභෝගික අංශයේ ගැණුම් සඳහා | 700 |
| 6 | කෝප්සිටි ගැණුම් සඳහා | 300 |
| 7 | ප්‍රාදේශික නවීකරණ හා ඉදිකිරීම් | 900 |
| | **එකතුව** | **14000** |

.....................
ගණකාධිකාරී

...............................
සාමාන්‍යාධිකාරී

## සීමාසහිත කුරුවිට විවිධ සේවා සමුපකාර සමිතිය - කුරුවිට

**2026 වර්ෂය සදහා අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා**

**අනුමැතිය සදහා ඉදිරිපත් කිරීම**

### පාරිභෝගික අංශය

### 1. නව කෝප්සිටි ස්ථාපිත කිරීම

i. හිග්ගස්හේන නගරය ආශ්‍රිතව සුදුසු ස්ථානයක් තෝරාගෙන කෝප්සිටි වෙළඳසැලක් ආරම්භ කිරීම සඳහා රුපියල් මිලියන 12 ක උපරිමයකට යටත්ව සිදුකිරීමට යෝජනා කරමු. මේ සඳහා වැයවන මුදල් සමිතියේ ග්‍රාමීය බැංකු අංශයේ අතිරික්ත මුදලින් වැය කිරීමට හෝ අවශ්‍ය වුවහොත් බාහිර බැංකු ණය මුදලක් ලබාගැනීමෙන් අදාළ වැය දැරීමට කටයුතු කිරීම සුදුසු බවට යෝජනා කරමු.

ii පැරඩයිස් මංසන්ධිය ආශ්‍රිතව සුදුසු ගොඩනැගිල්ලක් සපයා ගනිමින් නව කෝප්සිටි වෙළඳසැලක් ආරම්භ කිරීම සඳහා රුපියල් මිලියන 10 ක උපරිමයකට යටත්ව සිදු කිරීමට යෝජනා කරමු. මේ සඳහා වැයවන මුදල් සමිතියේ ග්‍රාමීය බැංකු අංශයේ අතිරික්ත මුදලින් වැය කිරීමට හෝ අවශ්‍ය වුවහොත් බාහිර බැංකු ණය මුදලක් ලබාගැනීමෙන් අදාළ වැය දැරීමට කටයුතු කිරීම සුදුසු බවට යෝජනා කරමු.

iii බටුහේන මංසන්ධිය ආශ්‍රිතව සුදුසු ගොඩනැගිල්ලක් සපයාගනිමින් නව කෝප්සිටි වෙළඳසැලක් ආරම්භ කිරීම සඳහා රුපියල් මිලියන 10 ක උපරිමයකට යටත්ව සිදු කිරීමට යෝජනා කරමු. මේ සඳහා වැයවන මුදල් සමිතියේ ග්‍රාමීය බැංකු අංශයේ අතිරික්ත මුදලින් වැය කිරීමට හෝ අවශ්‍ය වුවහොත් බාහිර බැංකු ණය මුදලක් ලබාගැනීමෙන් අදාළ වැය දැරීමට කටයුතු කිරීම සුදුසු බවට යෝජනා කරමු.

iv කුරුවිට නගරය ආශ්‍රිතව ප්‍රධාන කෝප්සිටියට අමතරව සුදුසු ගොඩනැගිල්ලක් සපයාගනිමින් නව කෝප්සිටි වෙළඳසැලක් ආරම්භ කිරීම සඳහා රුපියල් මිලියන 10 ක උපරිමයකට යටත්ව සිදු කිරීමට යෝජනා කරමු. මේ සඳහා වැයවන මුදල් සමිතියේ ග්‍රාමීය බැංකු අංශයේ අතිරික්ත මුදලින් වැය කිරීමට හෝ අවශ්‍ය වුවහොත් බාහිර බැංකු ණය මුදලක් ලබාගැනීමෙන් අදාළ වැය දැරීමට කටයුතු කිරීම සුදුසු බවට යෝජනා කරමු.

## 2. කුරුවිට කෝප්සිටි වෙළඳසැළ නවීකරණය කිරීම

කුරුවිට කෝප්සිටි වෙළඳසැලෙහි අවශ්‍යතාවය පරිදි ඉඩකඩ පුළුල් කිරීම සඳහා වර්ග අඩි 300 ක පමණ ප්‍රමාණයක කොටසක් එකතු කිරීම මගින් එළවළු, පළතුරු සහ මස් මාළු වෙළඳාම ප්‍රවර්ධනය කිරීමට යෝජනා කරමු. මේ සඳහා රුපියල් මිලියන 6 ක උපරිමයකට යටත්ව වැය දැරීමට හා අවශ්‍ය අරමුදල් කෝප්සිටි අංශයෙන් සපයා ගැනීමටද යෝජනා කරමු.

## 3. පාතගම ප්‍රාදේශිකය හා ග්‍රාමීය බැංකුව සුදුසු ස්ථානයක ස්ථාපිත කිරීම

පාතගම ප්‍රාදේශිකය පවත්වාගෙන ගිය සමිතිය සතු පැරණි ගොඩනැගිල්ල අබලන්වීම සහ පිහිටි ස්ථානය ව්‍යාපාරික ස්ථානයක් සඳහා යෝග්‍ය නොවන බව නිරීක්ෂණය වන බැවින් එකී ගොඩනැගිල්ල සහ ඉඩම ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමටත් ඒ අනුව ලබාගන්නා මුදල සහ අතිරේකව වැයවන මුදල සමිතිය මගින් වැයකර පාතගම ප්‍රාදේශිකය සහ ග්‍රාමීය බැංකුව ඉදිකිරීමට සුදුසු ඉඩමක් පාතගම මංසන්ධිය ආශ්‍රිතව සපයාගෙන ඒ තුළ නව ව්‍යාපාරික ගොඩනැගිල්ලක් ඉදිකර පාතගම ප්‍රාදේශිකය සහ ග්‍රාමීය බැංකුව ස්ථාපනය කිරීමටත් යෝජනා කරමු. මේ සඳහා රුපියල් මිලියන 10 ක උපරිමයකට යටත්ව වැය දැරීමට යෝජනා කරන අතර, දේපල අලෙවියෙන් ප්‍රතිපූර්ණය නොවන අගය ග්‍රාමීය බැංකු අංශයේ අතිරික්ත මුදලින් දැරීමටද යෝජනා කරමු.

## 4. ඉන්ධනල සඳහා නව පොම්ප 2 සපයාගැනීම

සමිතියට අයත් ඉන්ධනහල තුළ භාවිතා කරන පොම්ප 2013 වර්ෂයේ නවීකරණයේදී සපයන ලද ඒවා වන අතර, දිගුකාලීන භාවිතය තුළ ඒ සඳහා නව පොම්ප ස්ථාපනය කිරීමේ අවශ්‍යතාවයක් පවතී. මේ අනුව 2025 වර්ෂය තුළදී නව ඉන්ධන පොම්ප 2 ක් සපයන ලද අතර, 2026 වර්ෂය තුළදී ද අලුතින් 1” ඩුවෙල් ඉන්ධන පොම්ප 2 ක් ඉන්ධනහලට සපයාදීම සුදුසු බවට යෝජනා කරමු. ඒ සඳහා රුපියල් මිලියන 9 ක උපරිමයකට යටත්ව ඉන්ධනහල අංශයෙන් වැය දැරීමට අනුමැතිය ලබාදීම සුදුසු බවට යෝජනා කරමු.

## 5. මංචි හා යුනිලීවර් අලෙවි නියෝජිතධූර සඳහා ලොරි රථයක් ලබාගැනීම

මේ වන විට සමිතිය විසින් මංචි අලෙවි නියෝජිත ධූරය, යුනිලිවර් අලෙවි නියෝජිත ධූරය යටතේ රත්නපුර දිස්ත්‍රික්කයේ සමුපකාර සමිතිවල වෙළඳසැල් වෙත භාණ්ඩ බෙදාහැරීම සිදුකරනු ලබන අතර, ඉදිරියේදී නව වෙළඳනියෝජිතධූර කිහිපයක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. ඒ සඳහා අවශ්‍ය ප්‍රවාහන කටයුතු සිදුකිරීම සඳහා සුදුසු මෙට්ට්‍රික් ටොන් 2.5 ක ධාරිතාවයෙන් යුතු කුඩා ලොරි රථයක් සපයා ගැනීමටද ඒ

සඳහා රුපියල් මිලියන 8 උපරිමයකට යටත්ව වැය දැරීමට ද වැය වන මුදල් බාහිර බැංකු ණය මුදලක් ලෙස ලබාගැනීමටද යෝජනා කරමු.

## 6. තොග ගබඩාවේ සඳහා මෙට්‍රික් ටොන් 10 ධාරිතාවෙන් යුත් ලොරි රථයක් මිළදී ගැනීම

සමිතියට අයත් තොග ගබඩාවට අවශ්‍ය ද්‍රව්‍ය සැපයීම සහ තොග ගබඩාවේ සිට අපගේ වෙළඳසැල් වෙත භාණ්ඩ බෙදාහැරීම සඳහා දැනට භාවිතා කරන LM0132 දරණ ලොරි රථය දිගුකාලීන භාවිතය හේතුවෙන් යෝග්‍ය තත්ත්වයේ නොපවතින බැවින් එම ලොරි රථය වෙන්දේසි කර විකිණීමටත් එමගින් ලබාගන්නා මුදල සහ ඊට අමතරව වැය කළ යුතු මුදල බාහිර බැංකු ණයමුදලක් ලෙස ලබාගනිමින් රුපියල් මිලියන 20 ක උපරිමයකට යටත්ව වැය දරමින් අලුතින් මෙට්‍රික් ටොන් 10 ලොරි රථයක් ලබාගැනීම සුදුසු බවට යෝජනා කරමු.

## 7. ජංගම බඩුතොග බෙදාහැරීම සඳහා මෙට්‍රික් ටොන් 7.5 ධාරිතාවෙන් යුත් ලොරි රථයක් මිළදී ගැනීම

සමිතියට අයත් තොග ගබඩාවට ද්‍රව්‍ය සැපයීම සහ තොග ගබඩාවේ සිට ප්‍රදේශයේ බාහිර සිල්ලර වෙළඳසැල් වෙත ජංගම වෙළඳබඩු තොග බෙදාහැරීම සඳහා දැනට සුදුසු ලොරි රථයක් සමිතිය සතුව නොපවතින බැවින් ඒ සඳහා යෝග්‍ය වන මෙට්‍රික් ටොන් 7.5 ක ධාරිතාවයෙන් යුතු ලොරි රථයක් බාහිර බැංකු ණය මුදලක් ලබාගනිමින් සපයා ගැනීමටද ඒ සඳහා රුපියල් මිලියන 15 ක උපරිමයකට යටත්ව වැය දැරීමටද සුදුසු බවට යෝජනා කරමු.

## 8. සාමාජික සුභසාධනය වෙනුවෙන් කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය බිම් සකස් කිරීමේ යන්ත්‍රයක් සහ අස්වනු නෙළීමේ යන්ත්‍රයක් ලබාගැනීම

සමිතියේ සාමාජික සුභසාධනය හා ඔවුන්ගේ කෘෂිකාර්මික කටයුතුවලට සහයෝගය ලබාදීම සඳහා සහනදායි ගාස්තු අයකිරීමේ පදනමක් මත සේවා සැපයීමට කෘෂිකාර්මික බිම් සකස් කරන යන්ත්‍රයක් සහ කෘෂි අස්වනු නෙලීමේ යන්ත්‍රයක් රුපියල් මිලියන 15 ක උපරිමයකට යටත්ව ලබාගැනීමට ද ඒ සඳහා වැය වන මුදල් රජයෙන් හෝ වෙනත් රාජ්‍ය නොවන සංවිධාන මඟින් සිදුකරනු ලබන ව්‍යාපෘති ප්‍රධානයන් ලෙස ලබාගැනීමට ද ඒ අනුව අදාළ වියදම් දරා අවශ්‍ය උපකරණ සපයා ගනිමින් සාමාජික ප්‍රජාව වෙත පහසුකම් සැලසීමට යෝජනා කරමු.

## 9. බේකරි නිෂ්පාදන අලෙවිසැලක් ස්ථාපනය කිරීම

සමිතිය ඉදිරිපිට පවතින ATM යන්ත්‍රය ඉවත්කර එම ස්ථානයේ බේකරි නිෂ්පාදන අලෙවිසැලක් ආරම්භ කිරීම සුදුසු බවට යෝජනා කරන අතර, ඒ සඳහා රුපියල් මිලියන 1 ක උපරිමයකට යටත්ව ඉන්ධනහල ගිණුමෙන් මුදල් වැය කර සිදුකිරීමට යෝජනා කරමු.

## 10. සුදගල ප්‍රාදේශිකය නව ස්ථානයක ස්ථාපනය කිරීම

සමිතියට අයත් අංක 12 සුදගල ප්‍රාදේශිකය ඉදිකිරීම් සඳහා සමිතිය විසින් මිළදී ගත් ඉඩම් කොටස තුළ ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකිරීමට මේ වන විට මූලික ඇස්තමේන්තු සකස් කිරීම, ඉඩම නිරවුල් කර භූමිය තුළ පිහිටි ගස් ඉවත් කර ඉදිකිරීම් ආරම්භ කිරීමට මූලික කටයුතු සිදුකර ඇත. අදාළ ඉඩමේ පවතින අධික බෑවුම් පිහිටීම නිසා ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වන පිරිවැය ඉහළයාමක් සිදුවී ඇත. මේ අනුව රුපියල් මිලියන 4 ක උපරිමයකට යටත්ව අවශ්‍ය වියදම් දරමින් සුදගල ප්‍රාදේශිකය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමට යෝජනා කරන අතර, ඒ සඳහා සමිතියේ ග්‍රාමීය බැංකු අංශයෙන් ණය මුදලක් ලබාගෙන අවශ්‍ය අරමුදල් සපයා ගැනීම සුදුසු බවට යෝජනා කරමු.

## 11. සන්නිවේදන පියසක් ස්ථාපනය කිරීම

සමිතියට අයත් කරපිංචවත්ත ග්‍රාමීය බැංකුව සහ ප්‍රාදේශිකය පිහිටි ගොඩනැගිල්ලට සම්බන්ධ කර සන්නිවේදන පියසක් ආරම්භ කිරීම සඳහා එම ප්‍රාදේශික කාරක සභාව විසින් කරන ලද යෝජනාව අනුව රුපියල් මිලියන 2.5 ක උපරිමයකට යටත්ව මුදල් වැයකර සන්නිවේදන පියස සඳහා වන ගොඩනැගිල්ල ඉදිකිරීමට ද ඒ සඳහා වන පිරිවැය ප්‍රතිපූර්ණය කරගැනීම සඳහා බාහිර බැංකු ණය මුදලක් ලබාගැනීම හෝ සමිතියේ ග්‍රාමීය බැංකු අංශයේ අතිරික්තයෙන් මුදල වැයකර සිදුකිරීමට යෝජනා කරමු.

**12.** සමිතිය විසින් පවත්වාගෙන යනු ලබන වලදුර ප්‍රාදේශිකය දැනට කුලී ගොඩනැගිල්ලක පවත්වාගෙන යනු ලබයි. මේ සඳහා සුදුසු ඉඩමක් ලබාගෙන වෙළඳසැල සඳහා අවශ්‍ය ගොඩනැගිල්ලක් ඉදිකිරීමට රු මිලියන 04ක උපරිමයකට යටත්ව මුදල් වැය කර සිදු කිරීම සුදුසු බවට යෝජනා කරමු. මේ සඳහා සමිතියේ ග්‍රාමීය බැංකු අංශයේ අතිරික්තයෙන් මුදල් වැය කිරීමට හෝ වෙනත් බාහිර ණය මුදලක් ලබාගෙන මුදල් ආයෝජනය කිරීමට කටයුතු කිරීමට සුදුසු බවට යෝජනා කරමු.

13. සමිතියේ ප්‍රධාන කාර්යාලයේ ශාලාව වායු සමීකරණය කර යහපත් කාර්යාලය පද්ධතියක් ඉදිකිරීම සඳහා අවශ්‍ය පරිදි ප්‍රධාන කාර්යාලයේ නවීකරණය කටයුතු රු මිලියන 7.5ක උපරිමයක් යටතේ සිදු කිරීම සුදුසු බවට යෝජනා කරමු. මේ සඳහා සමිතියේ ග්‍රාමීය බැංකු අංශයේ අතිරික්ත ගිණුමෙන් මුදල් වැය කිරීමට හෝ බාහිර බැංකු ණය මුදලක් ලබා ගනිමින් අවශ්‍ය අරමුදල් සම්පාදනය කර ගැනිමට යෝජනා කරමු.

14. සමිතියට අයත් පැරණි කාර්යාලයේ පිහිටි ඉඩම තුළ පවතින ගොඩනැගිල්ල ඉවත් කර එම භූමිය තුළ සිවිමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට ද ඒ අනුව ඉදිරියේ දි සමිති කාර්යාලය එම ගොඩනැගිල්ලට මාරු කිරීමටත් ඉහල මහල විධිමත් රැස්වීමක් ශාලාවක් ලෙස සහ අවස්ථානුකූලව ව්‍යාපාරිකමය අවශ්‍යතා සඳහා යොදා ගැනිමට හැකි වන පරිදි නව ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා අවශ්‍ය මුලික කටයුතු සුදානම් කිරීම සඳහා රු මිලියන 2.5ක උපරිමයට යටත්ව මුදල් වැය කිරීමට ද අනුමැතිය ලබාදිමට සුදුසු බවට ද යෝජනා කරමු. මේ සඳහා සමිතියේ ග්‍රාමීය බැංකු අංශයේ අතිරික්ත මුදලින් මුදල් වැය කිරීමට යෝජනා කරමු.

## ග්‍රාමීය බැංකු අංශය

15. **ග්‍රාමීය බැංකු අංශය සඳහා වෑන් රථයක් මිළදී ගැනීම**

සමිතියේ ග්‍රාමීය බැංකු අංශයේ රාජකාරී අවශ්‍යතා සහ සමිතියේ අනෙකුත් රාජකාරීමය කටයුතු සඳහා යෙදෙන අයගේ ප්‍රවාහන අවශ්‍යතා සඳහා සුදුසු වන පරිදි ටොයෝටා වර්ගයේ වෑන් රථයක් ග්‍රාමීය බැංකු අංශයේ අතිරික්ත මුදලින් රුපියල් මිලියන 25 ක උපරිමයකට යටත්ව මුදල් වැයකර සපයා ගැනිමට යෝජනා කරමු.

16. **ග්‍රාමීය බැංකු අංශය සඳහා අවශ්‍යතාවය මත උපකරණ ලබාගැනීම**

ග්‍රාමීය බැංකු අංශයේ ක්‍රියාකාරිත්වය මත කාලිනව අවශ්‍ය වන උපකරණ අවශ්‍යතා සම්පූර්ණ කරගැනිම සඳහා රුපියල් මිලියන 3 ක උපරිමකයට යටත්ව ග්‍රාමීය බැංකු අංශයේ අතිරික්ත ගිණුමෙන් මුදල් වැයකර ලබාගැනිම සුදුසු බවට යෝජනා කරමු.

17. **ග්‍රාමීය බැංකු සඳහා වායුසමීකරණ පහසුකම් ලබාගැනීම**

එරත්න, තෙප්පනාව, කරපිංචවත්ත, පැරඩයිස්වත්ත ග්‍රාමීය බැංකු සඳහා වායුසමීකරණ පහසුකම් ලබාදිමට රුපියල් මිලියන 4 ක උපරිමයකට යටත්ව ග්‍රාමීය බැංකු අංශයේ අතිරික්ත ගිණුමෙන් මුදල් වැයකර ලබාගැනිම සුදුසු බවට යෝජනා කරමු.

## 18. ග්‍රාමීය බැංකු සඳහා ජෙනරේටර් ලබාගැනීම

එරත්න, පණුකැරැප්පිටිය, පැරඩයිස්වත්ත, තෙප්පනාව යන ග්‍රාමීය බැංකු සඳහා පොදු විදුලි සැපයුම් අක්‍රිය වන අවස්ථාවන්හිදී ගණුදෙනු පවත්වාගෙන යාමට අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා රුපියල් මිලියන 5 ක උපරිමයකට යටත්ව ග්‍රාමීය බැංකු අංශයේ අතිරික්ත ගිණුමෙන් මුදල් වැය කර ජෙනරේටර් යන්ත්‍ර 4 ක් ලබාගැනීම සුදුසු බවට යොජනා කරමු.

## 19. ග්‍රාමීය බැංකුවල අභ්‍යන්තර පරිශ්‍ර නවීකරණය කිරීම

පණුකැරැප්පිටිය, එරත්න, කුරුවිට, කරපිංචවත්ත, පැරඩයිස්වත්ත, දෙවිපහළ, තෙප්පනාව යන ග්‍රාමීය බැංකු කාලිනව ගැලපෙන පරිදි අභ්‍යන්තර හා බාහිර පරිශ්‍ර නවීකරණ කටයුතු සිදුකිරීම සඳහා රුපියල් මිලියන 15 ක උපරිමයකට යටත්ව ග්‍රාමීය බැංකු අංශයේ අතිරික්ත ගිණුමෙන් මුදල් වැයකර සිදුකිරීම සුදුසු බවට යෝජනා කරමු.

## 20. නිවාස ව්‍යාපෘතිය සඳහා ආයෝජනය

වර්තමාන මුල්‍ය වෙළඳපල සැලැකිල්ලට ගැනිමේදී ග්‍රාමීය බැංකු අංශයේ ස්ථාවර තැන්පත් ආයෝජනය සඳහා ලැබෙන පොලි අනුපාතය පහළයාම හේතුවෙන් පොලි ආදායම ඉතා විශාල වශයෙන් අඩුවීම නිසා විකල්ප ආදායම් මාර්ග සඳහා ග්‍රාමීය බැංකු අතිරික්තය ආයෝජනය කිරිම කාලින අවශ්‍යතාවයක් වේ. එම නිසා ග්‍රාමීය බැංකු අංශයෙන් ක්‍රියාත්මක කරන නව ව්‍යාපෘතියක් ලෙස ඉඩම් මිළදි ගෙන නිවාස හෝ නිවාස ව්‍යාපෘති ආරම්භ කර සහනදායි ගෙවීමේ පදනම මත හෝ අත්පිට මුදලට පාරිභෝගික ජනතාවට ලබාදීම සුදුසු බවට යෝජනා කරමු. මේ සඳහා රුපියල් මිලියන 35 ක උපරිමයකට යටත්ව ග්‍රාමීය බැංකු අංශයේ අතිරික්ත ගිණුමෙන් මුදල් වැයකර සිදුකිරීම සුදුසු බවට යෝජනා කරමු.

## 21. දෙවන පොලී ප්‍රතිදාන ගෙවීම

සමිතියේ ග්‍රාමීය බැංකු අංශයේ ඉතිරි කිරීම් ගිණුම්වල මුදල් තැන්පත් කරන ලද ගණුදෙනුකරුවන් සඳහා ලබාදුන් පොලියට අමතරව 0.5% ක දෙවන පොලි ප්‍රතිදානයක් ලබාදීමට තිරණය කර ඇත. ඒ අනුව සමිතියේ ග්‍රාමීය බැංකු ශාඛාවල ඉතිරි කිරීමේ ගිණුම් හිමි තැන්පත්කරුවන් වෙනුවෙන් 2015 වර්ෂය සඳහා ඉතිරි කිරීමේ ගිණුම් 2317 ක් වෙත රුපියල් 3682101 ක මුදලක් ගෙවිය යුතු බවට ගණනය කර ඇත එසේම 2016 2017, 2018 යන වර්ෂ සඳහාද ගෙවිය යුතු දෙවන පොලි ප්‍රතිදාන වටිනාකම් ගණනය කර ගැනීමෙන් පසු එකි මුදල් අදාල ගිණුම් හිමියන් වෙත දෙවන පොලි ප්‍රතිදාන ලෙස ගෙවීමට කටයුතු කිරීම සුදුසු බවට මෙම මහ සභාවට යෝජනා කරමු.

**22. සංචාරක සේවා සපයන ආයතනයක් පිහිටුවීම**

දිවයිනේ සංචාරක ප්‍රදේශ වශයෙන් වැදගත් වන කතරගම, අනුරාධපුර, නුවරඑළිය හෝ වෙනත් සුදුසු ප්‍රදේශ ඉලක්ක කරගනිමින් සමිතියේ නව ව්‍යාපාරික අංශයක් වශයෙන් දේශීය හා විදේශීය සංචාරකයන් වෙනුවෙන් නිවාඩු නිකේතන ආරම්භ කිරීමේ ව්‍යාපෘතියක් රුපියල් මිලියන 15 ක මුදල් ආයෝජනය කරමින් ආරම්භ කිරීමට යෝජනා කරමු. මේ සඳහා වැය වන පිරිවැය සමිතියේ ග්‍රාමීය බැංකු අංශයේ අතිරික්තයෙන් ලබාගැනීමට හෝ වෙනත් බාහිර බැංකු මුදලක් ලෙස ලබාගෙන සිදුකිරීමට යෝජනා කරමු.

**23. ක්‍රීඩා හා සෞඛ්‍ය සේවා මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම**

සමිති බල ප්‍රදේශයේ ප්‍රජාවගේ ක්‍රීඩා කුසලතාවයන් වැඩිදියුණු කිරීම සහ ඔවුන්ගේ සෞඛ්‍ය නගා සිටුවීම සඳහා ප්‍රාදේශික බල ප්‍රදේශ කේන්ද්‍ර කරගනිමින් පවතින ක්‍රීඩා හා සෞඛ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් මිලියන 2 ක උපරිමයකට යටත්ව සමිතියේ ග්‍රාමීය බැංකු අංශයේ අතිරික්ත ගිණුමෙන් මුදල් වැය කර සිදුකිරීම සුදුසු බවට යෝජනා කරමු.

**24. අවමංගල සේවා සපයන ස්ථානයක් ස්ථාපිත කිරීම**

සමිති බල ප්‍රදේශය තුල හා ආසන්න ප්‍රජාවගේ අවමංගල්‍ය සේවා අවශ්‍යතා ඉටුකිරීම වඩාත් සාධාරණ ලෙස මැදිහත්ව කටයුතු කරන අවමංගල සේවා අංශයක් බල ප්‍රදේශයේ සුදුසු ස්ථානයක් සපයා ගනිමින් ආරම්භ කිරීමට යෝජනා කරමු. මේ සඳහා රුපියල් මිලියන 40 ක උපරිමයකට යටත්ව සමිතියේ ග්‍රාමීය බැංකු අංශයේ අතිරික්තයෙන් මුදල් වැය කිරීමට හෝ බාහිර බැංකු ණය මුදලක් ලෙස සපයාගෙන ආයෝජනය කිරීම සුදුසු බැව් යෝජනා කරමු.

**25. නිෂ්පාදන සේවා අංශයක් ස්ථාපිත කිරීම**

සමිතියේ නිෂ්පාදන සේවා අංශය වැඩි දියුණු කිරීමටත්, ඒ සඳහා අවශ්‍ය උපකරණ සපයා ගනිමින් සුදුසු ස්ථානයක නිෂ්පාදන සේවා අංශයක් ආරම්භ කිරීමටත් රුපියල් මිලියන 5 ක උපරිමයකට යටත්ව මුදල් වැයකර සිදු කිරීම සුදුසු බවට යෝජනා කරමු. මේ සඳහා වැය වන මුදල ග්‍රාමීය බැංකු අංශයේ අතිරික්ත ගිණුමෙන් වැය කිරීමට හෝ බාහිර බැංකු ණය මුදලක් ලෙස ලබාගෙන ආයෝජනය කිරීමට යෝජනා කරමු.

**26. වාණිජ වැවිලි බෝග වගාකිරීමේ ව්‍යාපෘතියක් ස්ථාපිත කිරීම**

සමිති බල ප්‍රදේශය තුළ ව්‍යාප්ත වී ඇති වැවිලි බෝග වගා කිරීම සඳහා සුදුසු ඉඩම් කොටසක් මිළදී ගෙන ඒ තුළ සුදුසු පරිදි වැවිලි බෝග වගා කිරීම සඳහා ව්‍යාපෘතියක්

ක්‍රියාත්මක කිරීමටත්, මේ සඳහා රුපියල් මිලියන 100 ක උපරිමයකට යටත්ව බාහිර බැංකු ණය මුදලක් ලබාගනිමින් මුදල් ආයෝජනය කිරීම සුදුසු බවටත් යෝජනා කරමු.

**27.** සමිතියේ ග්‍රාමීය බැංකු අංශය මේ වන විට සම්පූර්ණයෙන් පරිගණකගත කර ක්‍රියාකාරීව පවත්වාගෙන යනු ලබයි. එසේම තොග ගබඩාව, කෝප්සිටිය මංචි අලෙවි නියෝජිත අංශය හා යුනිලිවර් අලෙවි නියෝජිත අංශය යන ව්‍යාපාරික ස්ථාන මේ වන විට පරිගණකගත කර මෙහෙයුම් කටයුතු සිදුකරනු ලබයි. එසේම පසුගිය 2025 වර්ෂය තුළදී සමිති කාර්යාලීය ගිණුම් අංශයේ F -28 ගිණුම්කරණ කාර්යයට අදාළව කාර්යය මණ්ඩලයට අදාළ කටයුතු පරිගණකගත කිරීම සිදුකරමින් පවතී. මේ අනුව එම සියළු අංශ සහ දැනට පරිගණකගත කර නොමැති අනෙකුත් සියලුම ව්‍යාපාරික ස්ථාන සියල්ල ආවරණය වන පරිදි පරිගණකගත කර ඊට අදාළ සියලුම ගිණුම්කරණ කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය උපකරණ සපයා ගැනීම සහ ඊට අදාළ අනෙකුත් කටයුතු වෙනුවෙන් රුපියල් මිලියන 7.5 ක උපරිමයකට යටත්ව වැය දරා සිදුකිරීම සුදුසු බවත් මේ සඳහා අවශ්‍ය වියදම් සමිතියේ ග්‍රාමීය බැංකු අංශයෙන් අතිරික්තයෙන් දැරීම සුදුසු බවත් මෙම මහසභාවට යෝජනා කරමු.

**28. පිළිගත් කාරක නියෝග මාලාව සංශෝධනය කිරීම - සාමාජික උපරිම ණය සීමාව රුපියල් ලක්ෂ 10 දක්වා වැඩි කිරීම -**

අප සමිතියේ සාමාජිකත්වය සඳහා මේ වනවිට පුද්ගල ඇප මත රු. 500000/= දක්වා ණය මුදල් ලබාදීමට සමිතියේ ගරු මහසභාවේ අනුමැතිය පරිදි හා සමුපකාර සංවර්ධන කොමසාරිස්තුමාගේ අනුමැතිය මත කටයුතු කර ඇත.

වර්තමාන මූල්‍ය වෙළඳපල ගණුදෙනුකරුවන්ගේ අවශ්‍යතාවයන් සහ තරඟකාරී අනෙකුත් බැංකු හා මූල්‍ය ආයතනවලින් ලබාදෙන ණය පහසුකම් පිළිබඳව සලකා බැලීමේදී අප සමිතිය වෙතින් රු. 500000/= ක ණය මුදලක් ලබාගෙන අදාළ වාරික ගෙවීමේ ශක්‍යතාවය පවතින ගණුදෙනුකරුවන් සහ දැනට රජයේ හෝ පෞද්ගලික අංශයේ ස්ථිර රැකියාවක නියුතු වැටුපෙන් රු.1000000/= ක ණය මුදල සඳහා වාරික ගෙවීමේ ශක්‍යතාවය පවතින ගණුදෙනුකරුවන් වෙත රු. 1000000/= දක්වා උපරිමයට යටත්ව ණය මුදල් නිකුත් කිරීම සඳහා කටයුතු කිරීම සුදුසු බවට 2025.08.21 දිනැති ගරු අධ්‍යක්ෂ මණ්ඩලයේ දී තිරණය කරන ලදි.

ඒ අනුව ණය ලබාදීම සඳහා සමිතිය පිළිගත් ග්‍රාමීය බැංකු කාර්යය රීති මාලාවේ අංක 2.11.1 වගන්තිය පරිදි සංශෝධනය කිරීමට තිරණය කරන ලදි.

2.11.1. සාමාජික පුද්ගල ඇප දෙකකින් පමණක් සුරැකුම් කල ණය උපරිම සීමාව රු. 500000/= කි.

**සංශෝධනය කිරීමට යොජනා කරන ආකාරය**

**2.11.1** සාමාජික පුද්ගල ඇප දෙකකින් පමණක් සුරැකුම් කළ ණය උපරිම සීමාව

රු.1000000/= කි.

මේ අනුව කටයුතු කිරීම සඳහා සමිතියේ ගරු මහසභාවේ අනුමැතිය ලබාදෙන ලෙස ගරු අධ්‍යක්ෂක මණ්ඩලය විසින් මෙම මහසභාවට යෝජනා කරමු.

**29. සමිතිය පිළිගත් අතුරු ව්‍යවස්ථාවේ 35 වන වගන්තිය සංශෝධනය කිරීම**

අතුරු ව්‍යවස්ථාවේ පවතින ආකාරය

**V වන කොටස**

**කළමණාකරණය**

**35. අධ්‍යක්ෂක මණ්ඩලය**

(1) සමිතියේ කටයුතු කළමණාකරණය සඳහා අධ්‍යක්ෂක මණ්ඩලයක් සිටිය යුතුය. එය සමිතියේ සාමාජිකයන් නව දෙනෙකුගෙන් සමන්විත වේ. අධ්‍යක්ෂකවරුන් හත් දෙනෙක් සමිතියේ වාර්ෂික හෝ විශේෂ මහසභා රැස්වීමකදී තෝරාපත් කරගත යුතු අතර දෙදෙනෙක් සමිතියේ සභාපති තැන විසින් ඒ සඳහා විශේෂයෙන් කැඳවනු ලැබූ කාන්තා කටයුතු පිළිබඳ ප්‍රාදේශික කාරක සභිකයන්ගේ රැස්වීමකදී ඔවුන් විසින් ඔවුන් අතුරෙන් තෝරාපත්කර ගත යුතුය. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ අවශ්‍ය අධ්‍යක්ෂකවරුන් සංඛ්‍යාව තෝරාපත් කිරීම සඳහා නිසි පරිදි යෝජනා ස්ථිරත්වයක් කරනු ලැබූ අපේක්ෂකයන්ගේ නම් මහසභා රැස්වීමට ඉදිරිපත් කළ යුතුය. ඉදිරිපත් වී ඇති අපේක්ෂකයන්ගේ සංඛ්‍යාව හතකට වැඩි වූ විට එක් නියෝජිතයෙකුට ඡන්ද හත බැගින් හිමිවන අතර එක් අපේක්ෂකයෙකු වෙනුවෙන් පාවිච්චි කළ හැකි වන්නේ එක් ඡන්දයක් පමණි. පිළිවෙලින් වැඩිම ඡන්ද ගණනක් ලබා ඇති හත්දෙනා තේරී පත්වී ඇති සේ ප්‍රකාශ කළ යුතුය. අධ්‍යක්ෂකවරුන් තෝරාපත් කිරීම රහස් ඡන්දයෙන් පමණක් සිදුකළ යුතුය.

(2) මෙහි මින්මතු සඳහන් අන්දමට අධ්‍යක්ෂක නිලය අවසන්වීම නිසා හෝ මහසභාව විසින් නිලයෙන් ඉවත්කරනු ලැබීම නිසා නොවේනම් අධ්‍යක්ෂකවරයෙකුගේ නිල කාලය අවුරුදු තුනක් වන්නේය.

(3) 28(3) අතුරු ව්‍යවස්ථාව යටතේ ප්‍රාදේශික කාරක සභාවට තෝරා පත්කරනු ලැබීමට නුසුදුස්සකු වන කිසිවෙකු හෝ පාර්ලිමේන්තුවේ පළාත් සභාවක, මහ නගර සභාවක,

නගර සභාවක හෝ ප්‍රාදේශීය සභාවක මන්ත්‍රීවරයෙකු වන කිසිම අයෙකු අධ්‍යක්ෂකවරයෙකු වශයෙන් නිල දැරීමටද නොහැකි වේ. තෝරාපත්කර ගන්නා සෑම අධ්‍යක්ෂකවරයෙකුම එකී තේරී පත්වීමේ දිනයේ සිට මාස තුනක් ඇතුලත හා ඉන් අනතුරුව එක් එක් අනුක්‍රමික වසරකට මාර්තු මස 31 වන දිනට පැවති පරිදි ජූලි 31 දිනට පෙර සමුපකාර නීතියේ විධිවිධානයන්ට අනුකූලව තමන්ගේ නම හා තම කාලත්‍රයාගේ මෙන්ම දරුවන්ගේ ද වත්කම් සහ බැරකම් ප්‍රකාශයට පත්කළ යුතුය.

(4) පහත සඳහන් කරුණක් නිසා අධ්‍යක්ෂකවරයෙකුගේ නිලය ඒ හේතුවෙන්ම නැති වන්නේය.

(අ) සමිතියේ සාමාජිකත්වය නැතිවීම.

(ආ) ඉල්ලා අස්වීම, ඉල්ලා අස්වීම වලංගු වන්නේ ඉල්ලා අස්වීමේ ලිපිය ප්‍රධාන ලේකම්ට හෝ ඔහු නොමැති නම් සාමාන්‍යාධිකාරී තැනට ලැබුන දින සිට දින තිහක් ගත වූ පසුවය.

(ඇ) නීතිය අනුව නුසුදුස්සකු වීම.

(ඈ) මහසභා රැස්වීමකට ඉදිරිපත් කරනු ලැබූ විශ්වාසභංග යෝජනාවකට විරුද්ධව කරුණු කියා සිටීමට අවස්ථාවක් දීමෙන් පසු සම්මත වූ යෝජනාවක් මගින් නිලයෙන් ඉවත් කරනු ලැබීම.

(ඉ) පිළිගත හැකි ප්‍රමාණවත් හේතු නොමැතිව පිට පිටම අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් වාර 03 කට නොපැමිණීම නිසා අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමකදී සම්මත කරගත් යෝජනාවක් මගින් නිලයෙන් ඉවත් කරනු ලැබීම. එබදු අවස්ථාවක එකී යෝජනාව සාකච්ඡාවට භාජනය කරනු ලබන අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම පැවැත්වීමට නියමිත දිනට දින හතකටවත් කලින් එකී අධ්‍යක්ෂකවරයාට එම යෝජනාව පිළිබඳව දැනුම් දී තිබිය යුතුය.

(ඊ) සමුපකාර නීතියට අනුව වත්කම් හා බැරකම් ප්‍රකාශ නොකිරීම හෝ ප්‍රකාශ කරන ලද වත්කම් බැරකම් හෝ සාවද්‍ය බව හෙලිවීම.

(උ) පාර්ලිමේන්තුවේ පළාත් සභාවක, මහනගර සභාවක, නගර සභාවක හෝ ප්‍රාදේශීය සභාවක මන්ත්‍රීවරයෙකු වශයෙන් තේරී පත්වීම.

(5) අධ්‍යක්ෂක මණ්ඩලයේ පුරප්පාඩුවක් ඇති වූ විට, එකී පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත 1 වන උප වගන්තියේ සඳහන් අන්දමට සාමාජිකයකු තෝරාපත්කර ගැනීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩල විසින් විශේෂ මහසභා රැස්වීමක් කැඳවිය යුතුය. ඉහත කී අන්දමට ස්ථිර වශයෙන් අධ්‍යක්ෂකවරයෙකු තෝරාපත්කර ගන්නා තෙක් ඉහත

03 වන උප වගන්තිය අනුව නුසුදුස්සකු නොවන තැනැත්තෙක් තාවකාලිකව එකී පුරප්පාඩුව පිරවීම සඳහා පත්කර ගැනීමට අධ්‍යක්ෂක මණ්ඩලයට බලය තිබේ. කෙසේ වෙතත් ඒ අන්දමට තෝරා පත්කරනු ලබන අධ්‍යක්ෂකවරයෙකුගේ ධූරය මහසභාවේ අනුමැතිය නොලැබී තෙමසක් ඉකුත්වීමත් සමගම අහෝසි වන්නේය.

**සංශෝධනය විය යුතු ආකාරය**

**35. අධ්‍යක්ෂක මණ්ඩලය**

(1) සමිතියේ කටයුතු කළමණාකරණය සඳහා අධ්‍යක්ෂක මණ්ඩලයක් සිටිය යුතුය. එය සමිතියේ සාමාජිකයන් නව දෙනෙකුගෙන් සමන්විත වේ. අධ්‍යක්ෂකවරුන් හත් දෙනෙක් සමිතියේ වාර්ෂික හෝ විශේෂ මහසභා රැස්වීමකදී තෝරාපත් කරගත යුතු අතර දෙදෙනෙක් සමිතියේ සභාපති තැන විසින් ඒ සඳහා විශේෂයෙන් කැඳවනු ලැබූ කාන්තා කටයුතු පිළිබද ප්‍රාදේශික කාරක සභිකයන්ගේ රැස්වීමකදී ඔවුන් විසින් ඔවුන් අතුරෙන් තෝරාපත්කර ගත යුතුය. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ අවශ්‍ය අධ්‍යක්ෂකවරුන් සංඛ්‍යාව තෝරාපත් කිරීම සඳහා නිසි පරිදි යෝජනා ස්ථිරත්වයක් කරනු ලැබූ අපේක්ෂකයන්ගේ නම් මහසභා රැස්වීමට ඉදිරිපත් කළ යුතුය. ඉදිරිපත් වී ඇති අපේක්ෂකයන්ගේ සංඛ්‍යාව හතකට වැඩි වූ විට එක් නියෝජිතයෙකුට ඡන්ද හත බැගින් හිමිවන අතර එක් අපේක්ෂකයෙකු වෙනුවෙන් පාවිච්චි කළ හැකි වන්නේ එක් ඡන්දයක් පමණි. පිළිවෙළින් වැඩිම ඡන්ද ගණනක් ලබා ඇති හත්දෙනා තේරී පත්වී ඇති සේ ප්‍රකාශ කළ යුතුය. අධ්‍යක්ෂකවරුන් තෝරාපත් කිරීම රහස් ඡන්දයෙන් පමණක් සිදුකළ යුතුය.

(2) මෙහි මින්මතු සඳහන් අන්දමට අධ්‍යක්ෂක නිලය අවසන්වීම නිසා හෝ මහසභාව විසින් නිලයෙන් ඉවත්කරනු ලැබීම නිසා නොවේනම් අධ්‍යක්ෂකවරයෙකුගේ නිල කාලය අවුරුදු තුනක් වන්නේය. තවද, දැනට සිටිනු ලබන අධ්‍යක්ෂ මණ්ඩලයේ සියළුම දෙනා ධූරයෙන් ඉල්ලා අස්වීම හෝ නිශ්චිත නෛතික ක්‍රමවේදයක් යටතේ ධූරයෙන් ඉවත් කිරීම යනාදී හේතූන් මත අධ්‍යක්ෂ මණ්ඩලයේ සියළු ධූරවල පුරප්පාඩුවක් ඇතිවුවහොත් ඒ අනුව නිත්‍යානුකූලව කැඳවනු ලබන මහසභාවකදී තෝරාපත්කර ගන්නා නව අධ්‍යක්ෂ මණ්ඩලයේ නිල කාලය ඔවුන් පත්වූ දින සිට වර්ෂ 3 ක් ඉදිරියට වලංගු වන්නේය.

(3) 28(3) අතුරු ව්‍යවස්ථාව යටතේ ප්‍රාදේශික කාරක සභාවට තෝරා පත්කරනු ලැබීමට නුසුදුස්සකු වන කිසිවෙකු හෝ පාර්ලිමේන්තුවේ පළාත් සභාවක, මහ නගර සභාවක, නගර සභාවක හෝ ප්‍රාදේශීය සභාවක මන්ත්‍රීවරයෙකු වන කිසිම අයෙකු

අධ්‍යක්ෂකවරයෙකු වශයෙන් නිල දැරීමටද නොහැකි වේ. තෝරාපත්කර ගන්නා සෑම අධ්‍යක්ෂකවරයෙකුම එකී තේරී පත්වීමේ දිනයේ සිට මාස තුනක් ඇතුලත හා ඉන් අනතුරුව එක් එක් අනුක්‍රමික වසරකට මාර්තු මස 31 වන දිනට පැවති පරිදි ජූලි 31 දිනට පෙර සමූපකාර නීතියේ විධිවිධානයන්ට අනුකූලව තමන්ගේ නම හා තම කාලත්‍රයාගේ මෙන්ම දරුවන්ගේ ද වත්කම් සහ බැරකම් ප්‍රකාශයට පත්කළ යුතුය.

(4) පහත සඳහන් කරුණක් නිසා අධ්‍යක්ෂකවරයෙකුගේ නිලය ඒ හේතුවෙන්ම නැති වන්නේය.

(අ) සමිතියේ සාමාජිකත්වය නැතිවීම.

(ආ) ඉල්ලා අස්වීම, ඉල්ලා අස්වීම වලංගු වන්නේ ඉල්ලා අස්වීමේ ලිපිය ප්‍රධාන ලේකම්ට හෝ ඔහු නොමැති නම් සාමාන්‍යාධිකාරී තැනට ලැබුන දින සිට දින තිහක් ගත වූ පසුවය.

(ඇ) නීතිය අනුව නුසුදුස්සකු වීම.

(ඈ) මහසභා රැස්වීමකට ඉදිරිපත් කරනු ලැබූ විශ්වාසභංග යෝජනාවකට විරුද්ධව කරුණු කියා සිටීමට අවස්ථාවක් දීමෙන් පසු සම්මත වූ යෝජනාවක් මගින් නිලයෙන් ඉවත් කරනු ලැබීම.

(ඉ) පිළිගත හැකි ප්‍රමාණවත් හේතු නොමැතිව පිට පිටම අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් වාර 03 කට නොපැමිණීම නිසා අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමකදී සම්මත කරගත් යෝජනාවක් මගින් නිලයෙන් ඉවත් කරනු ලැබීම. එබදු අවස්ථාවක එකී යෝජනාව සාකච්ඡාවට භාජනය කරනු ලබන අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම පැවැත්වීමට නියමිත දිනට දින හතකටවත් කලින් එකී අධ්‍යක්ෂකවරයාට එම යෝජනාව පිළිබදව දැනුම් දී තිබිය යුතුය.

(ඊ) සමූපකාර නීතියට අනුව වත්කම් හා බැරකම් ප්‍රකාශ නොකිරීම හෝ ප්‍රකාශ කරන ලද වත්කම් බැරකම් හෝ සාවද්‍ය බව හෙලිවීම.

(උ) පාර්ලිමේන්තුවේ පළාත් සභාවක, මහනගර සභාවක, නගර සභාවක හෝ ප්‍රාදේශිය සභාවක මන්ත්‍රිවරයෙකු වශයෙන් තේරී පත්වීම.

(5) අධ්‍යක්ෂක මණ්ඩලයේ පුරප්පාඩුවක් ඇති වූ විට, එකී පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත 1 වන උප වගන්තියේ සඳහන් අන්දමට සාමාජිකයකු තෝරාපත්කර ගැනීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩල විසින් විශේෂ මහසභා රැස්වීමක් කැදවිය යුතුය. ඉහත කී අන්දමට ස්ථිර වශයෙන් අධ්‍යක්ෂකවරයෙකු තෝරාපත්කර ගන්නා තෙක් ඉහත

03 වන උප වගන්තිය අනුව නුසුදුස්සකු නොවන තැනැත්තෙක් තාවකාලිකව එකී පුරප්පාඩුව පිරවීම සදහා පත්කර ගැනීමට අධ්‍යක්ෂක මණ්ඩලයට බලය තිබේ. කෙසේ වෙතත් ඒ අන්දමට තෝරා පත්කරනු ලබන අධ්‍යක්ෂකවරයෙකුගේ ධූරය මහසභාවේ අනුමැතිය නොලැබී තෙමසක් ඉකුත්වීමත් සමගම අහෝසි වන්නේය.

## සීමාසහිත කුරුවිට විවිධ සේවා සමුපකාර සමිතිය - කුරුවිට

## 2026 වර්ෂය සදහා කාරක සභා යෝජනා හා අදහස්

**එරත්න ප්‍රාදේශිකය**

i. එරත්න ගොඩනැගිල්ලේ උඩ කොටසේ වහලය ඉවත්කර රැස්වීම් ශාලාවක් ලෙස සකස්කර, උපකාරක පංති පැවැත්වීම සදහා හෝ වෙනත් ව්‍යාපාරික කටයුත්තකට සුදුසු ලෙස සකස් කිරීම.

ii. ළදරුපාසල පිටුපස කොටස වැට ඉවත්කර ස්ථිර ආවරණයක් සකස් කිරීම.

iii. ප්‍රාදේශික ගොඩනැගිල්ලේ සුදුසු ස්ථානයක කාරකසභා රැස්වීම් සදහා කොටසක් වෙන්කර ගැනීම.

iv. ප්‍රාදේශිකයට යාබද කුඩා ඉඩම් කොටස අයිතිකරු සමග සාකච්ඡා කොට සමිතියට ලබාගැනීම.

v. එරත්න/ලස්සකන්ද මහා මාර්ගයට යාබද සුදුසු ස්ථානයක ඉන්ධන පිරවුම්හලක් ආරම්භ කිරීම.

**ගෝනපිටිය ප්‍රාදේශිකය**

i. ප්‍රාදේශිකයේ ජනේලයේ කූරු ශක්තිමත්ව සවිකර ගැනීම.

ii. ප්‍රාදේශිකය ඉදිරිපිට පියස්සක් සකස්කර ගැනීම.

iii. ප්‍රාදේශිකයට අවශ්‍ය වැසිකිළියක් සකස්කර ගැනීම.

iv. ප්‍රාදේශිකයට ශීතරකණයක් ලබාගැනීම.

v. ගෑස් සිලින්ඩර අලෙවියට අවශ්‍ය කටයුතු හා ඊට අවශ්‍ය ආරක්ෂිත කුටියක් සකස් කර

ප්‍රාදේශිකයේ ගෑස් අලෙවිය සදහා කටයුතු කිරීම.

**චතුයාය ප්‍රාදේශිකය**

i. චතුයාය ප්‍රාදේශිකය අවට ප්‍රදේශයේ ජනතාවට ගණුදෙනුකිරීමේ පහසුව සඳහා හා සාමාජිකත්වය ලබාදීම සඳහා හා බදුපදනම මත ලබාදි හෝ යළි විවෘත කරන ලෙසට යෝජනා කරමු.

**දෙවිපහළ ප්‍රාදේශිකය**

i. ප්‍රාදේශිකයට යාබදව ආපනශාලාවක් ඉදිකිරීම.
ii. ප්‍රාදේශිකය තුළ ගෑස් හා හාඩ්වෙයාර් බඩු අලෙවිය සඳහා කටයුතු සැලසීම.
iii. දෛනික මුදල් එකතුකිරීමේ නිළධාරියෙකු යෙදවීම.
iv. කුරුවිට නගරය තුළ විදුලිඋපකරණ අලෙවි කිරීමේ වෙළඳසැළක් ආරම්භ කිරිම.
v. තේ ගොවියා නගාසිටුවීම සම්බන්ධයෙන් පොහොර ලබාදීම, දළු එකතු කිරිම වැනි ක්‍රියාමාර්ග ගැනිම.
vi. කාරක සභාව හා මහ සභාව ප්‍රමුඛව සාමාජික මහත්ම මහත්මීන්ට ඇස් කණ්ණාඩි ලබාදීම.
vii. ළදරුපාසලේ පවතින අඩුපාඩු සම්පූර්ණ කරදීම.
viii. වර්ෂ අවසාන විනෝද චාරිකාව කාරක සභාවට හා මහසභාවට පමණක් සීමා නොවී සාමාජික මහත්ම මහත්මීන්ට ද අවස්ථාව ලබාදීම. (එක් අයෙකු දෙවරක් සහභාගි නොවිය යුතුය)

**තෙප්පනාව පහළගම ප්‍රාදේශිකය**

i. දැනට ප්‍රාදේශිකය තුළ පවතින ශීතකරණය ක්‍රියාවිරහිත වී ඇති බැවින් එය අලුත්වැඩියාකර ලබාදීම හෝ නව ශීතකරණයක් ලබාදීමට හෝ යෝජනා කරමු.

**පැරඩයිස්වත්ත ප්‍රාදේශිකය**

i. පැරඩයිස්වත්ත ප්‍රාදේශිකය හා ග්‍රාමීය බැංකු පිහිටි පර්චස් 16.05 ඉඩමේ හිස්ව පවතින කොටස ව්‍යාපාරික ස්ථානයකට සුදුසු ලෙස සකස් කර දෙන ලෙසට යෝජනා කරමු.

j.

**මලව ශාන්තිපුර ප්‍රාදේශිකය**

i. මලව ප්‍රදේශයේ සාමාජික සාමාජිකයන්ගේ හා පොදු මහජනතාවගේ අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රාදේශිකය නැවත ආරම්භ කිරීම.

ii. සමූපකාර ප්‍රාදේශිකයේ බාහිර දර්ශනය කාර්යාලියය ස්වරූපයක් ලෙස දිස්වෙන අතර, එය

විවෘත වෙළඳසැලක් ලෙස පෙනෙන ආකාරයට සකස් කළ යුතුය. ඒ සඳහා එළවළු වෙළඳසැළක් ද පවත්වාගෙන යාමට කටයුතු කරන ලෙසට යෝජනා කරමු.

iii. කාගිල්ස්, කීල්ස්, ස.තො.ස යන ආයතන පාරිභෝගිකයන් ආකර්ශණය කරගැනීම සඳහා විශේෂ මිළ වට්ට ලබාදෙමින් කටයුතු කරයි. සමූපකාර අලෙවි ක්‍රියාදාමයේද මෙම ක්‍රමය ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම.

**ආනන්දපුර ප්‍රාදේශිකය**

i. ආනන්දපුර ප්‍රාදේශිකය කිරිබත්ගල ගමේ නැවත වරක් ආරම්භ කරන ලෙසට යෝජනා කරමු.

**කරපිංචවත්ත ප්‍රාදේශිකය**

i. සමිතියේ පාලන කටයුතුවල යෙදී සිටින මුළු අධ්‍යක්ෂ මණ්ඩලයම ඉල්ලා අස්වීමකදී හෝ නිත්‍යානුකූලව ඉවත් කිරීමක දී මහසභා නියෝජිත ඡන්දයෙන් පත්වන නව අධ්‍යක්ෂ මණ්ඩල ධූර කාලය වසර 03 ක් වන්නේය.

ii. ඉදිරි වර්ෂයට පත්කිරීමේදී මහසභාවේ ධූර කාළය වසර 3 ක් විය යුතු වේ.

# අයවැය ඇස්තමේන්තු

# 2026

ඇමුණුම් අංක - 1

## සීමාසහිත කුරුවිට විවිධ සේවා සමුපකාර සමිතිය
## අපේක්ෂිත වාර්ෂික ශුද්ධ අතිරික්තය

| ව්‍යාපාර අංශය | ශුද්ධ අතිරික්තය රුපියල් |
|---|---|
| වෙළඳ අංශය | 98273000 |
| ග්‍රාමීය බැංකු අංශය | 131230000 |
| **එකතුව** | **229503000** |
| **කාර්යය මණ්ඩල දිරි දීමනා/F-28 ලාභ දීමනා/අයවැය සහන දීමනා** | **25000000** |
| **ඉතිරි ශුද්ධ ලාභය** | **204503000** |

## 2026 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව – වෙළඳ අංශය

| අනු අංකය | ව්‍යාපාරික ඒකකය | 2026.01.01සිට 2026.12.31 දක්වා අපේක්ෂිත මෙහෙයුම් ලාභය රු. |
|---|---|---|
| 1 | බාහිර/අභ්‍යන්තර තොග හා සිල්ලර වෙළඳාම | 48031500 |
| 2 | ඉන්ධනහල අංශය | 42474800 |
| 3 | සමුජන තැපැල්හල අංශය | 524500 |
| 4 | රක්ෂණ සේවා අංශය | 85900 |
| 5 | පෙර පාසල් අංශය | 390800 |
| 6 | සමුසිරි උත්සව ශාලාව | 984100 |
| 7 | ශ්‍රී පාද ආපනශාලා අංශය | 1918300 |
| 8 | මන්චි අලෙවි නියෝජිත අංශය | 2773700 |
| 9 | යුනිලිවර් අලෙවි නියෝජිත අංශය | 920600 |
| 10 | රථවාහන ඒකකය | 168800 |
| | **එකතුව** | **98273000** |

| ඇමුණුම් අංක - 2 |
|---|

# සීමාසහිත කුරුවිට විවිධ සේවා සමුපකාර සමිතිය
## 2026 අයවැය ඇස්තමේන්තුව - තොග ගබඩා අංශය

| | විස්තරය | 2026.01.01 සිට 2026.12.31 දක්වා |
|---|---|---|
| 1 | මුදලට ණයට | 180000000 |
| 2 | මාරු කිරීම් | 460000000 |
| 3 | මුළු විකුණුම් | **640000000** |
| 4 | ආරම්භක ඉතිරි | 20000000 |
| 5 | ගැණුම් | **624047040** |
| 6 | ගැණුම් වියදම් | 3800000 |
| 7 | **එකතුව** | **647847040** |
| 8 | අවසාන ඉතිරි | 19000000 |
| 9 | විකුණුම් පිරිවැය (2+3+4-5) | 628847040 |
| 10 | **දළ ලාභය (1-6)** | **11152960** |
| 11 | වෙනත් ආදායම් | |
| 12 | **උප එකතුව (7+8)** | **11152960** |
| | **මෙහෙයුම් වියදම්** | |
| 13 | **කාර්යය මණ්ඩල පිරිවැය** | |
| | ස්ථිර සේවක වැටුප් | 2763600 |
| | අර්ථසාධක | 320000 |
| | සේවා නියුක්ති භාර අරමුදල | 80040 |
| | විශ්‍රාම වැටුප් | 66720 |
| | ජීවන ප්‍රතිලාභ | 3000 |
| | ලිපිකරු වැටුප | 509400 |
| | අතිකාල | 381000 |
| | අධ්‍යාපන වියදම් | 60000 |
| | ඉතිරි තොග ගණන් ගැනීමේ වියදම් | 3600 |
| | සේවක විශ්‍රාම පාරිතෝෂික | 115200 |
| | අවුරුදු දීමනා | 144000 |
| | වැටුප් වර්ධක | 15600 |
| | නිවාඩු වැටුප් | 84000 |
| | **එකතුව** | **4546160** |
| 14 | **බෙදාහැරීමේ වියදම්** | |
| | රක්ෂණ වියදම් | 60000 |
| | ප්‍රවාහන ගාස්තු | 1219000 |
| | බලපත්‍ර ගාස්තු | 96000 |
| | **එකතුව** | **1375000** |
| 15 | **ක්ෂය හා ක්‍රමක්ෂය** | |
| | ගොඩනැගිලි ක්ෂය | 180000 |
| | ලි බඩු උපකරණ ක්ෂය | 48000 |
| | **එකතුව** | **228000** |
| 16 | **වෙනත් වියදම්** | |
| | ජල ගාස්තු | 45600 |
| | විදුලි ගාස්තු | 145200 |
| | ගෙවල් කුලි | 720000 |
| | ලිපිද්‍රව්‍ය | 94500 |
| | අළුත්වැඩියා වියදම් | 726000 |
| | තරාදි පඩි මුද්‍රා | 6000 |
| | දුරකථන වියදම් | 14200 |
| | දැවටුම්පත් වියදම් | 145300 |
| | මිශ්‍ර වියදම් | 477000 |
| | **එකතුව** | **2373800** |
| 17 | මූල්‍ය පිරිවැය | 990000 |
| | මූල්‍ය වියදම් | **990000** |
| | **මෙහෙයුම් වියදම් එකතුව** | **9512960** |
| | **පොදු පරිපාලන වියදම් ගැලපීමට පෙර ශුද්ධ ලාභය** | 1640000 |
| | පොදු පරිපාලන වියදම් :ගැලපීම- | 846500 |
| | **පොදු පරිපාලන වියදම් ගැලපීමෙන් පසු ශුද්ධ ලාභය** | **793500** |

ඇමුණුම් අංක - 3

# සීමාසහිත කුරුවිට විවිධ සේවා සමුපකාර සමිතිය
## 2026 අයවැය ඇස්තමේන්තුව - කෝප්සිටි අංශය

| | විස්තරය | 2026.01.01 සිට 2026.12.31 දක්වා |
|---|---|---|
| 1 | මුදලට ණයට | 420000000 |
| 2 | මුළු විකුණුම් | **420000000** |
| 3 | ආරම්භක ඉතිරි | 249000000 |
| 4 | ගැණුම් | **359077800** |
| 5 | ගැණුම් වියදම් | 4976000 |
| 6 | **එකතුව** | **613053800** |
| 7 | අවසාන ඉතිරි | 236000000 |
| 8 | විකුණුම් පිරිවැය (2+3+4-5) | 377053800 |
| **9** | **දළ ලාභය (1-6)** | **42946200** |
| 10 | වෙනත් ආදායම් | 806000 |
| **11** | **උප එකතුව (7+8)** | **43752200** |
| | **මෙහෙයුම් වියදම්** | |
| 12 | **කාර්යය මණ්ඩල පිරිවැය** | |
| | ස්ථිර සේවක වැටුප් | 10712400 |
| | අර්ථසාධක | 939600 |
| | සේවා නියුක්ති භාර අරමුදල | 235800 |
| | විශ්‍රාම වැටුප් | 200400 |
| | ජීවන ප්‍රතිලාභ | 9000 |
| | ලිපිකරු වැටුප | 480000 |
| | අතිකාල | 1240800 |
| | ගමන් ගාස්තු | 345900 |
| | අධ්‍යාපන වියදම් | 60000 |
| | ඉතිරි තොග ගණන් ගැනීමේ වියදම් | 7800 |
| | සේවක විශ්‍රාම පාරිතෝෂික | 318000 |
| | අවුරුදු දීමනා | 60000 |
| | වැටුප් වර්ධක | 33600 |
| | නිවාඩු වැටුප් | 228000 |
| | **එකතුව** | **14871300** |
| 13 | **බෙදාහැරීමේ වියදම්** | |
| | රසක්‍ෂණ වියදම් | 58200 |
| | ප්‍රවාහන ගාස්තු | 188400 |
| | බලපත්‍ර ගාස්තු | 16800 |
| | කම්කරු කුලි | 285300 |
| | **එකතුව** | **548700** |
| 14 | **ක්‍ෂය හා ක්‍රමක්‍ෂය** | |
| | ගොඩනැගිලි ක්‍ෂය | 600000 |
| | ලි බඩු උපකරණ ක්‍ෂය | 528000 |
| | **එකතුව** | **1128000** |
| 15 | **වෙනත් වියදම්** | |
| | ජල ගාස්තු | 174000 |
| | විදුලි ගාස්තු | 1944400 |
| | ආරක්ෂක වියදම් | 120000 |
| | ගෙවල් කුලි | 1695000 |
| | ලිපිද්‍රව්‍ය | 529000 |
| | අළුත්වැඩියා වියදම් | 174000 |
| | තරාදි පඩි මුද්‍රා | 30000 |
| | දුරකථන වියදම් | 14400 |
| | දැවටුම්පත් වියදම් | 631000 |
| | වෙනත් වියදම් | 896400 |
| | **එකතුව** | **6208200** |
| 16 | මූල්‍ය පිරිවැය | 741000 |
| | මූල්‍ය වියදම් | **741000** |
| | **මෙහෙයුම් වියදම් එකතුව** | **23497200** |
| | **පොදු පරිපාලන වියදම් ගැලපීමට පෙර ශුද්ධ ලාභය** | 20255000 |
| | පොදු පරිපාලන වියදම් :ගැලපීම- | 2090900 |
| | **පොදු පරිපාලන වියදම් ගැලපීමෙන් පසු ශුද්ධ ලාභය** | **18164100** |

**ඇමුණුම් අංක - 4**

# සීමාසහිත කුරුවිට විවිධ සේවා සමුපකාර සමිතිය
## 2026 අයවැය ඇස්තමේන්තුව - ප්‍රාදේශික අංශය

| | **විස්තරය** | **2026.01.01 සිට 2026.12.31 දක්වා** |
|---|---|---|
| 1 | මුදලට ණයට | 450000000 |
| 2 | මුළු විකුණුම් | **450000000** |
| 3 | ආරම්භක ඉතිරි | 30000000 |
| 4 | ගැණුම් | **371571590** |
| 5 | ගැණුම් වියදම් | 2800000 |
| 6 | **එකතුව** | **404371590** |
| 7 | අවසාන ඉතිරි | 29000000 |
| 8 | විකුණුම් පිරිවැය (2+3+4-5) | 375371590 |
| 9 | **දළ ලාභය (1-6)** | **74628410** |
| 10 | වෙනත් ආදායම් | 4571980 |
| 11 | **උප එකතුව (7+8)** | **79200390** |
| | **මෙහෙයුම් වියදම්** | |
| 12 | **කාර්යය මණ්ඩල පිරිවැය** | |
| | ස්ථිර සේවක වැටුප් | 21996000 |
| | අර්ථසාධක | 2205360 |
| | සේවා නියුක්ති භාර අරමුදල | 543000 |
| | වීශ්‍රාම වැටුප් | 432900 |
| | ජීවන ප්‍රතිලාභ | 22200 |
| | ලිපිකරු වැටුප | 1218600 |
| | අතිකාල | 2182250 |
| | ගමන් ගාස්තු | 937690 |
| | අධ්‍යාපන වියදම් | 304800 |
| | ඉතිරි තොග ගණන් ගැනිමේ වියදම් | 33000 |
| | සේවක විශ්‍රාම පාරිතෝෂික | 933000 |
| | වැටුප් වර්ධක | 132000 |
| | නිවාඩු වැටුප් | 419040 |
| | **එකතුව** | **31359840** |
| 13 | **බෙදාහැරීමේ වියදම්** | |
| | රක්ෂණ වියදම් | 143400 |
| | ප්‍රවාහන ගාස්තු | 917100 |
| | බලපත්‍ර ගාස්තු | 392380 |
| | කම්කරු කුලි | 477580 |
| | **එකතුව** | **1930460** |
| 14 | **ක්ෂය හා ක්‍රමක්ෂය** | |
| | ගොඩනැගිලි ක්ෂය | 1226400 |
| | ලී බඩු උපකරණ ක්ෂය | 1309200 |
| | **එකතුව** | **2535600** |
| 15 | **වෙනත් වියදම්** | |
| | ගබඩා මිශ්‍ර වියදම් | 840450 |
| | ජල ගාස්තු | 36000 |
| | විදුලි ගාස්තු | 3105200 |
| | ආරක්ෂක වියදම් | 120000 |
| | ගෙවල් කුලි | 2209200 |
| | ලිපිද්‍රව්‍ය | 784420 |
| | අළුත්වැඩියා වියදම් | 246000 |
| | තරාදි පඩි මුද්‍රා | 137500 |
| | දුරකථන වියදම් | 14400 |
| | දැවටුම්පත් වියදම් | 1014420 |
| | **එකතුව** | **8507590** |
| 16 | මූල්‍ය පිරිවැය | 1696900 |
| | මූල්‍ය වියදම් | **1696900** |
| | **මෙහෙයුම් වියදම් එකතුව** | **46030390** |
| | **පොදු පරිපාලන වියදම් ගැලපීමට පෙර ශුද්ධ ලාභය** | 33170000 |
| | පොදු පරිපාලන වියදම් :ගැලපීම- | 4096100 |
| | **පොදු පරිපාලන වියදම් ගැලපීමෙන් පසු ශුද්ධ ලාභය** | **29073900** |

## සීමාසහිත කුරුවිට විවිධ සේවා සමුපකාර සමිතිය

## 2026 අයවැය ඇස්තමේන්තුව - ඉන්ධනහල අංශය

| | විස්තරය | 2026.01.01 සිට 2026.12.31 දක්වා |
|---|---|---|
| 1 | **මුළු විකුණුම්** | **2082500000** |
| 2 | ගැණුම් | **2023190000** |
| 3 | ආරම්භක ඉතිරි | 7800000 |
| | **එකතුව** | **2030990000** |
| 4 | අවසාන ඉතිරි | 11000000 |
| 5 | විකුණුම් පිරිවැය (2+3+4-5) | 2019990000 |
| | **දළ ලාභය (1-6) 3 %** | **62510000** |
| 6 | වෙනත් ආදායම් | 3060000 |
| | **උප එකතුව (7+8)** | **65570000** |
| | **මෙහෙයුම් වියදම්** | |
| 7 | **කාර්යය මණ්ඩල පිරිවැය** | |
| | අනුමත සේවක වැටුප් | 9600000 |
| | සේවක අර්ථසාධක | 960000 |
| | සේවා නියුක්තිභාර අරමුදල | 240000 |
| | ජීවන ප්‍රතිලාභ | 12000 |
| | විශ්‍රාම වැටුප් දායකත්වය | 132000 |
| | සේවක විශ්‍රාම පාරිතෝෂික | 240000 |
| | නිවාඩු වැටුප් | 72000 |
| | සේවක අතිකාල | 2520000 |
| | **එකතුව** | **13776000** |
| 8 | **බෙදාහැරීමේ වියදම්** | |
| | රක්‍ෂණ වියදම් | 276000 |
| | අලුත්වැඩියා වියදම් | 1200000 |
| | **එකතුව** | **1476000** |
| 9 | **ක්‍ෂය හා ක්‍රමක්‍ෂය** | |
| | ගොඩනැගිලි ක්‍ෂය | 1896000 |
| | යන්ත්‍ර ක්‍ෂය | 1080000 |
| | **එකතුව** | **2976000** |
| 10 | **මූල්‍ය පිරිවැය** | |
| | අයිරා පොලිය | 120000 |
| | චෙක්පත් ගාස්තු | 96000 |
| | **එකතුව** | **216000** |
| 11 | **වෙනත් වියදම්** | |
| | ලිපිද්‍රව්‍ය | 204000 |
| | දුරකථන | 42000 |
| | ජල ගාස්තු | 120000 |
| | විදුලිය | 480000 |
| | මිශ්‍ර වියදම් | 1500000 |
| | වරිපනම් ගාස්තු | 180000 |
| | **එකතුව** | **2526000** |
| 12 | **මෙහෙයුම් වියදම් එකතුව** | **20970000** |
| 13 | **පොදු පරිපාලන වියදම් ගැලපීමට පෙර ශුද්ධ ලාභය** | **44600000** |
| 14 | පොදු පරිපාලන වියදම් (ගැලපීම) | **2125200** |
| 15 | **පොදු පරිපාලන වියදම් ගැලපීමෙන් පසු ශුද්ධ ලාභය** | **42474800** |

ඇමුණුම් අංක - 6

## සීමාසහිත කුරුවිට විවිධ සේවා සමූපකාර සමිතිය

## 2026 අයවැය ඇස්තමේන්තුව - නියෝජිත තැපැල් අංශය

| | විස්තරය | 2026.01.01 සිට 2026.12.31 දක්වා |
|---|---|---|
| **1** | **මුළු විකුණුම්** | **15000000** |
| 2 | ගැණුම් | **13176780** |
| 3 | ආරම්භක ඉතිරි | 1200000 |
| | **එකතුව** | **14376780** |
| 4 | අවසාන ඉතිරි | 1150000 |
| 5 | විකුණුම් පිරිවැය | 13226780 |
| 6 | **දළ ලාභය** | **1773220** |
| 7 | වෙනත් ආදායම් | 170000 |
| | **උප එකතුව** | **1943220** |
| 8 | **මෙහෙයුම් වියදම්** | |
| | **කාර්යය මණ්ඩල පිරිවැය** | |
| | අනුමත සේවක වැටුප් | 603600 |
| | සේවක අර්ථසාධක | 60840 |
| | සේවා නියුක්තිභාර අරමුදල | 15240 |
| | ජීවන ප්‍රතිලාභ | 600 |
| | විශ්‍රාම වැටුප් දායකත්වය | 10440 |
| | ඉ /තොග ගණන් වියදම් | 600 |
| | අවුරුදු දීමනා | 48000 |
| | වැටුප් වර්ධක | 2400 |
| | නිවාඩු වැටුප් | 9600 |
| | සේවක අතිකාල | 59400 |
| | **එකතුව** | **941520** |
| 9 | **බෙදාහැරීමේ වියදම්** | |
| | රක්ෂණ වියදම් | 12000 |
| | ප%වාහන වියදම් | 16300 |
| | **එකතුව** | **28300** |
| 10 | **ක්ෂය හා ක්‍රමක්ෂය** | |
| | ගොඩනැගිලි ක්ෂය | 90000 |
| | **එකතුව** | **90000** |
| 11 | **මූල්‍ය පිරිවැය** | |
| | අයිරා පොළිය | 9600 |
| | **එකතුව** | **9600** |
| 12 | **වෙනත් වියදම්** | |
| | ලිපිද්‍රව්‍ය | 26500 |
| | දුරකථන | 29000 |
| | අලුත්වැඩියා වියදම් | 12000 |
| | දැවටුම්පත් ගාස්තු | 119500 |
| | විදුලිය | 31800 |
| | **එකතුව** | **218800** |
| 13 | **මෙහෙයුම් වියදම් එකතුව** | **1288220** |
| | **පොදු පරිපාලන වියදම් ගැලපීමට පෙර ශුද්ධ ලාභය** | **655000** |
| | පොදු පරිපාලන වියදම් (ගැලපීම) | **130500** |
| | **පොදු පරිපාලන වියදම් ගැලපීමෙන් පසු ශුද්ධ ලාභය** | **524500** |

ඇමුණුම් අංක - 7

## සීමාසහිත කුරුවිට විවිධ සේවා සමුපකාර සමිතිය
## 2026 අයවැය ඇස්තමේන්තුව - රක්ෂණ අංශය

| | විස්තරය | 2024.01.01 සිට 2024.12.31 දක්වා |
|---|---|---|
| 1 | පූර්ණ රක්‍ෂණය 10% | 7956000 |
| 2 | තෙවන පාර්ෂවය 5% | 2772000 |
| 3 | දේපල හා විවිධ රක්‍ෂණ 16% | 1680000 |
| | **එකතුව** | |
| | **ආදායම** | |
| 6 | සේවා ගාස්තු | 585000 |
| 7 | දිරි දීමනා | 422500 |
| 8 | වෙනත් (ජීවිත රක්ෂණ) | 12000 |
| | **මුළු ආදායම** | 1019500 |
| | | |
| 7 | **මෙහෙයුම් වියදම්** | |
| | **කාර්යය මණ්ඩල පිරිවැය** | |
| | කාර්යය මණ්ඩල පිරිවැය | 660000 |
| | සේවක අර්ථසාධක අරමුදල | 52800 |
| | සේවා නියුක්තිභාර අරමුදල | 12000 |
| | **එකතුව** | **724800** |
| 8 | **වෙනත් වියදම්** | |
| | ගෙවල් කුලිය | 39600 |
| | පරිපාලන වියදම් | 60000 |
| | ලිපිද්‍රව්‍ය | 2700 |
| | ෆැක්ස් හා දුරකථන | 10800 |
| | විදුලිය | 7200 |
| | වෙනත් වියදම් (මිශ්‍ර වියදම්) | 2600 |
| | **එකතුව** | 122900 |
| 9 | **මෙහෙයුම් වියදම් එකතුව** | 847700 |
| | **පොදු පරිපාලන වියදම් ගැලපීමට පෙර ලාභය** | 171800 |
| | පොදු පරිපාලන වියදම් ගැලපීම | 85900 |
| | **පොදු පරිපාලන වියදම් ගැලපීමට පෙර ශුද්ධ ලාභය** | 85900 |

ඇමුණුම් අංක - 8

## සීමාසහිත කුරුවිට විවිධ සේවා සමූපකාර සමිතිය

## 2026 අයවැය ඇස්තමේන්තුව - පෙරපාසල් අංශය

| | විස්තරය | 2026.01.01 සිට 2026.12.31 දක්වා |
|---|---|---|
| | **ආදායම්** | |
| 1 | පන්ති ගාස්තු හා සේවා ගාස්තු | 5880000 |
| 2 | ඇතුළත්වීමේ ගාස්තු | 360000 |
| 3 | ස්ථාවර තැන්පත් පොලී | 310200 |
| 4 | අමතර ආදායම් | 250000 |
| | **එකතුව** | 6634200 |
| | **වියදම්** | |
| 5 | **කාර්යය මණ්ඩල පිරිවැය** | |
| | අනුමත සේවක වැටුප් හා දීමනා | 793000 |
| | අනුමත නොවන සේවක වැටුප් හා දීමනා | 2881000 |
| | අවුරුදු දීමනා | 391500 |
| | වැටුප් වර්ධක | 42850 |
| | **එකතුව** | 4108350 |
| 6 | **ක්ෂය හා ක්‍රමක්ෂය** | |
| | කෂය වියදම් | 1160000 |
| | **එකතුව** | 1160000 |
| 7 | **වෙනත් වියදම්** | |
| | ජල ගාස්තු | 27600 |
| | විදුලි ගාස්තු | 59100 |
| | ලිපිද්‍රව්‍ය හා මුද්‍රණ | 40000 |
| | ලියාපදිංචි ගාස්තු | 11400 |
| | ප්‍රචාරණ වියදම් | 138300 |
| | මිශ්‍ර වියදම් | 63825 |
| | අලුත්වැඩියා වියදම් | 60300 |
| | **එකතුව** | 400525 |
| | | |
| 8 | **මෙහෙයුම් වියදම් එකතුව** | 5668875 |
| 9 | **පොදු පරිපාලන වියදම ගැලපීමට පෙර ශුද්ධ ලාභය** | 965325 |
| 10 | පොදු පරිපාලන වියදම් (ගැලපීම) | **574500** |
| 11 | **පොදු පරිපාලන වියදම් ගැලපීමෙන් පසු ශුද්ධ ලාභය** | 390825 |

ඇමුණුම් අංක 9

## සීමාසහිත කුරුවිට විවිධ සේවා සමුපකාර සමිතිය

## 2026 අයවැය ඇස්තමේන්තුව - මංචි අලෙවි නියෝජිත අංශය

| | විස්තරය | 2026.01.01 සිට 2026.12.31 දක්වා |
|---|---|---|
| 1 | මුළු විකුණුම් | 35766000 |
| | **එකතුව** | **35766000** |
| 2 | ගැණුම් | 32038750 |
| 3 | ගැණුම් වියදම් | 745000 |
| 4 | ආරම්භක ඉතිරි | 2100000 |
| | **එකතුව** | **34583750** |
| 5 | අවසාන ඉතිරි | 2000000 |
| 6 | විකුණුම් පිරිවැය (2+3+4-5) | 32583750 |
| 7 | **දළ ලාභය (1-6) 8.9%** | **3182250** |
| | වෙනත් ආදායම් | 2160000 |
| | **උප එකතුව (7+8)** | 5342250 |
| 8 | **මෙහෙයුම් වියදම්** | |
| | **කාර්යය මණ්ඩල පිරිවැය** | |
| | සේවක වැටුප් හා දීමනා | 1212000 |
| | සේවක අර්ථසාධක | 132000 |
| | සේවා නියුක්තිභාර අරමුදල | 36000 |
| | ජීවන ප්‍රතිලාභ | 1150 |
| | විශ්‍රාම වැටුප් | 7200 |
| | විශ්‍රාම පාරිතෝෂික | 24000 |
| | අතිකාල | 18000 |
| | අධ්‍යාපන වියදම් | 6000 |
| | වැටුප් වර්ධක | 4800 |
| | ඉතිරි තොග ගණන් ගැනීමේ වියදම් | 3600 |
| | **එකතුව** | **1444750** |
| 9 | **බෙදාහැරීමේ වියදම්** | |
| | රක්ෂණ වියදම් | 18000 |
| | ප්‍රවාහන ගාස්තු | 435000 |
| | බලපත්‍ර ගාස්තු | 6000 |
| | **එකතුව** | **459000** |
| 10 | **ක්ෂය හා ක්‍රමක්ෂය** | |
| | ක්ෂය වියදම් | 30000 |
| | **එකතුව** | **30000** |
| 11 | **වෙනත් වියදම්** | |
| | ලිපිද්‍රව්‍ය හා මුද්‍රණ | 60000 |
| | ගෙවල් කුලී | 128500 |
| | අළුත්වැඩියා වියදම් | 12000 |
| | විදුලි වියදම් | 54000 |
| | මිශ්‍ර වියදම් | 36000 |
| | දුරකතන වියදම් | 84000 |
| | වරිපනම් බදු | 6000 |
| | **එකතුව** | **380500** |
| 12 | **මූල්‍ය පිරිවැය** | |
| | මූල්‍ය වියදම් | 18000 |
| | **එකතුව** | **18000** |
| 13 | **මෙහෙයුම් වියදම් එකතුව** | **2332250** |
| 14 | **පොදු පරිපාලන වියදම් ගැලපීමට පෙර ශුද්ධ ලාභය** | 3010000 |
| 15 | පොදු පරිපාලන වියදම් :ගැලපීම- | 236300 |
| 16 | **පොදු පරිපාලන වියදම් ගැලපීමෙන් පසු ශුද්ධ ලාභය** | **2773700** |

ඇමුණුම් අංක - 10

## සීමාසහිත කුරුවිට විවිධ සේවා සමුපකාර සමිතිය

## 2026 අයවැය ඇස්තමේන්තුව - යුනිලීවර් අලෙවි නියෝජිත අංශය

| | විස්තරය | 2026.01.01 සිට 2026.12.31 දක්වා |
|---|---|---|
| 1 | **මුළු විකුණුම්** | **64380000** |
| 2 | ගැණුම් | 62992400 |
| 3 | ආරම්භක ඉතිරි | 2200000 |
| | **එකතුව** | 65192400 |
| 4 | අවසාන ඉතිරි | 2100000 |
| 5 | විකුණුම් පිරිවැය (2+3+4-5) | 63092400 |
| | **දළ ලාභය (1-6) 2%** | **1287600** |
| 6 | වෙනත් ආදායම් | 4300000 |
| | **උප එකතුව (7+8)** | **5587600** |
| | | |
| | **මෙහෙයුම් වියදම්** | |
| 7 | **කාර්ය මණ්ඩල පිරිවැය** | |
| | ස්ථිර සේවක වැටුප් | 2364000 |
| | අර්ථසාධක | 240000 |
| | සේවා නියුක්තිභාර අරමුදල් | 60000 |
| | විශ්‍රාම වැටුප් | 24000 |
| | ජීවන ප්‍රතිලාභ | 1200 |
| | අතිකාල | 60000 |
| | ඉතිරිතොග ගණන් ගැනීමේ වියදම් | 3600 |
| | සේවක විශ්‍රාම පාරිතෝෂික | 30000 |
| | වැටුප් වර්ධක | 4800 |
| | නිවාඩු වැටුප් | 24000 |
| | **එකතුව** | **2811600** |
| 8 | **බෙදාහැරීම් වියදම්** | |
| | ප්‍රවාහන හා කම්කරු කුලි | 635000 |
| | රක්ෂණ හා බලපත්‍ර | 24000 |
| | **එකතුව** | 659000 |
| 9 | **ක්ෂය හා ක්‍රමක්ෂය** | |
| | ක්ෂය වියදම් | 72000 |
| | එකතුව | **72000** |
| 10 | **වෙනත් වියදම්** | |
| | ලිපිද්‍රව්‍ය හා මුද්‍රණ | 96000 |
| | අළුත්වැඩියා වියදම් | 24000 |
| | දුරකථන වියදම් | 84000 |
| | විදුලි වියදම් | 54000 |
| | 1% සමිති සඳහා වට්ටම් | 305000 |
| | වෙනත් වියදම් | 36000 |
| | **එකතුව** | **599000** |
| 11 | **මූල්‍ය පිරිවැය** | |
| | මූල්‍ය පිරිවැය | 96000 |
| | **එකතුව** | **96000** |
| **12** | **මෙහෙයුම් වියදම් එකතුව** | **4237600** |
| **13** | **පොදු පරිපාලන වියදම ගැලපීමට පෙර ශුද්ධ ලාභය** | **1350000** |
| 14 | පොදු පරිපාලන වියදම් (ගැලපීම) | 429400 |
| **15** | **පොදු පරිපාලන වියදම් ගැලපීමෙන් පසු ශුද්ධ ලාභය** | **920600** |

**ඇමුණුම් අංක - 11**

## සීමාසහිත කුරුවිට විවිධ සේවා සමූපකාර සමිතිය
## 2026 අයවැය ඇස්තමේන්තුව - උත්සව ශාලා අංශය

| | විස්තරය | 2026.01.01 සිට 2026.12.31 දක්වා |
|---|---|---|
| | ආදායම | 1440000 |
| 1 | **මුළු ආදායම** | **1440000** |
| | | |
| 2 | **මෙහෙයුම් වියදම්** | |
| | ජල ගාස්තු | 30000 |
| | විදුලිය ගාස්තු | 144000 |
| | ක්ෂය වියදම් | 240000 |
| | **මෙහෙයුම් වියදම් එකතුව** | **414000** |
| 3 | **පොදු පරිපාලන වියදම් ගැලපීමට පෙර ශුද්ධ ලාභය** | **1026000** |
| 4 | පොදු පරිපාලන වියදම් | **41900** |
| 5 | **පොදු පරිපාලන වියදම් ගැලපීමෙන් පසු ශුද්ධ ලාභය** | **984100** |

ඇමුණුම් අංක - 12

## සීමාසහිත කුරුවිට විවිධ සේවා සමුපකාර සමිතිය

## 2026 අයවැය ඇස්තමේන්තුව - රථවාහන අංශය

| | විස්තරය | 2026.01.01 සිට 2026.12.31 දක්වා |
|---|---|---|
| | ධාවන කි. මී. ගණන | 53000 |
| | ආදායම | 7180000 |
| | පිටස්තර ආදායම | 240000 |
| | මුළු ආදායම | **7420000** |
| | | |
| | ඉන්ධන වියදම | 3180000 |
| | වැටුප් හා දීමනා | 2120000 |
| | රක්ෂණ හා බලපත්‍ර | 120000 |
| | අමතර කොටස් | 600000 |
| | අලුත්වැඩියා | 540000 |
| | ලිපිද්‍රව්‍ය | 12000 |
| | මිශ්‍ර වියදම් | 12000 |
| | **වියදම් එකතුව** | **6584000** |
| | **පොදු පරිපාලන වියදම් ගැලපීමට පෙර ශුද්ධ ලාභය** | **836000** |
| | පොදු පරිපාලන වියදම් | 667200 |
| | **පොදු පරිපාලන වියදම් ගැලපීමෙන් පසු ශුද්ධ ලාභය** | **168800** |

ඇමුණුම් අංක - 13

**සීමාසහිත කුරුවිට විවිධ සේවා සමුපකාර සමිතිය**

**2026 අයවැය ඇස්තමේන්තුව - ශ්‍රීපාද ආපනශාලා අංශය**

| | **විස්තරය** | **2026.01.01 සිට 2026.12.31 දක්වා** |
|---|---|---|
| 1 | හැරමිටිපාන ආපනශාලාව | 1800000 |
| 2 | ආඬියාමලතැන්න ආපනශළාව | 1200000 |
| | **මුළු ආදායම්** | **3000000** |
| | **මෙහෙයුම් වියදම්** | |
| 3 | වැටුප් | 765000 |
| | මුර වැටුප | 60000 |
| | විදුලිය ගාස්තු | 136200 |
| | අධීක්ෂණ ගාස්තු | 21000 |
| | **මෙහෙයුම් වියදම් එකතුව** | **982200** |
| | **පොදු පරිපාලන වියදම් ගැලපීමට පෙර ශුද්ධ ලාභය** | **2017800** |
| | **පොදු පරිපාලන වියදම් ගැලපීම** | 99500 |
| | **පොදු පරිපාලන වියදම් ගැලපීමෙන් පසු ලාභය** | **1918300** |

ඇමුණුම් අංක - 14

## සී/ස කුරුවිට විවිධ සේවා සමුපකාර සමිතිය

## සමුපකාර ග්‍රාමීය බැංකු අංශය
## 2026 වර්ෂයට ඉලක්කගත තැන්පත් හා ශුද්ධ අතිරික්තය

| සමුපකාර ග්‍රාමීය බැංකු හා උකස් මධ්‍යස්ථාන | තැන්පත් ඉලක්ක | පරිපාලන වියදම් අඩුකිරීමට | පරිපාලන වියදම් | පරිපාලන වියදම් අඩුකිරීමෙන් |
|---|---|---|---|---|
| | රුපියල් දහස් | පෙර | රුපියල් දහස් | පසු අතිරික්තය |
| කුරුවිට සමුපකාර ග්‍රාමීය බැංකුව | 519700 | 30717 | 1957 | 28760 |
| එරත්න සමුපකාර ග්‍රාමීය බැංකුව | 234410 | 22898 | 2631 | 20267 |
| තෙප්පනාව සමුපකාර ග්‍රාමීය බැංකුව | 467570 | 53953 | 7772 | 46181 |
| පණුකැරපිටිය සමුපකාර ග්‍රාමීය බැංකුව | 136920 | 8812 | 1012 | 7800 |
| කරපිංචවත්ත සමුපකාර ග්‍රාමීය බැංකුව | 181591 | 12038 | 1383 | 10655 |
| පැරඩයිස්වත්ත සමුපකාර ග්‍රාමීය බැංකුව | 156600 | 5127 | 589 | 4538 |
| දෙවිපහල සමුපකාර ග්‍රාමීය බැංකුව | 85030 | 3261 | 375 | 2886 |
| කුරුවිට සමුරන් උකස් මධ්‍යස්ථානය | 0 | 7560 | 869 | 6691 |
| පැරඩයිස් සමුරන් උකස් මධ්‍යස්ථානය | 0 | 2606 | 299 | 2307 |
| පාතගම සමුපකාර ග්‍රාමීය බැංකුව | 57572 | 223 | 26 | 197 |
| බටතොට ඉතුරුම් මධ්‍යස්ථානය | 12114 | 1071 | 123 | 948 |
| **එකතුව** | **1851507** | **147195** | **16913** | **131230** |

ඇමුණුම් අංක - 15

**සී/ස කුරුවිට විවිධ සේවා සමුපකාර සමිතිය**
**2026 වර්ෂය සඳහා ඉලක්කගත තැන්පත් හා ශුද්ධ අතිරික්තය**
**ඒකාබද්ධ වාර්තාව**

| | විස්තරය | 2025.07.31 නිත්‍ය රු දහස් | 2026.12.31 ඉලක්ක රු දහස් |
|---|---|---|---|
| | **තැන්පත්** | | |
| 1 | සාමාජිකඉතිරි කිරිමේ තැන්පත් | 647107 | 755914 |
| 2 | සාමාජික නොවන තැන්පත් | 281541 | 326314 |
| 3 | ළමා තැන්පත් | 97684 | 114294 |
| 4 | ස්ථාවර තැන්පත් | 558967 | 654985 |
| | **තැන්පත් එකතුව** | | 1851507 |
| | **අයෝජන** | | |
| 1 | සාමාජික ණය | | 925753 |
| 2 | උකස් අත්තිකාරම් | | 555452 |
| 3 | ආයෝජන | | 370302 |
| | **අයෝජන එකතුව** | | 1851507 |
| | ආයෝජන ආදායම් | | |
| 1 | සාමාජික ණය පොලි | | 147928 |
| 2 | උකස් පොලි | | 62770 |
| 3 | ආයෝජන පොලි | | 103754 |
| 4 | වෙනත් ආදායම් | | 1914 |
| | **ආදායම් එකතුව** | | 316366 |
| | **වියදම්** | | |
| 1 | තැන්පත් පොලි වියදම් | | 85206 |
| 2 | වෙන්කිරම් | | 27115 |
| 3 | පරිපාලන වියදම් | | 17036 |
| 4 | වෙනත් වියදම් | | 55779 |
| | | | |
| | | | |
| | වියදම් එකතුව | | 185136 |
| | **අපේක්ෂිත ශුද්ධ අතිරික්තය** | | **131230** |

ඇමුණුම් අංක - 16

# කුරුවිට ග්‍රාමීය බැංකුව

## ඉලක්කගත තැන්පත් හා ශුද්ධ අතිරික්තය

| | විස්තරය | 2025.07.31 නිත්‍ය රු. දහස් | 2026.12.31 ඉලක්ක රු. දහස් |
|---|---|---|---|
| | **තැන්පත්** | | |
| 1 | සාමාජිකඉතිරි කිරීමේ තැන්පත් | 162211 | 184955 |
| 2 | සාමාජික නොවන තැන්පත් | 145094 | 165438 |
| 3 | ළමා තැන්පත් | 16543 | 18862 |
| 4 | ස්ථාවර තැන්පත් | 131945 | 150445 |
| | **තැන්පත් එකතුව** | **455793** | **519700** |
| | **අයෝජන** | | |
| 1 | සාමාජික ණය | 259353 | 259850 |
| 2 | උකස් අත්තිකාරම් | 125250 | 155910 |
| 3 | ආයෝජන | | 103940 |
| | **අයෝජන එකතුව** | **384603** | **519700** |
| | **ආයෝජන ආදායම්** | | |
| 1 | සාමාජික ණය පොලි | | 42090 |
| 2 | උකස් පොලි | | 12970 |
| 3 | ආයෝජන පොලි | | 17214 |
| 4 | වෙනත් ආදායම් | | 300 |
| | **ආදායම් එකතුව** | | **72574** |
| | වියදම් | | |
| 1 | තැන්පත් පොලි වියදම් | | 21937 |
| 2 | වෙන්කිරීම් | | 5609 |
| 3 | පරිපාලන වියදම් | | 1957 |
| 4 | වෙනත් වියදම් | | 14311 |
| | | | |
| | **වියදම් එකතුව** | | **43814** |
| | අපේක්ෂිත ශුද්ධ අතිරික්තය | | 28760 |

ඇමුණුම් අංක - 17

**එරත්න ග්‍රාමීය බැංකුව**

**ඉලක්කගත තැන්පත් හා ශුද්ධ අතිරික්තය**

| | විස්තරය | 2025.07.31 නිත්‍ය රු දහස් | 2026.12.31 ඉලක්ක රු දහස් |
|---|---|---|---|
| | **තැන්පත්** | | |
| 1 | සාමාජිකඉතිරි කිරීමේ තැන්පත් | 103177 | 117027 |
| 2 | සාමාජික නොවන තැන්පත් | 19085 | 21647 |
| 3 | ළමා තැන්පත් | 14829 | 16820 |
| 4 | ස්ථාවර තැන්පත් | 69577 | 78916 |
| | තැන්පත් එකතුව | **206668** | **234410** |
| | **අයෝජන** | | |
| 1 | සාමාජික ණය | 69104 | 117205 |
| 2 | උකස් අත්තිකාරම් | 21156 | 24863 |
| 3 | ආයෝජන | | 46882 |
| | අයෝජන එකතුව | **90260** | **188950** |
| | ආයෝජන ආදායම් | | |
| 1 | සාමාජික ණය පොලී | | 19067 |
| 2 | උකස් පොලී | | 5899 |
| 3 | ආයෝජන පොලී | | 17741 |
| 4 | වෙනත් ආදායම් | | 120 |
| | ආදායම් එකතුව | | **42827** |
| | වියදම් | | |
| 1 | තැන්පත් පොලී වියදම් | | 11242 |
| 2 | වෙන්කිරීම් | | 2926 |
| 3 | පරිපාලන වියදම් | | 2631 |
| 4 | වෙනත් වියදම් | | 5761 |
| | | | |
| | වියදම් එකතුව | | **22560** |
| | **අපේක්ෂිත ශුද්ධ අතිරික්තය** | | **20267** |

| ඇමුණුම් අංක - 18 |
|---|

## තෙප්පනාව ග්‍රාමීය බැංකුව
## ඉලක්කගත තැන්පත් හා ශුද්ධ අතිරික්තය

| | විස්තරය | 2025.07.31 නිත්‍ය රු දහස් | 2026.12.31 ඉලක්ක රු දහස් |
|---|---|---|---|
| | තැන්පත් | | |
| 1 | සාමාජිකඉතිරි කිරීමේ තැන්පත් | 156343 | 179357 |
| 2 | සාමාජික නොවන තැන්පත් | 66956 | 76812 |
| 3 | ළමා තැන්පත් | 23512 | 26973 |
| 4 | ස්ථාවර තැන්පත් | 160764 | 184428 |
| | **තැන්පත් එකතුව** | **407575** | **467570** |
| | අයෝජන | | |
| 1 | සාමාජික ණය | 87861 | 233780 |
| 2 | උකස් අත්තිකාරම් | 40563 | 53244 |
| 3 | ආයෝජන | | 93520 |
| | **අයෝජන එකතුව** | **128424** | **380544** |
| | ආයෝජන ආදායම් | | |
| 1 | සාමාජික ණය පොලි | | 37902 |
| 2 | උකස් පොලි | | 11731 |
| 3 | ආයෝජන පොලි | | 40452 |
| 4 | වෙනත් ආදායම් | | 120 |
| | **ආදායම් එකතුව** | | **90205** |
| | වියදම් | | |
| 1 | තැන්පත් පොලි වියදම් | | 22244 |
| 2 | වෙන්කිරීම් | | 5941 |
| 3 | පරිපාලන වියදම් | | 7772 |
| 4 | වෙනත් වියදම් | | 8067 |
| | | | |
| | **වියදම් එකතුව** | | **44024** |
| | **අපේක්ෂිත ශුද්ධ අතිරික්තය** | | **46181** |

ඇමුණුම් අංක - 19

## පණුකැරැපිටිය ග්‍රාමීය බැංකුව
## ඉලක්කගත තැන්පත් හා ශුද්ධ අතිරික්තය

| | විස්තරය | 2025.07.31<br>නිත්‍ය රු දහස් | 2026.12.31<br>ඉලක්ක රු දහස් |
|---|---|---|---|
| | තැන්පත් | | |
| 1 | සාමාජිකඉතිරි කිරිමේ තැන්පත් | 64795 | 75543 |
| 2 | සාමාජික නොවන තැන්පත් | 14279 | 16648 |
| 3 | ළමා තැන්පත් | 10628 | 12391 |
| 4 | ස්ථාවර තැන්පත් | 27737 | 32338 |
| | **තැන්පත් එකතුව** | **117439** | **136920** |
| | අයෝජන | | |
| 1 | සාමාජික ණය | 61414 | 68460 |
| 2 | උකස් අත්තිකාරම් | 24188 | 41076 |
| 3 | ආයෝජන | | 27384 |
| | **අයෝජන එකතුව** | **85602** | **136920** |
| | ආයෝජන ආදායම් | | |
| 1 | සාමාජික ණය පොලි | | 11048 |
| 2 | උකස් පොලි | | 3418 |
| 3 | ආයෝජන පොලි | | 5856 |
| 4 | වෙනත් ආදායම් | | 696 |
| | **ආදායම් එකතුව** | | **21018** |
| | වියදම් | | |
| 1 | තැන්පත් පොලි වියදම් | | 5046 |
| 2 | වෙන්කිරිම් | | 1655 |
| 3 | පරිපාලන වියදම් | | 1012 |
| 4 | වෙනත් වියදම් | | 5505 |
| | | | |
| | **වියදම් එකතුව** | | **13218** |
| | **අපේක්ෂිත ශුද්ධ අතිරික්තය** | | **7800** |

ඇමුණුම් අංක - 20

## කරපිංච වත්ත ග්‍රාමීය බැංකුව
## ඉලක්කගත තැන්පත් හා ශුද්ධ අතිරික්තය

| | විස්තරය | 2025.07.31 නිත්‍ය රු දහස් | 2026.12.31 ඉලක්ක රු දහස් |
|---|---|---|---|
| | තැන්පත් | | |
| 1 | සාමාජිකඉතිරි කිරීමේ තැන්පත් | 55475 | 66082 |
| 2 | සාමාජික නොවන තැන්පත් | 13167 | 15684 |
| 3 | ළමා තැන්පත් | 15867 | 18901 |
| 4 | ස්ථාවර තැන්පත් | 67935 | 80924 |
| | **තැන්පත් එකතුව** | **152444** | **181591** |
| | අයෝජන | | |
| 1 | සාමාජික ණය | 43399 | 90800 |
| 2 | උකස් අත්තිකාරම් | 43605 | 54480 |
| 3 | ආයෝජන | | 36311 |
| | **ආයෝජන එකතුව** | **87004** | **181591** |
| | ආයෝජන ආදායම් | | |
| 1 | සාමාජික ණය පොලි | | 14710 |
| 2 | උකස් පොලි | | 4491 |
| 3 | ආයෝජන පොලි | | 12362 |
| 4 | වෙනත් ආදායම් | | 300 |
| | **ආදායම් එකතුව** | | **31863** |
| | වියදම් | | |
| 1 | තැන්පත් පොලි වියදම් | | 9930 |
| 2 | වෙන්කිරීම් | | 3702 |
| 3 | පරිපාලන වියදම් | | 1383 |
| 4 | වෙනත් වියදම් | | 6193 |
| | | | |
| | **වියදම් එකතුව** | | **21208** |
| | **අපේක්ෂිත ශුද්ධ අතිරික්තය** | | **10655** |

ඇමුණුම් අංක - 21

## පැරඩයිස්වත්ත ග්‍රාමීය බැංකුව
## ඉලක්කගත තැන්පත් හා ශුද්ධ අතිරික්තය

| | විස්තරය | 2025.07.31 නිත්‍ය රු. දහස් | 2026.12.31 ඉලක්ක රු. දහස් |
